# ශ්‍රී ලංකා සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් 2025



අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ජාතික අධ්‍යාපන ආයතනය
විභාග දෙපාර්තමේන්තුව
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

විසින් ඒකාබද්ධව සකස් කරන ලදී.

# පෙරවදන

ශ්‍රී ලංකා රජය අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් ලෙසත්, ජාතික සංවර්ධනයේ අඩිතාලම ලෙසත් හඳුනා ගනී. චිත්තවේගීය වශයෙන් බුද්ධිමත්, සමාජීය වශයෙන් වගකීම් සහගත, සමාජීය හා සංස්කෘතික වශයෙන් දැනුවත්, දේශපාලනික වශයෙන් සාක්ෂරතාවයෙන් යුත්, විවේචනාත්මක චින්තනයට හැකියාව ඇති පුරවැසියෙකු බිහි කිරීම සමතුලිත, ඵලදායී, සමාජයීය වශයෙන් අන්තර්කරණය වූ, අනාගතය ඉලක්ක කරගත් සහ ජාතික ප්‍රමුඛතා මෙන්ම ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට ප්‍රතිචාර දක්වන ශක්තිමත් අධ්‍යාපන පද්ධතියක් මත රඳා පවතී. එමනිසා, සාමය, සමාජ සමගිය, යහපාලනය, ආර්ථික සමෘද්ධිය සහ රටේ තිරසාර සංවර්ධනය සහතික කළ හැක්කේ ඉතා දියුණු අධ්‍යාපන පද්ධතියකින් පමණි.

මෙම සන්දර්භය තුළ, රජය විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් ආරම්භ කර ඇති අතර, එහි පළමු අදියර 2026 සිට 1 ශ්‍රේණිය සහ 6 ශ්‍රේණිය සඳහා සංශෝධිත විෂයමාලා හරහා ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම ප්‍රතිසංස්කරණ සැලසුම් කර ඇත්තේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සාධාරණත්වය සහ අදාළත්වය ශක්තිමත් කිරීම සඳහා වන අතර, වේගයෙන් වෙනස් වන ලෝකයක සාර්ථක වීමට අවශ්‍ය දැනුම, කුසලතා සහ වටිනාකම් වලින් ඉගෙන ගන්නන් සන්නද්ධ කිරීම පමණක් නොව, සදාචාරාත්මක, සමාජයීය වශයෙන් ඇතුළත්, සාධාරණ, බහුත්වවාදී, තිරසාර සහ වගකීම් සහගත සමාජයක් නිර්මාණය කිරීම සඳහා දූරදර්ශී නායකත්වයක් ලබා දීම ද අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රතිපත්ති රාමුව යෝජිත පරිවර්තනය සඳහා පදනම සපයයි. එය ප්‍රතිසංස්කරණයේ ප්‍රධාන මානයන් එකට එක් කරන උපායමාර්ගික කුළුණු පහක් වටා ගොඩනගා ඇත:

1. **විෂය නිර්දේශ සංවර්ධනය –** නැගී එන දැනුම, අනාගත කුසලතා සහ සමාජ ප්‍රමුඛතා සමඟ සංවර්ධනය හා පෙළගැස්වීම.
2. **මානව සම්පත් සංවර්ධනය –** අධ්‍යාපනඥයින්ගේ සහ පරිපාලකයින්ගේ වෘත්තීය වර්ධනය සහ ධාරිතා ගොඩනැගීම.
3. **යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ –** කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුත් සහ වගවීමකින් යුත් නවීන යටිතල පහසුකම් සහ පාලන පද්ධති සඳහා ආයෝජනය කිරීම.
4. **තක්සේරුව සහ ඇගයීම –** සාධාරණත්වය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහතික කරන නිපුණතා මත පදනම් වූ සහ විනිවිදභාවයෙන් යුත් තක්සේරු යාන්ත්‍රණ.
5. **මහජන දැනුවත්භාවය සහ ප්‍රවර්ධනය –** පාර්ශ්වකරුවන්ගේ නියැලීම, සන්නිවේදනය සහ ප්‍රතිසංස්කරණවල සාමූහික හිමිකාරිත්වය ශක්තිමත් කිරීම.

මෙම අධ්‍යාපන ප්‍රතිපත්ති ලේඛනය එක් එක් කුළුණ යටතේ අනුගමනය කළ යුතු උපායමාර්ගික ක්‍රියාමාර්ග සහ මැදිහත්වීම් ගෙනහැර දක්වන අතර, අධ්‍යාපන පද්ධතිය පුරා සම්බන්ධීකරණ ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සිතියමක් ලෙස සේවය කරයි. ප්‍රධාන පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකු, රජයේ බලධාරීන්, අධ්‍යාපනඥයින්, දෙමාපියන්, සිවිල් සමාජය සහ මහජන නියෝජිතයින් මෙම ලේඛනය සංවර්ධනය කිරීම සඳහා එක්ව කටයුතු කර ඇත.

මෙම යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින්, ජාතික ජන බලවේගය (NPP) රජය උසස්ම තත්ත්වයේ නොමිලේ සහ සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමට ඇති ස්ථිර කැපවීම යළි තහවුරු කරයි. යෝජිත ප්‍රතිසංස්කරණ මගින් ජාතික අධ්‍යාපන ප්‍රමිතීන් ශක්තිමත් කිරීම පමණක් නොව, අනාගත ශ්‍රී ලාංකික පරම්පරාවට සාමයෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට සහ මනා ලෙස ක්‍රියාත්මක වන සහ සාධාරණ ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ සදාචාරාත්මක හා ආචාරධාර්මික සමාජයක් සාමූහිකව ගොඩනැගීමට සූදානම් කිරීම ද අරමුණු කරයි.

# පටුන


වගු ලැයිස්තුව.......... i

**1වන පරිච්ඡේදය: හැඳින්වීම .......... 3**

1.1 පසුබිම .......... 3

1.2 යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ දැක්ම, ඉලක්ක සහ අරමුණු .......... 3

1.2.1 දැක්ම .......... 3

1.2.2 ජාතික අධ්‍යාපන ඉලක්ක .......... 3

1.2.3 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු .......... 5

1.3 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවබෝධකර ගැනීම .......... 6

1.3.1 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා විෂයමාලා සංශෝධනය .......... 6

1.3.2 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඓතිහාසික සන්ධිස්ථාන .......... 7

1.3.3 ඵලදායී අධ්‍යාපන පරිවර්තනයක් සඳහා වන මූලධර්ම .......... 7

1.4 යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වන තාර්කිකය .......... 8

1.5 යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ ප්‍රධාන අංග .......... 10

**2වන පරිච්ඡේදය: යෝජිත ප්‍රතිසංස්කරණ .......... 11**

2.1 විෂයමාලා සංවර්ධනය .......... 11

2.1.1 විෂයමාලා සංශෝධනයේ අරමුණු .......... 11

2.1.2 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යාප්තිය / අධ්‍යාපන කාලසීමාව .......... 11

2.1.3 පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර .......... 11

2.1.4 පාරිභාෂික පද අර්ථ දැක්වීම් .......... 15

2.1.5 යෝජිත විෂයමාලා පරිවර්තනයේ කැපී පෙනෙන ලක්ෂණ .......... 16

2.1.6 අධ්‍යාපනයේ අවධීන් .......... 19

2.1.7 මුල් ළමාවිය අධ්‍යාපනය .......... 19

2.1.8 ප්‍රාථමික අධ්‍යාපනය (1 – 5 ශ්‍රේණිය) .......... 19

2.1.9 කණිෂ්ඨ ද්විතීයික අවධිය (6-9 ශ්‍රේණි) .......... 21

2.1.10 ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය (10 සිට 13 ශ්‍රේණි) .......... 23

2.2 මානව සම්පත් කළමනාකරණය .......... 30

2.3 යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ .......... 31

2.3.1 යටිතල පහසුකම් සංවර්ධනය .......... 31

2.3.2 අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ .......... 32

2.4 තක්සේරුකරණය හා ඇගයීම .......... 32

2.4.1 පොදු සංකල්ප .......... 32

2.4.2 ජාතික මට්ටමේ තක්සේරුකරණය .......... 33

2.4.3 පාසල් පාදක ඇගයීම් .......... 33

2.4.4 සහතිකකරණ ක්‍රමවේදය .......... 34

2.5 මහජන දැනුවත්කිරීම හා ප්‍රවර්ධනය .......... 35

**3 වන පරිච්ඡේදය : නියාමනය, ඇගයීම සහ සමාලෝචනය .......... 36**

**ඇමුණුම 1: ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රගතියේ මංපෙත් .......... 37**

**ඇමුණුම 2: සාමාන්‍ය අධ්‍යාපනය සඳහා විෂයමාලා රාමුව .......... 38**

**ඇමුණුම 3: දායකත්ව ලැයිස්තුව .......... 40**

**2වගු ලැයිස්තුව**

1.1 වගුව ජාතික අධ්‍යාපන අරමුණු - 4

1.2 වගුව ජාතික අධ්‍යාපන අරමුණු හා සමගාමීව යෝජිත කුසලතා ක්ෂේත්‍ර - 5

2.1 වගුව සාමාන්‍ය අධ්‍යාපන අවධීන් - 19

2.2 වගුව ප්‍රාථමික අධ්‍යාපන අවධියේ (1-5 ශ්‍රේණි) ඉගෙනුම් ක්ෂේත්‍ර සඳහා කාලය වෙන් කිරීම (යෝජිත) - 20

2.3 වගුව කනිෂ්ඨ ද්විතීයික අවධියේ (6-9 ශ්‍රේණි) විෂයය සහ මොඩියුල - 21

2.4 වගුව ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - පළමු අදියර (10-11 ශ්‍රේණි) සඳහා වන මූලික විෂය මාලාව - 24

2.5 වගුව ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - පළමු අදියර (10-11 ශ්‍රේණි) සඳහා වැඩිදුර ඉගෙනුම් මොඩියුල සඳහා වන විෂයය - 25

2.6 වගුව ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - පළමු අදියර (10-11 ශ්‍රේණි) සඳහා පරිවර්තනීය කුසලතා මොඩියුල - 26

2.7 වගුව ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - පළමු අදියර (10-11 ශ්‍රේණි) හි වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරාගැනීම සඳහා වන කොන්දේසි - 27

2.8 වගුව ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - පළමු අදියර (10-11 ශ්‍රේණි) සඳහා විෂය ධාරාව අනුව වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරාගැනීමේ පදනම - 28

2.9 වගුව ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - දෙවන අදියර (12 සහ 13 ශ්‍රේණි) සඳහා යෝජිත විෂයය - 28

2.10 වගුව ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය - 33

# 1වන පරිච්ඡේදය: හැඳින්වීම

## 1.1 පසුබිම

ශතවර්ෂ ගණනාවක් තිස්සේ අධ්‍යාපනය සඳහා ඇඩි කැපවීමක් පෙන්නුම් කළ රටක් වන ශ්‍රී ලංකාව, අධ්‍යාපනයේ පරිවර්තනය සඳහා ප්‍රවේශම් සහගතව සකස් කරන ලද ක්‍රියාවලියක් හරහා සිය අනාගතය සැලසුම් කිරීමට සූදානම්ව සිටින බැවින්, අප රට සිය ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයක සිටියි. එවැනි පරිවර්තනීය මුලපිරීමක් සිදු කර ඇත්තේ සාමාන්‍ය අධ්‍යාපනය සමාජ අසමානතාවය අඩු කිරීමෙන් සහ වඩාත්ම ආන්තික හා අඩු වරප්‍රසාද ලත් සමාජ කණ්ඩායම් සඳහා පවා ඉහළ සමාජ සංචලතාවයක් ඇති කිරීමෙන් ධනාත්මක සමාජ වෙනසක් සඳහා සෘජුවම දායක වී ඇති බව හඳුනා ගැනීමෙනි. පශ්චාත් යුධ, පශ්චාත් වසංගත සහ පශ්චාත් අරගල සමයේදී ශ්‍රී ලංකාවේ අනාගතය දෘශ්‍යමාන කිරීමේදී, රටේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය පරිවර්තනය කිරීම සඳහා පුළුල්, ක්‍රමානුකූල සහ අනාගතවාදී ප්‍රවේශයක් අවශ්‍ය වේ. මෙම අවශ්‍යතාව හඳුනා ගනිමින්, ජාතික ජන බලවේගය රජය ධනාත්මක ගුණාංග සහිත පුරවැසියන්ගේ නව පරම්පරාවක් නිර්මාණය කිරීම පමණක් නොව, ගුණාත්මක අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ පවතින විෂමතා ඉවත් කිරීම ද අරමුණු කරගත් අධ්‍යාපන පද්ධතියක් හඳුන්වා දෙනු ලබයි. යෝජිත ප්‍රතිසංස්කරණ මගින් වාර්ගිකත්වය, ආගම, ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිතභාවය සහ වෙනත් වෙනස්කම් අනුව ඔවුන් වටා ඇති විවිධත්වය ගරු කරන සහ අගය කරන විචාරාත්මක විඥානයක් ඇති පුරවැසියන් බිහි කරනු ඇත. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන සම්ප්‍රදාය මත ගොඩනැගෙන යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අධ්‍යාපනය තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී කරයි, එවිට අප සමාජයේ විවිධ මායිම් තුළ සිටින අය හට ඒ තුළට වඩාත් ප්‍රවේශ විය හැකි වේ. එවැනි අධ්‍යාපන ක්‍රමයක් (අවාසි සහගත පසුබිම්වලින් පැමිණෙන අය ඇතුළුව සියලු ම පුරවැසියන් ගේ), ආර්ථික හා සමාජ සංචලතාවයට ඉඩ සලසනු ඇත.

යෝජිත ප්‍රතිසංස්කරණවල කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ වෘත්තීය අධ්‍යාපනය සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ප්‍රධාන ධාරාවට ගැනීමයි. එවැනි පියවරක්, වෘත්තීය අධ්‍යාපනය තෘතියික අධ්‍යාපනයේ ශක්‍ය හා ගෞරවනීය මාවතක් ලෙසත්, සමාජ හා ආර්ථික ප්‍රගතියට මඟ පෙන්වන වෘත්තීය මාර්ගයක් ලෙසත් නිසි පිළිගැනීමක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 1.2 යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ දැක්ම, ඉලක්ක සහ අරමුණු

### 1.2.1 *දැක්ම*

ශ්‍රී ලංකාව සඳහා යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ දැක්ම සහ අරමුණු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා (2022) සහ එහි පූර්වගාමීන් මෙන්ම ජාතික ජන බලවේග රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ද මුල් බැසගෙන ඇත.

**යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ දැක්ම**

**සමානාත්මතාවය, අන්තර්කරණය, සාමය, සමෘද්ධිය, යුක්තිය, තිරසාරත්වය සහ ගෝලීය පුරවැසිභාවය උදෙසා වෙර දරන, සදාචාරාත්මක, සමාජ වගකීම් සහිත, නව්‍යකරණයට නැඹුරු වූ සහ යාවජීව ඉගෙනුම පෝෂණය කිරීම සඳහා අධ්‍යාපනය පරිවර්තනය කිරීම.**

මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ (NEC) වාර්තාව මගින් ජාතික අධ්‍යාපන අරමුණු හඳුනාගෙන ඇත.

### 1.2.2 *ජාතික අධ්‍යාපන ඉලක්ක*

1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (NEC), රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මෙහෙයවීම සඳහා 1992 වසරේ දී ජාතික අධ්‍යාපන අරමුණු (NEGs) ස්ථාපිත කරන ලදී. 2022 වසරේ දී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) මගින්, ජාතික අධ්‍යාපන අරමුණු අටක් (1.1 වගුව) ඉදිරිපත් කරන ලදී.

වගු අංක **1.1** ජාතික අධ්‍යාපනික ඉලක්ක

| *ජාතික අධ්‍යාපනික ඉලක්ක අංකය* | **ජාතික අධ්‍යාපනික ඉලක්ක** | **සංක්ෂිප්ත ස්වරූපය** |
|---|---|---|
| ජා.අ.ඉ. 1 | මිනිස් අගයන්ට ගරු කිරීම මත පදනම්ව, පුද්ගලයන්ගේ නිරෝගී සහ ප්‍රීතිමත් ජීවන රටාවක් සඳහා අවශ්‍ය ශාරීරික, මානසික, අධ්‍යාත්මික, සමාජ-චිත්තවේගීය සහ පාරිසරික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම. | ප්‍රීතිමත් හා නිරෝගී මනුෂ්‍යයෙක් |
| ජා.අ.ඉ. 2 | ජාතික අවශ්‍යතා සහ ගෝලීය ප්‍රවණතා සමඟ සමපාතව, තාක්ෂණික, සමාජ-ආර්ථික සහ සංස්කෘතික දියුණුව සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම. | ඵලදායී හා මානුෂීය පුද්ගලයෙක් |
| ජා.අ.ඉ. 3 | කුතුහලය, විවේචනාත්මක චින්තනය, ගැටළු විසඳීමේ කුසලතා, නිර්මාණශීලීත්වය සහ නවෝත්පාදන හැකියාව සහිත ඵලදායී පුද්ගලයන් බිහි කිරීම. | ප්‍රගතිශීලී ඉගෙනුම ලබන්නෙක් |
| ජා.අ.ඉ. 4 | සමාජ සාධාරණත්වය සහ ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවක සම්මතයන්ට අනුකූලව යුතුකම් සහ වගකීම් ඉටු කරමින්, මානව අයිතිවාසිකම් සහ රටේ නීති කෙරෙහි ගෞරවය ප්‍රවර්ධනය කිරීම. | ගෞරවනීය හා විශ්වාසවන්ත පුද්ගලයෙක් |
| ජා.අ.ඉ. 5 | වෙනස්කම් කළමනාකරණය කිරීමට සහ සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීමට පුද්ගලයන් දියුණු කිරීම. | නම්‍යශීලී පුද්ගලයෙක් |
| ජා.අ.ඉ. 6 | දේශීය හා ගෝලීය අභියෝගවලට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමය ආරක්ෂා කිරීම. | සංස්කෘතික මූලයන් සහිත තානාපතිවරයෙක් |
| ජා.අ.ඉ. 7 | ඉගෙනීමට ඉගෙනීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සිහිබුද්ධියෙන් හා ස්වයං-විඥානවත් ඉගෙනුම ලබන්නෙකු ප්‍රවර්ධනය කිරීම. | ප්‍රත්‍යාවර්තී ඉගෙනුම ලබන්නෙක් |
| ජා.අ.ඉ. 8 | සංස්කෘතික විවිධත්වයට ගරු කරමින් ජාතික සංහිඳියාව, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය පෝෂණය කරන දේශප්‍රේමී ශ්‍රී ලාංකික පුරවැසියෙකු බිහි කිරීම. | දේශප්‍රේමී පුරවැසියෙක් |

පාසල් අධ්‍යාපනය තුළින් සිසුන්ට ලබා දෙන අධ්‍යාපනික අත්දැකීම් මගින් ස්වාධීන, ප්‍රීතිමත්, චිත්තවේගීයව සමබර පුරවැසියන් පමණක් නොව, රටේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ඉටු කිරීමට ද හැකියාව ඇති පුරවැසියන් බිහි කළ යුතුය. රටේ අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා, එම පද්ධතියෙන් බිහි කිරීමට අපේක්ෂා කරන පුරවැසියන් විස්තර කිරීම අත්‍යවශ්‍ය වේ. සාමාන්‍ය අධ්‍යාපනය හරහා ලබා දෙන මූලික කුසලතා හඳුනා ගැනීම මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට එක් ක්‍රමයකි.

සංජානන කුසලතා හෝ බුද්ධිමය හැකියාවන් (විශ්ලේෂණාත්මක හෝ විවේචනාත්මක චින්තන කුසලතා, තීරණ ගැනීමේ කුසලතා සහ පොදු ගැටලු විසඳීමේ කුසලතා වැනි) සහ දැනුම් පද්ධතිය එක්ව කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සඳහා බලමුලු ගැන්විය යුතු වැදගත් බුද්ධිමය සම්පත් සකස් කරන බව පුළුල් ලෙස පිළිගෙන ඇත. තවදුරටත්, ඉල්ලුමක් සපුරාලීම හෝ ඉලක්කයක් සපුරා ගැනීම සඳහා අභිප්‍රේරණය, චිත්තවේගීය නියාමනය, ඔරොත්තු දීමේ හැකියාව යනාදී සමාජ, චර්යාත්මක සහ චිත්තවේගීය අංශ මෙන්ම වටිනාකම් සහ ආචාර ධර්ම කෙරෙහි කැපවීම ද අවශ්‍ය වන බව විශේෂඥයෝ පුළුල් ලෙස පිළිගනිති. එබැවින්, විෂය මාලාව දැනුම, කුසලතා සහ නැඹුරුතාවන් වර්ධනය කරන අතරම සාරධර්ම කාවැද්දීමට සහ චිත්තවේගීය බුද්ධිය වර්ධනය කිරීමට හැකි විය යුතුය. ඉහත කරුණු සලකා බලමින්, මෙම පරිවර්තනය හරහා, ශ්‍රී ලංකාව පහත සඳහන් කුසලතා ක්ෂේත්‍රයන්ගෙන් සවිබල ගැන්වූ ඉගෙනුම්ලාභීන් පරම්පරාවක් බිහිවෙතැයි අපේක්ෂා කරන බවට යෝජනා කෙරේ (1.2 වගුව).

*1.2* වගුව ජාතික අධ්‍යාපන අරමුණුවලට අනුකූලව යෝජිත කුසලතා ක්ෂේත්‍ර

| | |
|---|---|
| **පදනම් සාක්ෂරතා:** සාක්ෂරතාව, සංඛ්‍යා සාක්ෂරතාව, විද්‍යාත්මක සාක්ෂරතාව, අධ්‍යයන සාක්ෂරතාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව, මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව, සංස්කෘතික හා සෞන්දර්යාත්මක සාක්ෂරතාව, මූල්‍ය හා ව්‍යවසායකත්ව සාක්ෂරතාව. | **ඩිජිටල් හා අනාගත කුසලතා:** ඩිජිටල් ප්‍රවීණතාව, කේතකරණය (coding), කෘත්‍රිම බුද්ධිය පිළිබඳ දැනුවත්භාවය, දත්ත සාක්ෂරතාව සහ මාර්ගගත ආරක්ෂාව. |
| **21 වන සියවසේ කුසලතා:** විවේචනාත්මක චින්තනය, නිර්මාණශීලිත්වය, සහයෝගීතාව, සන්නිවේදනය, ගැටළු විසඳීම. | **හරිත හා තිරසාරත්ව කුසලතා:** දේශගුණික සාක්ෂරතාව, සම්පත් කාර්යක්ෂමතාව, තිරසාර පරිභෝජනය සහ චක්‍රීය ආර්ථික භාවිතයන්. |
| **ප්‍රජා හා ගෝලීය නිපුණතා:** ගෝලීය පුරවැසිභාවය, සංස්කෘතික දැනුවත්භාවය, සමාජ වගකීම, සදාචාරාත්මක තර්කනය, සාමූහික වගකීම. | **ව්‍යවසායකත්ව හා රැකියාවට සූදානම් කුසලතා:** මුලපිරීම, නවෝත්පාදනය, අනුවර්තනය වීමේ හැකියාව, ඵලදායිතාව. |
| **පුද්ගලික හා අන්තර් පුද්ගල කුසලතා:** අනුවර්තනය වීමේ හැකියාව, ඔරොත්තු දීමේ හැකියාව, ස්වයං දැනුවත්භාවය, නායකත්වය, සංවේදනය, සමාජ-චිත්තවේගීය ඉගෙනීම. | **21 වන සියවසෙන් ඔබ්බට වූ කුසලතා:** පද්ධති චින්තනය, අනාගත චින්තනය, ජීවිත කාලය පුරා ඉගෙනීම, පරාවර්තක චින්තනය (metacognition), ප්‍රඥාව හා විචාර බුද්ධිය. |

ශ්‍රී ලංකාව සඳහා යෝජිත සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ අවසාන ඉලක්කය පහත සඳහන් දෑ නිර්මාණය කිරීම ලෙස හඳුනාගත හැකිය:

- නිරෝගී, සදාචාරාත්මක සහ සමාජ වගකීම් සහිත සමාජ සාමාජිකයෙක්,
- චිත්තවේගීය සමබරතාවය සහ ස්වයං දැනුවත්භාවය ඇති සමාජ සාමාජිකයෙක්,
- 21 වන සියවසේ සහ එයින් ඔබ්බට ඇති අභියෝගවලට මුහුණ දෙන අතරම, රට තුළ සහ ඉන් පිටත උරුමය, සංස්කෘතිය සහ විවිධත්වය ගරු කරන සමාජයක්,
- තිරසාර ජාතික සංවර්ධනයක්, සහ
- ප්‍රජාතන්ත්‍රවාදී සහ බහුසංස්කෘතික වටිනාකම් මත ගොඩනැගුණු සමගි සමාජයක් තුළ තිරසාර සාමයක්.

## 1.2.3 *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණු*

යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අපේක්ෂා කරන්නේ:

- සදාචාරාත්මක, සමාජයීය වශයෙන් ඇතුළත් සහ සමාජ වගකීම් සහිත පුරවැසියන් පෝෂණය කිරීම.
- සමාජ, ආර්ථික, ප්‍රාදේශීය හෝ සංස්කෘතික පසුබිම නොසලකා සෑම දරුවෙකුටම අධ්‍යාපන සම්පත් හා අවස්ථා සඳහා සාධාරණ හා සමාන ප්‍රවේශයක් ලැබෙන පද්ධතියක් නිර්මාණය කිරීම.
- සමාජයීය වශයෙන් ඇතුළත් වන සහ ආබාධ සහිත සිසුන් සඳහා සාධාරණ හා සමාන ප්‍රවේශයක් හා අවස්ථා සපයන අධ්‍යාපන පද්ධතියක් පෝෂණය කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනය ජාතික සංවර්ධන ප්‍රමුඛතා, තිරසාර සංවර්ධන ඉලක්ක සහ ගෝලීය පුරවැසිභාවය සඳහා අවශ්‍ය ගුණාංග සමඟ පෙළගැස්වීම.
- නව දැනුම, නව තාක්ෂණයන් සහ ගෝලීය හොඳම භාවිතයන් ඒකාබද්ධ කරමින්, විවේචනාත්මක චින්තන කුසලතා සහ නිර්මාණශීලිත්වය ඇතුළත් කරමින් විෂයමාලාව සංශෝධනය කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් සංස්කෘතියේ කොටසක් ලෙස ශිෂ්‍ය කේන්ද්‍රීය සහයෝගී ඉගෙනීම සහ සංවාදය ප්‍රවර්ධනය කිරීම.
- විභාග කේන්ද්‍රීය කටපාඩම් කිරීමෙන් ඔබ්බට ගිය සාධාරණ, විනිවිදභාවයෙන් යුත්, නිපුණතා මත පදනම් වූ, ඉගෙනුම්කරු කේන්ද්‍රීය තක්සේරු ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- විනිවිදභාවයෙන් යුත්, වගවීමකින් යුත් සහ කාර්යක්ෂම පාලනයක් මගින් සහාය වන, සමාජයීය වශයෙන් ඇතුළත්, සන්දර්භයට සුදුසු සහ හොඳින් සම්පත් යෙදවූ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

- අධ්‍යාපනඥයින්ගේ සහ පරිපාලකයින්ගේ වෘත්තීය ධාරිතාව ශක්තිමත් කිරීම සහ දේශීය අවශ්‍යතා හා ගෝලීය ප්‍රවණතාවලට ප්‍රතිචාර දක්වන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා ස්ථාපිත කිරීම.
- ගුරු අධ්‍යාපනඥයින්ට වෘත්තීය දියුණුව සඳහා අවස්ථා, සාධාරණ මූල්‍ය ප්‍රතිලාභ සහ ආරක්ෂිත හා පෝෂණය වන වැඩ පරිසරයක් සපයන වෘත්තීය සංස්කෘතියක් නිර්මාණය කිරීම.

## 1.3 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවබෝධකර ගැනීම

### 1.3.1 *අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා විෂයමාලා සංශෝධනය*

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යන සංකල්පය බොහෝ විට විෂයමාලා ප්‍රතිසංස්කරණ සංකල්පය සමඟ වැරදි ලෙස අර්ථකථනය කර ව්‍යාකූල වී ඇති අතර, එම පද දෙක එකිනෙකට ආදේශක ලෙස භාවිතා කිරීමට තුඩු දී ඇත. සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් යනු රටේ අධ්‍යාපන පද්ධතියේ සියලුම අංශ සහ අවධීන් සම්පූර්ණයෙන් ප්‍රතිසංවිධානය කිරීම ඇතුළත්, ප්‍රවේශමෙන් සංකල්පනය කරන ලද සහ සංකීර්ණ ක්‍රියාවලියකි. විෂයමාලා සංශෝධනය යනු ජාතික හා ගෝලීය වශයෙන් සිදුවන වේගවත් වෙනස්කම් පිළිබිඹු වන පරිදි සහ ඒවාට ප්‍රතිචාර දක්වන පරිදි විෂයමාලාවට සිදු කරනු ලබන ආවර්තිතා වෙනස්කම් වේ. විෂයමාලා ප්‍රතිසංස්කරණය සම්පූර්ණ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක ප්‍රධාන කොටසක් වන නමුත්, එම ක්‍රියාවලියට යටිතල පහසුකම් සංවර්ධනය, ගුරු පුහුණුව සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාකාරකම් සිදුවන භූමියේ යථාර්ථයන්ගෙන් දැනුවත් අර්ථවත් අධ්‍යාපනික භාවිතයන් හඳුන්වා දීම වැනි තවත් ප්‍රධාන කරුණු කිහිපයක් ඇතුළත් වේ.

යෝජිත විෂයමාලා ප්‍රතිසංස්කරණ ද දේශීය පාර්ශවකරුවන් විසින් පාසල් විෂයමාලා සහ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ රාමුව මූලික වෙනස්කම් හරහා යාවත්කාලීන කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් වලට ප්‍රතිචාර වේ.

යෝජිත පරිවර්තනය ජාතික ප්‍රමුඛතා සහ ගෝලීය ප්‍රවණතා සමඟ සමපාත වන පරිදි සමස්ත අධ්‍යාපන පද්ධතියම නැවත සිතා බලා ශක්තිමත් කිරීමට අපේක්ෂා කරයි. මෙම පරිවර්තනය තිරසාර හා සමාජයීය වශයෙන් ඇතුළත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා පදනම සාදන පහත සඳහන් **උපායමාර්ගික කුළුණු පහ** හරහා ඉදිරියට ගෙන යනු ඇත:

**කුළුණ 1: විෂයමාලා සංවර්ධනය**
නව දැනුම් ක්ෂේත්‍ර සහ කුසලතා, සහ සාමාජීය ප්‍රමුඛතා පිළිබිඹු වන පරිදි විෂයමාලා යාවත්කාලීන කරනු ඇත. එමගින් දේශීය හා ගෝලීය අවශ්‍යතා සඳහා අදාළත්වය, සමාජයීය වශයෙන් ඇතුළත් කිරීම සහ ප්‍රතිචාරාත්මකභාවය සහතික කෙරේ.

**කුළුණ 2: මානව සම්පත් සංවර්ධනය**
අධ්‍යාපනඥයින්, පරිපාලකයින් සහ සහායක නිලධාරීන්ගේ වෘත්තීය ධාරිතාව අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය හරහා වැඩි දියුණු කරනු ඇත.

**කුළුණ 3: යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ:**
අධ්‍යාපන පාලනය තුළ වගවීම, විනිවිදභාවය, සමාජයීය වශයෙන් ඇතුළත් කිරීම සහ නවෝත්පාදනය පෝෂණය කරන කාර්යක්ෂම පරිපාලන පද්ධති හඳුන්වා දීමත් සමඟ භෞතික, ඩිජිටල් සහ තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන යොමු කරනු ඇත.

**කුළුණ 4: ඇගයීම සහ තක්සේරුව**
ගුණාත්මකභාවය සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා ආයතනික අධීක්ෂණය සහ ඇගයීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයන් මගින් අනුපූරකව, ඇගයීම් පද්ධති සාධාරණත්වය, විනිවිදභාවය, සමානාත්මතාවය සහ නිපුණතා මත පදනම් වූ ප්‍රවේශයන් සහතික කරනු ඇත.

**කුළුණ 5: මහජන දැනුවත්භාවය සහ ප්‍රවර්ධනය**
සියලුම මට්ටම්වල පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීම, ප්‍රතිසංස්කරණ පිළිබඳ පුළුල් අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ හවුල් වගකීම සහ හිමිකාරිත්වය පෝෂණය කිරීම සඳහා උපායමාර්ගික සන්නිවේදන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.

මෙම ප්‍රතිපත්ති ලේඛනය, සවිස්තරාත්මක අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ව්‍යුහගත මාර්ගයක් සපයමින්, මෙම එක් එක් උපායමාර්ගික කුළුණු යටතේ යෝජිත ක්‍රියාමාර්ග සහ මැදිහත්වීම් විස්තර කරයි.

### 1.3.2 ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඓතිහාසික සන්ධිස්ථාන

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය තුළ, 1972, 1981 සහ 1999 යන වසරවල සාමාන්‍ය අධ්‍යාපනයට හඳුන්වා දුන් පරිවර්තනයන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා උදාහරණ වේ. 1999 න් පසු, විෂයමාලා සංශෝධන අවස්ථා දෙකක් සිදු විය: 2007 දී (1999 ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යමින්) සහ 2015 දී, අට අවුරුදු විෂයමාලා චක්‍ර ප්‍රතිපත්ති (NIE & MOE, 2000) අනුව.

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන අධ්‍යාපන පද්ධතියේ පරිණාමය 1997 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාව මත පදනම් වූ 1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දක්වා දිව යයි. 1999 දී පද්ධතියට හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණවල කැපී පෙනෙන කරුණු කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රාථමික අධ්‍යාපන අදියරට නිපුණතා පාදක අධ්‍යාපන ප්‍රවේශයක් හඳුන්වා දීම.
- ප්‍රාථමික අධ්‍යාපන අදියර ප්‍රධාන අදියර (K) තුනකට බෙදීම: 1 සහ 2 ශ්‍රේණි K1 ලෙසද, 3 සහ 4 ශ්‍රේණි K2 ලෙසද, 5 ශ්‍රේණිය K3 ලෙසද.
- 3 ශ්‍රේණියේ (K2) සිට ඉහළට විධිමත් දෙවන භාෂාවක් (ESL) ලෙස ඉංග්‍රීසි ඉගෙනීමට සිසුන් සූදානම් කිරීම සඳහා ප්‍රාථමික අදියරට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි හඳුන්වා දීම.
- අ.පො.ස. (සා.පෙළ) විභාගය වසර දෙකකට (10 සහ 11 ශ්‍රේණි) සීමා කිරීම.
- අ.පො.ස. (උ.පෙළ) සඳහා ඉදිරිපත් කරන විෂයයන් ගණන හතරේ සිට තුන දක්වා අඩු කිරීම.
- අ.පො.ස. (උ.පෙළ) සඳහා පොදු සාමාන්‍ය පරීක්ෂණය හඳුන්වා දීම.

පූර්වයෙන් සඳහන් කළ පරිදි, මෙලෙස ප්‍රතිසංස්කරණය කරන ලද අධ්‍යාපන පද්ධතිය, අධ්‍යාපන අමාත්‍යාංශයේ අට අවුරුදු විෂයමාලා සංශෝධන ප්‍රතිපත්තියට අනුකූලව 2007 දී තවදුරටත් වෙනස්කම් වලට භාජනය විය. 2007 දී ද්විතීයික අධ්‍යාපනයට නිපුණතා මත පදනම් වූ ප්‍රවේශය හඳුන්වා දෙන ලදී. 2015 දී පරිවර්තනයක් වෙනුවට විෂයමාලා විධිමත්කරණ ක්‍රියාවලියක් (curriculum rationalization process) සිදු කරන ලදී.

ඉහත මූලපිරීම් මත ගොඩනැගෙමින්, වත්මන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පහත සඳහන් මූලධර්ම මත පදනම් වූ අධ්‍යාපන පද්ධතියක් සැපයීමට අපේක්ෂා කරයි.

### 1.3.3 ඵලදායී අධ්‍යාපන පරිවර්තනයක් සඳහා වන මූලධර්ම

විෂයමාලා සංශෝධනයක් හෝ අධ්‍යාපන පද්ධතියක සම්පූර්ණ පරිවර්තනයක් ඉලක්ක කරගත් ඕනෑම මූලපිරීමකදී, සිසුන්, ගුරුවරුන්, අධ්‍යාපන පරිපාලකයින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂකයන්, රැකියා සපයන්නන් සහ පුළුල් පුරවැසිභාවය ඇතුළු විවිධ පාර්ශවකරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය ක්‍රියාවලිය මගින් සහතික කළ යුතුය. එවැනි ක්‍රියාවලියක් සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම මත පදනම් විය යුතුය. රටක අධ්‍යාපන පද්ධතියක සවිස්තරාත්මක පරිවර්තනයක් යනු ස්වභාවයෙන්ම සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර එයට සූක්ෂම සැලසුම්කරණයක් අවශ්‍ය වේ. එවැනි පරිවර්තන ක්‍රියාවලියක ප්‍රධාන කරුණු අතර:

1. පවතින පද්ධතියේ ශක්තීන් සහ දුර්වලතා
2. සමකාලීන දේශීය හා ගෝලීය සමාජ, භූ දේශපාලනික සහ ආර්ථික සන්දර්භයන්
3. රටේ ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය
4. සමෘද්ධිය, යහපැවැත්ම, සාධාරණත්වය සහ යහපාලනය සම්බන්ධයෙන් රටේ ජනතාවගේ අපේක්ෂාවන්.

පවතින පද්ධතියේ ශක්තීන් හා දුර්වලතා පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක්, ඒවායේ ප්‍රදර්ශනය කළ ඵලදායීතාවය මත පදනම්ව රඳවා ගත යුතු අංග සහ ප්‍රතිසංස්කරණය කළ යුතු හෝ නතර කළ යුතු අංග හඳුනා ගැනීම සඳහා ඉතා වැදගත් වේ. එවැනි විශ්ලේෂණයක් ශක්තිමත් හා මනා ක්‍රියාකාරී අධ්‍යාපන පද්ධතියක් නිර්මාණය කරන වඩාත් ඵලදායී ක්‍රමවේදයන් සංවර්ධනය කිරීමට ද මග පාදනු ඇත. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී පර්යේෂණ සොයාගැනීම් මෙන්ම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ අදහස් සහ, ඉතා වැදගත් ලෙස, සාමාන්‍ය මහජනතාවගේ අදහස් ද සැලකිල්ලට ගැනීම අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, කාලයත් සමග ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ කාර්ය සාධනය පිළිබඳ තක්සේරු කිරීම ද පවතින පද්ධතියේ ශක්තීන් හා දුර්වලතා පිළිබඳ වැදගත් තොරතුරු සපයනු ඇත.

ගෝලීය වශයෙන්, සාමාන්‍ය අධ්‍යාපනය වේගවත් සමාජ, ආර්ථික, තාක්ෂණික සහ සංස්කෘතික පරිවර්තනයන් පිළිබිඹු කරන බවට වග බලා ගැනීම සඳහා පරිවර්තනයකට භාජනය වෙමින් පවතී. එක්සත් ජාතීන්ගේ (UN) නියෝජිතායතන,

විශේෂයෙන් එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) සහ අනෙකුත් ගෝලීය සංවර්ධන හවුල්කරුවන්, පසුගිය වසර කිහිපය තුළ මෙම මාතෘකාව පිළිබඳව සක්‍රිය සාකච්ඡාවල නිරත වී ඇත. රටේ අධ්‍යාපන පද්ධතිය පරිවර්තනය කිරීමේදී, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සහ පරිවර්තනීයකුසලතා (transversal skills) සහ සමාජ-චිත්තවේගීය ඉගෙනීම (SEL) කාවැද්දීම වැනි ගෝලීය ප්‍රමුඛතා ද සලකා බැලීම වැදගත් වේ.

සැලකිල්ලට භාජනය විය යුතු, ඉස්මතුවෙමින් පවත්නා ගෝලීය ප්‍රවණතා ද ඇත. උදාහරණයක් ලෙස, ලෝකයේ බොහෝ ප්‍රදේශවල මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සඳහා අරමුදල් අඩු කිරීමට පියවර ගෙන ඇත. මෙම විෂයයන් ආර්ථික හා ප්‍රායෝගික වටිනාකමක් නොමැති ඒවා ලෙස සැලකේ. ලොව පුරා අධ්‍යාපන පද්ධති මත වෙළඳපල මත පදනම් වූ දෘෂ්ටිවාදයන්ගේ වැඩිවන ආධිපත්‍යය මෙම විෂයයන් බරපතල ලෙස නොසලකා හැරීමට හේතු වී තිබේ. දේශීයව, ජාතිකව සහ ගෝලීයව අප නිරීක්ෂණය කරන සමාජ-ආර්ථික බෙදීම් සහ අසමානතා තුරන් කිරීමට උපකාරී වන දැනුම නිර්මාණය කිරීම සඳහා, ශ්‍රී ලංකාව පාසල් මට්ටමේ සිට ආරම්භ කර මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සඳහා වැඩි වැඩියෙන් ආයෝජනය කළ යුතුය. විෂයමාලා ප්‍රතිසංස්කරණ මගින් මෙම විෂයයන් ශක්තිමත් කිරීම සඳහා විශේෂ මුලපිරීම් ඇතුළත් විය යුතුය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්තිය එහි ජාතික සංවර්ධන ප්‍රතිපත්තියෙන් වෙන් කළ නොහැක. අධ්‍යාපනය ශ්‍රී ලංකාවාසී ජාතියේ අනාගතය තීරණය කරන ප්‍රධාන සාධකයක් බැවින්, අධ්‍යාපනයේ පරිවර්තනය ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතා සමඟ පෙළගැස්වීම ප්‍රධාන කරුණකි. විෂයමාලා, පරිපාලන සහ අනෙකුත් ව්‍යුහයන්, අධ්‍යාපනික ක්‍රමවේද, තක්සේරුකරණය සහ ඇගයීම යනාදිය ඇතුළුව සමස්ත පරිවර්තනයම රටේ සංවර්ධන න්‍යාය පත්‍රය සමඟ පෙළගැසිය යුතුය.

සියල්ලටම වඩා, රටේ ජනතාවගේ අපේක්ෂාවන් එවැනි පරිවර්තන ක්‍රියාවලියකදී සලකා බැලීම අතිශයින් වැදගත් වන්නේ ඔවුන් ප්‍රතිසංස්කරණය කරන ලද අධ්‍යාපන පද්ධතියේ ප්‍රාථමික සහභාගිවන්නන් සහ ප්‍රතිලාභීන් වන බැවිනි. එබැවින්, අධ්‍යාපන පද්ධතිය පිළිබඳ මහජන මතය සහ යෝජිත වෙනස්කම් පිළිබඳ මහජන අපේක්ෂාවන් අධ්‍යාපනයේ පරිවර්තනය සැලසුම් කිරීමේදී සලකා බලනු ලැබ ඇත.

මෙම පසුබිම යටතේ, ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන පද්ධතිය පරීක්ෂා කර ඇති අතර, වත්මන් යෝජනා සඳහා පදනම සකස් කර ඇත.

## 1.4 යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වන තාර්කිකය

පවතින සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය, විශේෂයෙන් විෂය මාලා සහ ඇගයීම් ව්‍යුහයන්, වත්මන් දේශීය හා ගෝලීය සන්දර්භයන් සඳහා අවශ්‍ය කුසලතා සහ නිපුණතා ශ්‍රී ලංකාවේ සිසුන්ට ලබා දීමට නොහැකි බව පැහැදිලිය. පවතින පර්යේෂණ සහ විශේෂඥ මතයන් මගින් අවධාරණය කරන ලද අදාළ කරුණු කිහිපයක් පහත දක්වා ඇත.

**විෂයමාලාව:** විෂයමාලා අධික ලෙස විෂය කරුණුවලින් බර වූ, න්‍යායාත්මක සහ ඉලක්ක-නැඹුරු එකකි. එය කටපාඩම් කර ඉගෙනීම කෙරෙහි ද අවධානය යොමු කරන අතර විමර්ශනාත්මක ප්‍රවේශයක් නොමැත. තවද, එය සැබෑ ජීවිත සන්දර්භයන් තුළ ප්‍රායෝගික යෙදවීමේ හැකියාව අතින් දුර්වල ය, විශේෂයෙන් විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) විෂයයන්හි. මෙය වත්මන් සිසුන්ගේ කුසලතා සහ පුද්ගලයන් ලෙස මෙන්ම ප්‍රජාවක් ලෙස සමකාලීන සමාජ-ආර්ථික අභියෝගවලට මුහුණ දීමට සහ ඒවා ජය ගැනීමට අවශ්‍ය කුසලතා අතර නොගැලපීමකට මඟ පාදයි. තවද, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර විෂයයන් STEM ප්‍රවාහයට හඳුන්වා දීමට ඇති අවස්ථා ප්‍රමාණවත් නොවේ. සමාජ විඥානය, දේශපාලන සාක්ෂරතාව සහ සාකල්‍ය පෞරුෂයක් සහිත සිසුන් සංවර්ධනය කිරීම සඳහා එවැනි වෙනසක් අවශ්‍ය වේ.

**තක්සේරුකරණය:** ඉහළ අවදානම් සහිත විභාගයන්ගෙන් සමන්විත තක්සේරුකරණ පද්ධතිය, න්‍යායාත්මක කුසලතා කටපාඩම් කර ඉගෙනීමට පක්ෂපාතී වේ. ජාත්‍යන්තරව නිර්වචනය කරන ලද මිණුම් සලකුණු මත පදනම්ව ශ්‍රී ලාංකික සිසුන්ගේ කාර්යසාධනය ඇගයීමට එය ප්‍රමාණවත් තරම් විශ්වාසදායක නොවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රතිපත්ති සම්පාදකයින්ට යථාර්ථවාදී තක්සේරුවක් මත පදනම්ව නිගමනවලට එළඹීම අපහසු වේ. තවද, දැනට පවතින තක්සේරුකරණ පද්ධතිය සිසුන්ට අධික ආතතියක් ඇති කරන අතර, එය අවසානයේදී ඔවුන් වෙහෙසට පත් කිරීමට (burnout) හේතු වේ.

පවතින ඇගයීම් පද්ධතිය ද ඉගෙනුම ලබන්නන්ගේ විවිධ කුසලතා සහ හැකියාවන් සැලකිල්ලට ගනිමින් සංශෝධනය කළ යුතුය.

**අධ්‍යාපනික ගුණාත්මකබව ප්‍රමාණවත් නොවීම:** ඉගැන්වීමේ සහ අධ්‍යාපන නායකත්වයේ ගුණාත්මකභාවය ප්‍රමාණවත් නොවන අතර එය දුර්වල ඉගෙනුම් ප්‍රතිඵලවලට මඟ පාදයි. ප්‍රමාණවත් විෂය දැනුමක් ඇති ගුරුවරුන්ගේ (විශේෂයෙන් සමහර විෂයයන්හි) හිඟයක් පවතින අතර, එබැවින් සමහර ගුරුවරුන් තමන් ඉගැන්වීමට සුදුසුකම් නොලබන විෂයයන් ඉගැන්වීම සිදු කරයි, එය ඵලදායී නොවේ.

**"විභාග සඳහා ඉගැන්වීම":** ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් විභාග සමත්වීමේ ප්‍රතිශතය වැඩි දියුණු කිරීම සඳහා අන්තර්ගත දැනුම ලබා දීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. එමනිසා, ගුරුවරුන් බොහෝ විට විමර්ශනාත්මක ඉගෙනීම පෝෂණය කරනවා වෙනුවට "විභාගය ඉලක්ක කර ගනිමින් උගන්වයි".

**විද්‍යා විෂය ධාරාව සඳහා පවත්නා සීමිත ප්‍රවේශය:** සියලුම පාසල්වලින් 28%ක් පමණක් 11 ශ්‍රේණියෙන් ඔබ්බට පන්ති පවත්වන අතර, ඉන් 36%ක් පමණක් - ඊනියා "1ඒබී පාසල්" - ප්‍රධාන විෂය ධාරාවන් හතර (විද්‍යාව, වාණිජ්‍යය, කලා සහ තාක්ෂණය) පිරිනමයි. කෙසේ වෙතත්, යථාර්ථයේ දී, සියලු ම "1ඒබී පාසල්" තාක්ෂණ විෂය ධාරාව පිරිනමන්නේ නැත. මේ අනුව, විෂය ධාරාවන් හතරම පිරිනමන 1ඒබී පාසල් සියලුම පාසල්වලින් 10%ක් පමණක් නියෝජනය කරයි. එබැවින්, බඳවා ගැනීම් කලා හා වාණිජ විෂය ධාරාවන් පමණක් පිරිනමන වෙනත් වර්ගවල පාසල් වෙත වැඩි නැඹුරුවක් දක්වයි.

**ගුරුවරුන් ස්ථානගතකිරීමේ අසමතුලිතතාව:** දුර්වල ස්ථානගතකිරීමේ ක්‍රමවේදයන් හේතුවෙන් ඇතැම් විෂයයන් සඳහා සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ හිඟයක් පවතී. යෙදවීමේ ක්‍රමවේදයන් දිගු කලක් තිස්සේ නාගරික පාසල් වෙත නැඹුරු වී ඇති බැවින්, STEM විෂයයන්හි මෙය විශේෂයෙන් කැපී පෙනේ, එමඟින් නාගරික නොවන සිසුන්ට STEM ධාරාවන්ට ප්‍රවේශ වීම අපහසු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, පළාත්බද හා ග්‍රාමීය ප්‍රදේශවල STEM ප්‍රවේශය වැඩි කිරීම සඳහා අමතර පන්ති කාමර සහ විද්‍යාගාර සැපයීමට රජය දරන ප්‍රයත්නයන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා දී නොමැත. මේ අනුව, තේරීම් නොමැතිකම හේතුවෙන්, ග්‍රාමීය ප්‍රදේශවල ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් බඳවා ගැනීම් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයයන් වෙත නැඹුරු වී ඇත.

**විද්‍යා විෂය ධාරාවෙහි අඩු කාර්යසාධනය:** විද්‍යා ධාරාවේ අඩු කාර්ය සාධනය සිසුන් අධෛර්යමත් කරයි. ජෛව විද්‍යාව (58.15%) සහ භෞතික විද්‍යාව (57.84%) යන විෂයයන්හි සමත් වීමේ ප්‍රතිශතය කලා (66.78%) ධාරාවට වඩා අඩු විය.

**ඇතැම් උසස් අධ්‍යාපන පාඨමාලා සඳහා සීමිත අවස්ථා:** තෘතීයික මට්ටමේ STEM වැඩසටහන් සඳහා සීමිත ප්‍රවේශය පිළිබඳ ගැටලු, විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අවස්ථා වැඩි කර ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන් කලා ධාරාව තෝරා ගැනීමට පොළඹවයි. 2022 වසරේදී, කලා, නීතිය, කළමනාකරණය සහ වාණිජ්‍යය මුළු උපාධි අපේක්ෂක බඳවා ගැනීම් වලින් 47% ක් වූ අතර, විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය සහ පරිගණක විද්‍යාව 27% ක් විය. තවදුරටත්, විවිධ හැකියාවන් සහිත සිසුන් සඳහා තෘතීයික මට්ටමේ අවස්ථා සීමිතය.

**ප්‍රවේශයේ පවත්නා අසමානතාව සහ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් කෙරෙහි සංවේදීතාව අඩු වීම:** පවතින අධ්‍යාපන පද්ධතියට විශේෂ අවශ්‍යතා සහිත සිසුන් නිසි ලෙස රැකබලා ගැනීමට හැකියාවක් නැත. වර්තමානයේ, එවැනි සෞඛ්‍ය තත්ත්වයන් සහිත සිසුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් නොමැති අතර, එවැනි සිසුන් කළමනාකරණය කිරීමට සහ සේවය කිරීමට මානව සම්පත්, පුහුණුව සහ භෞතික සම්පත් අතින් පාසල් ප්‍රමාණවත් ලෙස සන්නද්ධ වී නොමැත.

ඉහත දුර්වලතා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ව්‍යුහගත සහ මනා ලෙස සැලසුම් කරන ලද ප්‍රතිඵල පාදක අධ්‍යාපන පද්ධතියක් වඩාත් ඵලදායී මාධ්‍යය බව විශ්වාස කෙරේ.

එවැනි අධ්‍යාපන පද්ධතියක් මඟින් චිත්තවේගීය වශයෙන් බුද්ධිමත්, සමාජීය වශයෙන් වගකීම් සහගත, සමාජීය හා සංස්කෘතික වශයෙන් දැනුවත්, දේශපාලනික වශයෙන් සාක්ෂරතාවයෙන් යුත්, විවේචනාත්මක චින්තනයට හැකියාව ඇති පුරවැසියන් නිර්මාණය කරනු ඇති අතර, ඔවුන් රටේ ආර්ථික සමෘද්ධියට සහ තිරසාර සංවර්ධනයට දායක වනු ඇත.

## 1.5 යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ ප්‍රධාන අංග

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ නොමිලේ අධ්‍යාපනය සැපයීමට රාජ්‍යයේ ඇති කැපවීමයි. නිදහස ලැබීමටත් පෙර 1944 දී ව්‍යවස්ථාදායක සභාවේදී නිදහස් අධ්‍යාපන පනත සම්මත කරන ලද අතර, ජාතික ජන බලවේග රජය රාජ්‍ය පාසල්වලට ඇතුළත් වන සියලුම සිසුන්ට සහ රජයේ විශ්වවිද්‍යාල සඳහා උපාධි අපේක්ෂක අධ්‍යාපනයට තෝරා ගන්නා සියලුම සිසුන්ට නොමිලේ පාසල් අධ්‍යාපනය ලබා දීමට දැඩි ලෙස කැපවී සිටී. තවද, තෝරාගත් සිසුන් සංඛ්‍යාවකට තාක්ෂණික හා වෘත්තීය පුහුණු ආයතනවල ද නොමිලේ අධ්‍යාපනය ලබා දේ. රජය රටේ සියලුම දරුවන්ට ඔවුන්ගේ ශාරීරික, සංජානන සහ චිත්තවේගීය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අධ්‍යාපනයට සමාන හා සාධාරණ ප්‍රවේශයක් ලබා දීමට ද කැපවී සිටී. "පොහොසත් රටක්: ලස්සන ජීවිතයක්" යන ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ මෙම දැක්ම පැහැදිලිව ප්‍රකාශ කර ඇති අතර, එය අධ්‍යාපනය මූලික අයිතිවාසිකමක් ලෙස මෙන්ම සමාජයීය වශයෙන් ඇතුළත් සංවර්ධනයේ ප්‍රධාන ගාමක බලවේගයක් ලෙස හඳුනා ගනී. නිදහස් අධ්‍යාපනය පුද්ගලයන් සවිබල ගැන්වීමේ මාධ්‍යයක් පමණක් නොව, ජාතික වටිනාකම් සහ අනන්‍යතා ආරක්ෂා කර ගනිමින් ගෝලීය පීඩනයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඇති දැනුම පදනම් කරගත් ආර්ථිකයක් ගොඩනැගීම සඳහා වූ දිගුකාලීන ආයෝජනයකි.

වර්තමාන රජය ද ඉතිහාසය පුරා ආගමික ආයතන, ලාභ නොලබන සංවිධාන සහ පෞද්ගලික අංශයේ ආයතන වැනි අනෙකුත් හවුල්කරුවන් ද රටේ අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇති බවත් දිගටම ඉටු කරන බවත් අගය කරයි.

මෙම සන්දර්භය තුළ, යෝජිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සැලසුම් කර ඇත්තේ ජාතික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම සඳහා යොමු කරන ලද ගෝලීය වශයෙන් පිළිගත් අධ්‍යාපනික මූලධර්ම මත පදනම් වූ නව අධ්‍යාපන පද්ධතියක් සහ සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා ය. එබැවින්, අධ්‍යාපනය පුද්ගලික දියුණුවට සහ සාමූහික සමෘද්ධියට අඛණ්ඩව පදනමක් ලෙස සේවය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ මූලික මූලධර්ම මගින් මඟ පෙන්වනු ලබන අතර, ප්‍රවේශය සහ සාධාරණත්වය සහතික කිරීම, ගුණාත්මකභාවය සහ අදාළත්වය පවත්වා ගැනීම, සමාජයීය වශයෙන් ඇතුළත් කිරීම පෝෂණය කිරීම, සහ වගවීම හා නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සිදු කරයි.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය මෙහෙයවන මූලධර්ම නම්::

- නොමිලේ අධ්‍යාපනය සහ සමාන හා සාධාරණ ප්‍රවේශය
- නොමිලේ අධ්‍යාපනය සහ සමාන හා සාධාරණ ප්‍රවේශය
- සියල්ලන්ටම පිළිගත හැකි වීම
- සමාජයට වගකියන වගකිව යුතු පුරවැසියන්
- තිරසාරත්වය හා නවෝත්පාදනය
- යාවජීව ඉගෙනුම

# 2වන පරිච්ඡේදය: යෝජිත ප්‍රතිසංස්කරණ

## 2.1 විෂයමාලා සංවර්ධනය

විෂයමාලා සංශෝධනයේ සමස්ත ඉලක්කය වන්නේ 21 වන සියවසේ සහ එයින් ඔබ්බට ඇති අභියෝග සඳහා සූදානම් පුරවැසියෙකු බිහි කිරීම සඳහා පදනම දැමීම සහ රටේ තිරසාර ජාතික සංවර්ධනය හා සාමය ඇති කිරීමේ ක්‍රියාවලියට දායක වීමයි.

### 2.1.1 *විෂයමාලා සංශෝධනයේ අරමුණු*

සංශෝධිත විෂයමාලාව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරයි.

- ඉගෙනුම් ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සඳහා විෂය මාලාවේ අදාළත්වය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
- අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය අංග ලෙස විවේචනාත්මක චින්තනය සහ සංවාදය අවධාරණය කිරීම.
- බහුවිධ බුද්ධි කුසලතා (multiple intelligences) ප්‍රවර්ධනය කිරීම.
- චිත්තවේගීය බුද්ධියේ වටිනාකම හඳුනා ගැනීම.
- විද්‍යා හා තාක්ෂණ ධාරාවන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ අවස්ථා වැඩි කිරීම සහ විවිධාංගීකරණය කිරීම.
- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි සමාජ හා දේශපාලනික වටිනාකම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ප්‍රවර්ධනය කිරීම.
- තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සහ පුරවැසි අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.
- සාධාරණත්වය, අන්තර්කරණය සහ සමාජ යුක්තිය වැනි ප්‍රධාන වටිනාකම් කාවැද්දීම.
- පාසල්-ප්‍රජා සම්බන්ධතා ශක්තිමත් කිරීම.
- සමාජ දැනුවත්භාවයෙන් පොහොසත් ව්‍යවසායකත්ව දැක්මක් ප්‍රවර්ධනය කිරීම.

### 2.1.2 *ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යාප්තිය / අධ්‍යාපන කාලසීමාව*

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (2020-2030) අනුව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ව්‍යාප්තිය මෙලෙස හඳුනාගත හැකිය:

- මුල් ළමාවිය සංවර්ධනය සහ අධ්‍යාපනය (ECCE)
- සාමාන්‍ය අධ්‍යාපනය
- උසස් අධ්‍යාපනය
- තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය

ඉහත සඳහන් ඒවායින්, මුල් ළමාවිය සංවර්ධනය සහ අධ්‍යාපනය (ECCE) කාලය ආසන්න වශයෙන් වසර දෙකක් වන අතර, ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ ක්‍රියාකාරීන්ගේ වැඩි අවධානයක් යොමු විය යුතු කාල පරිච්ඡේදයක් ලෙස හඳුනාගෙන ඇත. මුල් ළමාවිය සංවර්ධනය සහ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමේ වගකීම පළාත් සභා විසින් දරන ලදී. කෙසේ වෙතත්, මෑත කාලීන වර්ධනයන්හි ප්‍රතිඵලයක් ලෙස, ජාතික අධ්‍යාපන ආයතනයට (NIE) මුල් ළමාවිය සංවර්ධනය සහ අධ්‍යාපනය සඳහා විෂයමාලාව සංවර්ධනය කිරීමේ අධිකාරිය පැවරී ඇති අතර, එබැවින් මෙම අදියර දැන් රටේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස ඇතුළත් කර ඇත.

දරුවෙකු පාසලේ ගත කිරීමට අපේක්ෂා කරන වසර 13ක කාලය (පාසල් කාලය) ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන කාලය ලෙස සැලකේ. වසර 13ක සාමාන්‍ය අධ්‍යාපන කාලය ප්‍රධාන අදියර තුනකට බෙදනු ඇත:

- ප්‍රාථමික අධ්‍යාපන අවධිය (වසර 5ක කාලය, 1-5 ශ්‍රේණි දක්වා)
- කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවධිය (වසර 4ක කාලය 4, 6-9 ශ්‍රේණි දක්වා)
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අවධිය (වසර 4ක කාලය 4, 10-13 ශ්‍රේණි දක්වා)
  - ජ්‍යෙෂ්ඨ ද්විතීයික අදියර 1
  - ජ්‍යෙෂ්ඨ ද්විතීයික අදියර 2

ශිෂ්‍යයෙක් වයස අවුරුදු 5 සම්පූර්ණ වූ පසු පාසලට ඇතුළත් වී අවුරුදු 18 හෝ ඊට මදක් වැඩි වන තෙක් අධ්‍යාපනය ලබයි. අධ්‍යාපන වැඩසටහන් සහ අදාළ සුදුසුකම් හඳුනා ගැනීම සඳහා වන ජාත්‍යන්තර වර්ගීකරණයක් වන UNESCO හි ජාත්‍යන්තර අධ්‍යාපන වර්ගීකරණයට (ISCED) මෙම පද්ධතිය සංසන්දනය කිරීමේදී, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය ISCED හි පළමු මට්ටම් තුන තුළ පවතින බව නිරීක්ෂණය වේ.

### 2.1.3 *පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර*

රටක සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව තුළ හඳුනාගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර,

නිරන්තරයෙන් වෙනස් වන ලෝකයක තිරසාර සංවර්ධනය සහ වර්ධනය ළඟා කර ගැනීමේ අභියෝග සමඟ සාර්ථකව කටයුතු කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට හැකි පුරවැසියන් බිහි කිරීමේ එම ජාතියේ අභිලාෂය පිළිබිඹු කරයි. එවැනි පුරවැසියන්, තමන් තෝරාගත් ක්ෂේත්‍ර සහ වෘත්තීන්හි විශේෂඥ දැනුමක් ඇති අය වන අතරම, අවශ්‍ය විටෙක, සමාජ සමගියට සහ බහුසංස්කෘතික සහජීවනයට තර්ජනයක් වන ආධිපත්‍යවාදී, බෙදුම්වාදී බලවේගයන්ට ප්‍රතිරෝධය දැක්වීමට සහ ප්‍රතිචාර දැක්වීමට ද හැකියාව තිබිය යුතුය. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ හඳුනාගෙන ඇති ඉගෙනුම් ක්ෂේත්‍ර, වසර ගණනාවක් පුරා සිදුවී ඇති දැවැන්ත වෙනස්කම් සහ දියුණුව නොතකා, පසුගිය දශක කිහිපය තුළ වැඩි හෝ අඩු වශයෙන් ස්ථිතිකව පැවතුණි. සමකාලීන අධ්‍යාපනයේ මූලික මතයක් වන්නේ, නිරන්තරයෙන් වෙනස් වන ලෝකයට විශ්වාසයෙන් මුහුණ දීමට හැකි නව පරම්පරාවක පුරවැසියන්ට පහසුකම් සැලසීම සඳහා මෙම ඉගෙනුම් ක්ෂේත්‍ර නැවත සලකා බැලිය යුතු බවයි. ඔවුන් ඒ සමඟම, සමාජයේ විවිධ අන්තයන්හි සිටින ප්‍රජාවන්ට සූරාකෑමට ලක්වන, උකහා ගන්නා සහ හානිකර වන දේශීය හා ගෝලීය ක්‍රියාවලීන් හඳුනා ගැනීමට සහ විවේචනය කිරීමට හැකි විය යුතුය. ඒ අනුව, සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව සඳහා පහත සඳහන් ඉගෙනුම් ක්ෂේත්‍ර දහය යෝජනා කර ඇත. කෙසේ වෙතත්, හඳුනාගෙන ඇති පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍ර ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නියම කර ඇති විෂයයන් ලෙස නොසැලකිය යුතු බව අවධාරණය කෙරේ.

### 1. භාෂා හා සාක්ෂරතා අධ්‍යාපනය

සාක්ෂරතාව ළඟා කර ගැනීම සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු වලින් එකකි. සමකාලීන සන්දර්භය තුළ, සාක්ෂරතාව යන පදය ජීවිතයේ විවිධ අංශවල පුද්ගලයන්ගේ හැකියාවන් විස්තර කිරීමට භාවිතා කරයි (උදා: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව, මාධ්‍ය සාක්ෂරතාව සහ අධ්‍යයන සාක්ෂරතාව). කෙසේ වෙතත්, සාක්ෂරතාව එහි මූලික අර්ථයෙන්, එනම් කියවීමට හා ලිවීමට ඇති හැකියාව ලෙස සලකන විට, සාක්ෂරතාව ළඟා කර ගැනීමේ මූලික මාධ්‍යය ලෙස භාෂා අධ්‍යාපනය හඳුනාගත හැකිය. බහුභාෂා භාවිතය සාමාන්‍ය දෙයක් වන ලෝකයක, සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ භාෂා අධ්‍යාපනය ක්ෂේත්‍ර දෙකකට වර්ග කළ හැකිය: නිවසේ භාෂාව (මව් භාෂාව) ඉගෙනීම සහ වෙනත් භාෂා ඉගෙනීම. මව් භාෂාව හරහා ඉගෙනුම ලබන්නන් තම ඉතිහාසය, සංස්කෘතීන් සහ ප්‍රජාවන් සමඟ සම්බන්ධ වන බැවින්, දෙවන භාෂාව වන ඉංග්‍රීසි ඉගෙන ගන්නා අතරතුර මව් භාෂාවේ ප්‍රවීණත්වය ආරක්ෂා කිරීම හා ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.

ඉහත සඳහන් දෑ සාක්ෂාත් කර ගැනීම සඳහා, විෂය මාලාව සැලසුම් කිරීමේ ක්‍රියාවලිය රටේ ජාතික භාෂා ප්‍රතිපත්තිය මගින් මෙහෙයවනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ භාෂා අධ්‍යාපන ප්‍රතිපත්තිය රටේ සංස්කෘතික විවිධත්වය තුළ ගැඹුරින් මුල් බැසගෙන ඇති අතර, එහි බහුභාෂා භාවිතයට අගය කරන දිගුකාලීන සම්ප්‍රදායක් පවතී. ශ්‍රී ලංකාවේ බහුතර ජනතාව භාවිතා කරන නිල භාෂා දෙක වන දෙමළ සහ සිංහල, සහ සමකාලීන සන්දර්භය තුළ අත්‍යවශ්‍යම ජාත්‍යන්තර භාෂාව වන ඉංග්‍රීසි, භාෂා හා සාක්ෂරතා අධ්‍යාපනය සම්බන්ධයෙන් සාමාන්‍ය අධ්‍යාපන විෂය මාලාවේ කොඳු නාරටිය සාදනු ලබයි. තවද, යෝජිත ප්‍රතිසංස්කරණ මගින් සිංහල කතා කරන ජනතාව සඳහා දෙමළ භාෂාව ද, දෙමළ කතා කරන ජනතාව සඳහා සිංහල භාෂාව ද ඉගෙනීම - සංහිඳියාව සහ සහජීවනය සඳහා අත්‍යවශ්‍ය මාධ්‍යයක් ලෙස - ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිපත්ති ලේඛනය, මව් භාෂාව, පළමු භාෂාව, දෙවන භාෂාව යනාදී පවතින අර්ථකථන පුළුල් කිරීමේ අවශ්‍යතාව ද පිළිගන්නා අතර, අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට ශ්‍රී ලංකාවේ ප්‍රකටතාවෙන් අඩු භාෂා කතා කරන අය ඇතුළත් කිරීමට සහ සංඥා භාෂාව භාවිත කරන්නන්ගේ වාග්විද්‍යාත්මක අභිලාෂයන් ද හඳුනා ගනී.

පාසල් මට්ටමේ උගන්වනු ලබන අනෙකුත් සියලුම භාෂා, සාමාන්‍ය අධ්‍යාපනයෙන් අපේක්ෂිත 21 වන සියවසේ පුරවැසියාට අගය එකතු කිරීමක් ලෙසත්, සිසුන්ගේ විශේෂිත රුචිකත්වයන් සහ අභිලාෂයන් සපුරාලීමක් ලෙසත් සැලකේ.

පාසල් පද්ධතිය තුළ ඇති සියලුම භාෂා ඉගෙනීමේ ප්‍රයත්නයන්, දේශීය මෙන්ම ගෝලීය සන්දර්භයන් තුළ ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට හැකියාව ඇති පුරවැසියෙකු බිහි කිරීම සඳහා යොමු විය යුතුය. මේ අනුව, භාෂා ඉගැන්වීම, භාෂාව පිළිබඳව ඉගැන්වීම (එය purely academic endeavor එකක් වන අතර) වෙනුවට, ඉගෙනුම ලබන්නාට ඔවුන් ඉගෙන ගන්නා භාෂා දේශීය හා ගෝලීය සන්නිවේදනයේ ඵලදායී මෙවලම් ලෙස භාවිතා කිරීමට බලගන්වන ක්‍රියාවලියක් විය යුතුය. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන සන්දර්භය තුළ භාෂා අධ්‍යාපනයට ප්‍රධාන අරමුණු දෙකක් ඇත:

(අ) සිසුන්ට තම පළමු භාෂාව සහ අනෙකුත් භාෂා මූලික අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා භාවිතා කිරීමට ඉගැන්වීම, එවිට ඔවුන්ට විශ්වාසයෙන් අදහස් ප්‍රකාශ කිරීමට, ප්‍රශ්න

ඇසීමට, තර්ක කිරීමට, මත දැරීමට හා ආරක්ෂා කිරීමට මෙන්ම සමගිය පෝෂණය කිරීමේ අරමුණින් වෙනත් භාෂා කතා කරන අය සමඟ සන්නිවේදනය කිරීමට හැකි වේ.

(ආ) සිසුන්ට තම අභිමතය පරිදි ඉගැන්වීමේ මාධ්‍යයෙන් විෂය අන්තර්ගතය ඉගෙනීම සඳහා අවශ්‍ය අධ්‍යයන භාෂා නිපුණතාවය ප්‍රගුණ කිරීමට හැකියාව ලබා දීම.

ශ්‍රී ලංකාවේ ද්විභාෂා අධ්‍යාපනය සඳහා ඉහළ යන ඉල්ලුම සැලකිල්ලට ගෙන, සාමාන්‍ය අධ්‍යාපන සන්දර්භය තුළ ඉගැන්වීමේ මාධ්‍යය නියාමනය කරන පුළුල් ප්‍රතිපත්තියක් සකස් කරමින් පවතී. එවැනි ප්‍රතිපත්තියක් මගින් ද්විභාෂා අධ්‍යාපනයේ සියලුම අංශ සාධාරණ, සමාන සහ සමාජයීය වශයෙන් ඇතුළත් ආකාරයකින් වඩා හොඳින් ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත.

## 2. විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු විද්‍යා සහ ගණිත (STEM) අධ්‍යාපනය

විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය (STEM) අධ්‍යාපනය, වර්තමාන විවිධ හා සංකීර්ණ ලෝකයේ ඕනෑම සමාජයකට දියුණු වීමට සමගාමී ශක්තියක් සපයයි. භෞතික ලෝකය සහ අවට ස්වභාවික පරිසරය අර්ථවත් ලෙස අවබෝධ කර ගැනීමට සහ අත්විඳීමට සිසුන්ට හැකියාව ලැබෙන්නේ ප්‍රධාන වශයෙන් විද්‍යා අධ්‍යාපනය හරහාය. තමන් අවට ලෝකය පිළිබඳ නිසි විද්‍යාත්මක අවබෝධයක් ඇති පුරවැසියන් අප ජීවත් වන ලෝකය කෙරෙහි වඩාත් සංවේදී වන අතර, එමගින් එය මිනිස් ජීවිතයට වඩාත් ආරක්ෂිත, තිරසාර සහ සුවපහසු ස්ථානයක් බවට පත් කිරීමට වඩා හොඳින් දායක වීමට හැකියාව ඇත.

පාසල් පද්ධතිය තුළ STEM අධ්‍යාපනය ප්‍රධාන අරමුණු දෙකක් සාක්ෂාත් කරගැනීම සඳහා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ: අ) රටේ තිරසාර සංවර්ධනයට දායක වීම සහ ආ) මෙම ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය සඳහා සිසුන් පෙළඹවීම සහ යොමු කිරීම සහ නව්‍ය හා නිර්මාණශීලී චින්තකයන් වීමට ඔවුන්ට මග පෙන්වීම.

සන්නිවේදනයට පහසුකම් සැලසීම සඳහා ගණිතය භාෂාවන් තරමම වැදගත් වේ. ගණිත අධ්‍යාපනය, සැබෑ ජීවිතයේදී මුහුණ දෙන ගැටළු සඳහා හොඳම විසඳුම් සොයා ගැනීමට තීරණ ගැනීමට පුද්ගලයෙකුට හැකියාව ලබා දෙන තාර්කික හා විවේචනාත්මක චින්තනය වර්ධනය කිරීමට දායක වේ. එබැවින්, සියලුම සිසුන්ට මනා ගණිත අධ්‍යාපනයක් ලබා දීම අත්‍යවශ්‍ය වන අතර, එය විවේචනාත්මක හා නිර්මාණාත්මක චින්තනයට පහසුකම් සලසමින් ඔවුන්ට තවදුරටත් අධ්‍යාපනය හැදෑරීමට හැකියාව ලබා දිය හැකිය.

දැනුමේ වේගවත් ව්‍යාප්තිය සහ තාක්ෂණික දියුණුව හේතුවෙන් දැනුමේ වෙනස්වන ස්වභාවය මගින් ඇතිවන අභියෝගවලට මුහුණ දීම සඳහා තාක්ෂණය හා ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පුළුල් පුහුණුවක් ද අත්‍යවශ්‍ය වේ.

STEM යනු ගෝලීය උණුසුම සහ පුනර්ජනනීය නොවන සම්පත් ක්ෂය වීම හේතුවෙන් මිනිස් පැවැත්මට මුහුණ දෙන අභියෝග සමඟ කටයුතු කිරීම සඳහා විද්‍යාත්මක විමර්ශනය භාවිතා කිරීමට ඉගෙන ගන්නන්ට බලය ලබා දෙන පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍රයකි. STEM අධ්‍යාපනය දැනුම හා කුසලතා මනා ලෙස මිශ්‍ර කිරීමෙන් පමණක් අර්ථවත් කළ හැකිය.

## 3. සෞන්දර්ය අධ්‍යාපනය

සෞන්දර්යය යනු සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව තුළ සමරනු ලබන අත්‍යවශ්‍යම පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍රවලින් එකකි. සෞන්දර්ය අධ්‍යාපනයට සම්බන්ධ වඩාත්ම කැපී පෙනෙන මූලික නිපුණතාවය වන්නේ ජීවිතය අගය කිරීමයි. තවද, වර්තමාන තාක්ෂණික දියුණුවේ ලෝකයේ, පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍රයක් ලෙස සෞන්දර්ය අධ්‍යාපනය, තම නිර්මාණශීලීත්වය, නවෝත්පාදන හැකියාව සහ ප්‍රගතිශීලී සමාජ පරිවර්තනය සඳහා ඇති උද්‍යෝගය සමඟ පුළුල් ප්‍රජාවට විනෝදාස්වාදය ලබා දීමට සහ දැනුවත් කිරීමට හැකියාව ඇති පුරවැසියන් බිහි කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එපමනක් නොව, සෞන්දර්ය අධ්‍යාපනය සමාජයක සංස්කෘතික ජීවිතය අගය කරන චින්තකයින් සහ නිර්මාණකරුවන් බවට ඉගෙනුම ලබන්නන් පත් කිරීම සඳහා ඉතා වැදගත් වේ. සෞන්දර්ය අධ්‍යාපනය අන්තර් පුද්ගල සහ අන්තර් පුද්ගල චිත්තවේගීය බුද්ධියට මහ පාදන පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍රයක් බව ද හඳුනාගෙන ඇති අතර, එය ස්වයං දැනුවත්, ඔරොත්තු දෙන සහ සංවේදී පුරවැසියන් බිහි කිරීමේදී වැදගත් කරුණකි.

ජාතික විෂයමාලාව පුරා, පාසල් අධ්‍යාපනයේ එක් එක් අදියරෙහි ප්‍රධාන අරමුණු සැලකිල්ලට ගනිමින්, සෞන්දර්ය අධ්‍යාපනය විවිධ ආකාරවලින් පිරිනමනු ලැබේ. එය වඩාත් ප්‍රායෝගික දිශානතියක් ගන්නා අතර, එමගින් සෞන්දර්ය අධ්‍යාපනය ඉගෙනුම ලබන්නන්ට වඩාත් අර්ථවත් වනු ඇත. විවිධ සෞන්දර්යාත්මක ආකාර පුහුණු කිරීම සහ අත්විඳීම සිසුන්ගේ සතුට, විවේකය සහ චිත්තවේගීය සමබරතාවය සඳහා වැදගත් වේ.

### 4. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය

සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික අංගයක් බවට පත් කිරීමේ වැදගත්කම කිසිසේත් අවතක්සේරු කළ නොහැක. රටේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍රයක් ලෙස සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ශක්තිමත් හා නිරෝගී ජාතියක් නිර්මාණය කිරීමට පදනම සපයනු ඇත. මිනිසුන්ගේ සෞඛ්‍යයට අහිතකර ජීවන රටා බරපතල කනස්සල්ලට හේතු වන ලෝකයක, ජාතික විෂය මාලාව තුළ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනයට පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍රයක් ලෙස ප්‍රමුඛත්වය දීම අත්‍යවශ්‍ය වන්නේ එය ශාරීරිකව හා චිත්තවේගීයව නිරෝගී ජීවන රටාවක් අවබෝධ කර ගැනීමට, අගය කිරීමට සහ පුහුණු වීමට සිසුන්ට හැකියාව ලබා දෙන බැවිනි.

### 5. ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය සහ ව්‍යවසායකත්ව අධ්‍යාපනය

ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය සහ ව්‍යවසායකත්ව අධ්‍යාපනය තිරසාර ජාතික සංවර්ධනයට සහ සාර්ථක ජීවිතයකට දායක විය හැකි ප්‍රධාන පුළුල් ඉගෙනුම් ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන ඇත. ආර්ථික විද්‍යාව, ආර්ථික හා සමාජ සංවර්ධනය, සහ සමාජ-ආර්ථික වෙනස්කම් හා අසමානතා පිළිබඳ මූලික දැනුම කාවැද්දීම ඵලදායී චින්තකයින් සහ වගකිවයුතු පුරවැසියන් බිහි කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. තවද, ව්‍යාපාර හා කළමනාකරණ කුසලතා, රැකියා කුසලතා, වගකීම් සහ සදාචාරාත්මක ව්‍යවසායකත්ව දැක්මක්, සහ අස්ථාවර ලෝකයක අභියෝග ජය ගැනීමට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම නව විෂයමාලාව මගින් ආමන්ත්‍රණය කරයි. ආර්ථික ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන සම්පත් හුවමාරු කරගනිමින් භාවිත කිරීම, ලාභ බෙදා හැරීම, කම්කරු අයිතිවාසිකම් සහ ආරක්ෂාව සහ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ශක්තිමත් කිරීම අවධාරණය කරන ව්‍යවසායකත්වයේ සහයෝගී ආකෘතීන් විෂයමාලාව මගින් ගවේෂණය කරනු ඇත.

නූතන ජීවන රටාවේ ආර්ථික දෘෂ්ටිකෝණ නිරන්තරයෙන් වෙනස් වෙමින් පවතී. මුදල් භාවිතය, භාණ්ඩ හා සේවා විකිණීම සහ මිලදී ගැනීම සහ රැකියාවේ ස්වභාවය පිළිබඳ නව ප්‍රවණතා ඇත. ඩිජිටල් මුදල් වර්ග සහ ඩිජිටල් ගනුදෙනු භාවිතය මෙන්ම ඊ-වාණිජ්‍යය නව ලෝක පිළිවෙල බවට පත්වෙමින් තිබේ. එබැවින්, මෙම දියුණුවෙහි කාර්යක්ෂම, ඵලදායී, වගකිවයුතු සහ සදාචාරාත්මක පරිශීලකයින් වීමට පුරවැසියන්ගේ මීළඟ පරම්පරාව සූදානම් කිරීම අත්‍යවශ්‍ය වේ.

### 6. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යාපනය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යාපනයේ අරමුණ වන්නේ සමාජ අන්තර්ක්‍රියා, ඉතිහාසය, සංස්කෘතිය, දේශපාලනය, වෙළඳාම සහ හුවමාරුව, සහ කලා වැනි මානව අත්දැකීම්වල විවිධ පැතිකඩයන් පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීමයි. එබැවින්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යාපනය සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාවේ ප්‍රධාන කොටසකි. සමාජයීය වශයෙන් ඇතුළත් දැක්මක් ප්‍රවර්ධනය කිරීම මගින් තමන් ජීවත් වන ලෝකය කෙරෙහි ධනාත්මක හා විවේචනාත්මක ආකල්පයක් ඇති පුරවැසියෙකු බිහි කිරීමට ශක්තිමත් පදනමක් සකස් කරන්නේ මෙම ඉගෙනුම් ක්ෂේත්‍රයයි. තවද, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි අධ්‍යයනයන් හුදෙකලාවෙන් ඔබ්බට දැකීමට සහ ආත්මාර්ථකාමීත්වය ඉක්මවා යාමට ඉගෙනුම ලබන්නන්ට උපකාරී වනු ඇත.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අධ්‍යාපනය සිසුන්ට විවිධ අනන්‍යතා වර්ධනය කිරීමට මෙන්ම විවේචනය කිරීමට ද ඉතා වැදගත් වන අතර, එමගින් ඔවුන්ට තම ආසන්න ප්‍රජාවන්හි සහ ජාතිය තුළ තම භූමිකාව පිළිබඳව දැනුවත්භාවයක් ඇති වේ. එවැනි දැනුවත්භාවයක් සාමය හා සංහිඳියාව සඳහා අවශ්‍ය වන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට සහ අන්තර් ප්‍රජා සංවාදයට දායක වීමට ඔවුන්ට ඉඩ සලසයි. තවද, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි ශක්තිමත් පදනමක් කුලය, ආබාධිතභාවය, ස්ත්‍රී පුරුෂ භාවය සහ සමාජ ස්ථරීකරණයේ අනෙකුත් ලක්ෂණ සම්බන්ධයෙන් සාධාරණත්වය සහ සමාජ යුක්තිය කරා මඟ පාදනු ඇත. මෙම විෂයයන් ගෝලීය පුරවැසියන් ලෙස තම භූමිකාව සහ වගකීම අගය කරමින් තම රටේ සංවර්ධනයට සහභාගී වීමට ද ඉගෙනුම ලබන්නන්ට උපකාරී වනු ඇත. අන්තර් පුද්ගල මට්ටමින්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි පදනමක් වැඩි ස්වයං දැනුවත්භාවයක් සහ සංවේදනයක් කරා මඟ පාදන අතරම සංකීර්ණ හැඟීම් අවබෝධ කර ගැනීමට සහ ඒවා සමඟ කටයුතු කිරීමට ඇති හැකියාව ද වැඩි දියුණු කරයි.

### 7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සිව්වන කාර්මික විප්ලවයේ පදනම ලෙස සැලකෙන අතර, එබැවින් ICT සාක්ෂරතාවයෙන් යුක්ත වීමට අවශ්‍ය කුසලතාවලින් ජාතිය සවිබල ගැන්වීම රටේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන මෙහෙවරකි. වත්මන් විෂයමාලාව ප්‍රතිසංස්කරණය සිසුන් තාක්ෂණික වශයෙන් දක්ෂ බවට පත් කළ යුතු අතර, තාක්ෂණික වශයෙන් වර්ධනය වන ලෝකයක ඵලදායීව හා ආචාරධාර්මිකව සහභාගී වීමට ඔවුන්ට

අවබෝධයක් හා හැකියාවක් ලබා දිය යුතුය. උදාහරණයක් ලෙස, එදිනෙදා ජීවිතයේදී, නිවසේදී, පාසලේදී සහ සමාජය තුළ භාවිතා කළ හැකි තාක්ෂණය සහ එහි මෙවලම් පිළිබඳ දැනුවත්භාවය ගොඩනැගීම අරමුණු විය යුතුය. අතිරේකව, එවැනි විෂයමාලාවක් සිසුන්ට තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාංග පිළිබඳ මූලික දැනුම ලබා දෙන අතරම මූලික පරිගණක දැනුම හා කුසලතා ද උගන්වනු ඇත. තාක්ෂණයේ සූරාකෑමට ලක්වන, නීති විරෝධී සහ අනාර්ථික භාවිතය හඳුනාගෙන ඒවාට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ දැනුවත්භාවය මෙම අධ්‍යාපනයේ වැදගත් කොටසක් වනු ඇත.

**හරස් විෂයමාලා ඉගෙනුම් ක්ෂේත්‍ර**

යෝජිත නව විෂයමාලාව පුළුල් හා සාකල්‍ය දැක්මක් සහිත නවීන පුරවැසියෙකු සංවර්ධනය කිරීමේ ප්‍රධාන අංග ලෙස සැලකෙන හරස් විෂයමාලා ඉගෙනුම් ක්ෂේත්‍ර කිහිපයක් ද හඳුනා ගනී. මෙම ක්ෂේත්‍ර විවිධ විෂයයන්හි ඡේදනය වන ආකාරය අනුව අර්ථ දක්වා ඇති අතර, එබැවින් ඉගෙනුම් ක්ෂේත්‍ර කිහිපයක් මගින් තොරතුරු ලබාගෙන බලපෑම් කරනු ලැබේ.

**8. චරිත හා පුරවැසි අධ්‍යාපනය**

චරිත හා පුරවැසි අධ්‍යාපනය රට තුළ ශක්තිමත් සිවිල් සමාජයක් ගොඩනැගීමට දායක වේ. මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය, ජාතියක් දැනුවත් කිරීමේ මෙහෙවරෙන් පුරවැසියන් සවිබල ගැන්වීමේ අධ්‍යාපනයේ වඩාත්ම වැදගත් අංගය විය හැකිය. විශේෂයෙන්, නූතන සමාජයේ විවිධත්වයේ ගතිකත්වය අවබෝධ කර ගැනීම, ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන් අගය කිරීම, තීරණ ගැනීම, සහ ගෞරවනීය හා සාමකාමී සහජීවනය වැනි ශිෂ්‍යයෙකු තුළ වර්ධනය වන කුසලතා, අනාගත ජාතියේ ගොඩනැගීමේ අඩිතාලම ලෙස සලකනු ලැබේ.

**9. පරිසරය හා තිරසර සංවර්ධනය**

මෙම ග්‍රහලෝකයේ මිනිස් ජීවිතයේ තිරසාරභාවය සහතික කිරීම සඳහා වහාම ආමන්ත්‍රණය කළ යුතු දැවෙනසුළු හා හදිසි ගැටලු කිහිපයක් සමකාලීන ලෝකයේ පවතී. පසුගිය ශතවර්ෂ කිහිපය තුළ මානව ක්‍රියාකාරකම් ලෝකයේ පරිසර පද්ධති බිඳෙනසුළු, අවදානමට ලක්විය හැකි සහ අතිශයින්ම අස්ථාවර බවට පත් කර ඇත. දේශගුණික විපර්යාස, පාරිසරික දූෂණය, ගෝලීය උණුසුම සහ ස්වභාවික සම්පත් ක්ෂය වීම අනාගත පරම්පරාවන් සඳහා ලෝකය වඩාත් ආරක්ෂිත ස්ථානයක් බවට පත් කිරීමට වහාම අවධානය යොමු කළ යුතු ගැටලු කිහිපයකි. මෙම ගැටලු අවම කිරීම සඳහා ප්‍රායෝගික හා කල්පවත්නා විසඳුම් සොයා ගැනීමට තම ජනතාව දැනුවත් කිරීමේ වගකීම රටක අධ්‍යාපන පද්ධතියට ඇති බව විශේෂඥයෝ පවසති. එබැවින්, නව සහශ්‍රකයේ විෂයමාලා ප්‍රතිසංස්කරණ ව්‍යාපාර, සාමාන්‍ය අධ්‍යාපනය හරහා පරිසරය හා තිරසාර සංවර්ධනයට අදාළ ගැටලු ආමන්ත්‍රණය කිරීමට කැපී පෙනෙන ප්‍රයත්නයන් දරයි, මන්ද නිරෝගී, තිරසාර සහ පාරිසරික වශයෙන් වගකිවයුතු ජීවන රටාවක් පිළිබඳ අදහස ජීවිතයේ මුල් අවධියේදී වඩාත් ඵලදායී ලෙස කාවැද්දිය හැකි බැවිනි. එවැනි විෂයමාලා ප්‍රතිසංස්කරණ හරහා, සිසුන්ට මුලින්ම තම ආසන්න පරිසරය කෙරෙහි වගකීමක් වර්ධනය කර ගැනීමටත්, දේශීයව හා ගෝලීයව තිරසාර ජීවන රටාවක් සහතික කිරීම සඳහා තම ක්‍රියාවන් සහ හැසිරීම් පිළිබඳව දැනුවත් තීරණ ගැනීමටත් හැකි විය යුතුය.

**10. වැඩ ලෝකය සඳහා අධ්‍යාපනය**

මීළඟ පරම්පරාව රැකියාව සඳහා සූදානම් කිරීම අධ්‍යාපනයේ ප්‍රධාන වගකීම්වලින් එකකි. මේ සම්බන්ධයෙන් අධ්‍යාපනයේ ප්‍රධාන සැලකිල්ලක් වන්නේ, ගෙවීම් නොලබන ශ්‍රමය ඇතුළුව, ශ්‍රමය සෑම පුරවැසියෙකු විසින්ම ගෞරවයෙන් සලකන සහ අගය කරන සංස්කෘතියක් නිර්මාණය කිරීමයි. 4 වන කාර්මික විප්ලවයේ ආගමනයත් සමඟ, රටක් තම මානව සම්පත් අවශ්‍යතා විද්‍යාත්මකව තක්සේරු කර, ගෝලීය ආර්ථිකයේ වෙනස්වන ඉල්ලීම් සපුරාලීමට, ඒවා මෙහෙයවීමට, සහ අවශ්‍ය තැන්හිදී ප්‍රතිරෝධය දැක්වීමට තම වැඩ අධ්‍යාපනය නැවත සකස් කිරීම ඉතා වැදගත් වේ. නව තාක්ෂණයන්හි දියුණුව හේතුවෙන් නව වෘත්තීන් බිහිවීම සහ සමහර වෘත්තීන් පරිහානියට පත්වීම ලෝකය අත්විඳින බැවින්, අධ්‍යාපන පද්ධති ගතික වැඩ ලෝකයේ වෙනස්කම්වලට මුහුණ දීමට ඉගෙනුම ලබන්නන් සූදානම් කළ යුතුය. මේ සම්බන්ධයෙන් ඒ හා සමානව වැදගත් වන්නේ, මෙම ක්ෂේත්‍රයේ විෂයමාලාවේ මැදිහත්වීම් සිසුන් වෙනස්වීම් කළමනාකරණය කිරීමට සහ ප්‍රතිචාර දැක්වීමට සූදානම් කිරීමයි.

### 2.1.4 *පාරිභාෂික පද අර්ථ දැක්වීම*

යෝජිත විෂයමාලාවේ සන්දර්භය තුළ පහත සඳහන් අර්ථ දැක්වීම් භාවිතා වේ.

**මොඩියුලය:** මොඩියුලයක් යනු යම් විෂයයක් තුළ ඇති නිශ්චිත මාතෘකාවක්, කුසලතාවක් හෝ තේමාවක් ආවරණය කරන, අවධානය යොමු කළ, ස්වයං-අන්තර්ගත ඉගෙනුම් ඒකකයකි. එය ව්‍යුහගත අන්තර්ගතයන්, ක්‍රියාකාරකම් සහ තක්සේරු කිරීම්

හරහා නිර්වචනය කරන ලද ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා නිර්මාණය කර ඇත.

**විෂයය:** පාසල් විෂයයක් යනු පාසල් විෂයමාලාවේ කොටසක් ලෙස උගන්වනු ලබන දැනුම් හෝ ඉගෙනුම් සංවිධානාත්මක ක්ෂේත්‍රයකි. සෑම විෂයයක්ම ගණිතය, විද්‍යාව, භාෂාව, ඉතිහාසය වැනි නිශ්චිත අධ්‍යයන ක්ෂේත්‍රයක් කෙරෙහි අවධානය යොමු කරන අතර, සිසුන්ට එම විශේෂිත ක්ෂේත්‍රය තුළ අවබෝධ කුසලතා සහ නිපුණතා වර්ධනය කර ගැනීමට උපකාර කිරීම සඳහා නිර්මාණය කර ඇත.

**වැඩිදුර ඉගෙනුම් මොඩියුල (Further Learning Modules):** තවදුරටත් ඉගෙනුම් මොඩියුල යනු යම් විෂයයකට අදාළ අතිරේක මොඩියුල වන අතර, සම්මත මොඩියුල වලින් ලබාගත් දැනුම පොහොසත් කිරීමට සහ පුළුල් කිරීමට නිර්මාණය කර ඇත. මෙම මොඩියුල සිසුන්ගේ අවබෝධය ගැඹුරු කිරීම, කුතුහලය අවුලුවාලීම සහ විශේෂයෙන් ප්‍රායෝගික යෙදවීම්, අත්දැකීම් සහ තෝරාගත් විෂයයක නැගී එන වර්ධනයන්ට නිරාවරණය වීම තුළින් වැඩි උනන්දුවක් ඇති කිරීම අරමුණු කරයි. මෙම මොඩියුල මූලික විෂය මාලාවෙන් ඔබ්බට ගවේෂණය දිරිමත් කිරීම සඳහා සහ උසස් හෝ විශේෂිත රුචිකත්වයන් ඇති ඉගෙනුම ලබන්නන්ට, විශේෂයෙන් සැබෑ ලෝක සන්දර්භයන්හි සහ රැකියා ලෝකයේ තම දැනුම යෙදවීමට සහාය වීම සඳහා විශේෂයෙන් වටිනා වේ.

**පරිවර්තනීය මොඩියුල (Transversal Modules):** පරිවර්තනීය මොඩියුල යනු සාම්ප්‍රදායික විෂය සීමාවන් ඉක්මවා යන ඉගෙනුම් ඒකක වන අතර, විෂයයන් කිහිපයකට අදාළ වන කුසලතා, දැනුම, ස්වාධීනත්වය සහ වගකීම ආමන්ත්‍රණය කරයි. මෙම මොඩියුල සිසුන්ට ශාස්ත්‍රීය ඉගෙනීම සැබෑ ජීවිත සන්දර්භයන් සමඟ සම්බන්ධ කිරීමට උපකාර කිරීමෙන් ඔවුන්ගේ සාකල්‍ය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මාරු කළ හැකි නිපුණතා (transferable competencies) සහ ඒකාබද්ධ දැනුම පෝෂණය කිරීමෙන්, පරිවර්තනීය මොඩියුල සිසුන් අධ්‍යයන සාර්ථකත්වය සඳහා පමණක් නොව, එදිනෙදා ජීවිතයේ සහ රැකියා ලෝකයේ අර්ථවත් සහභාගීත්වය සඳහා ද සූදානම් කිරීම අරමුණු කරයි.

**තවදුරටත් බලගැන්වීමේ මොඩියුල (Enrichment Modules):** තවදුරටත් බලගැන්වීමේ මොඩියුල යනු සිසුන් එකම විෂයධාරාවෙන් තෝරා ගන්නා මොඩියුල වන අතර, විශේෂිත විෂයධාරාවට අත්‍යවශ්‍ය මූලික විෂයයන් හැර.

**අන්තර් විෂය මොඩියුල (Interdisciplinary Modules):** මෙම මොඩියුල ශිෂ්‍යයෙකු තෝරාගත් විෂයධාරාවේ මූලික හෝ අත්‍යවශ්‍ය විෂය ක්ෂේත්‍රවලින් පිටතට වැටේ. කෙසේ වෙතත්, ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ දෙවන අදියරේදී ලබා දෙන පුළුල් ඉගෙනුම් අවස්ථා වල කොටසක් ලෙස ඒවා ගත හැකි අතර, සිසුන්ට අමතර රුචිකත්වයන් ගවේෂණය කිරීමට හෝ අනුපූරක කුසලතා ලබා ගැනීමට හැකි වේ.

**පාසල් සම්භාර (School Credit):** පාසල් සම්භාර යනු එක් එක් විෂයයේ හෝ මොඩියුලයේ ශිෂ්‍යයෙකු විසින් ලබාගත් ඉගෙනුම් ප්‍රමාණය ප්‍රමාණාත්මක කරන මිනුමකි. එක් සම්භාර එකක් මුළු ඉගෙනුම් කාලය පැය 10 ට සමාන වන අතර, එයට සෘජු උපදෙස්, මඟ පෙන්වන අධ්‍යයනය, පැවරුම්, ප්‍රායෝගික වැඩ සහ ස්වාධීන ඉගෙනීම ඇතුළත් විය හැකිය.

## 2.1.5 *යෝජිත විෂයමාලා පරිවර්තනයේ කැපී පෙනෙන ලක්ෂණ*

☛ **6 ශ්‍රේණියේ සිට ඉහළට පාසල් ක්‍රෙඩිට් ක්‍රමයක් (වාරයකට ක්‍රෙඩිට් 35/පැය 350)**

කනිෂ්ඨ ද්විතීයික අවධියේ සිට හඳුන්වා දෙන පාසල් ක්‍රෙඩිට් ක්‍රමය, දරුවෙකු වාරයක් තුළ නිරත වන ඉගෙනුම් පරිමාව තීරණය කිරීමට උපකාරී වේ. මෙම ක්‍රමය අනුව, පාසල් ක්‍රෙඩිට් එකක් උපයා ගැනීම සඳහා, ශිෂ්‍යයෙකු පැය 10ක ඉගෙනුම් (විනාඩි 600) සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. මෙයින් විනාඩි 500ක් (විනාඩි 50ක කාල පරිච්ඡේද 10ක්) පාසල් කාලය තුළට අයත් වන අතර, ඉතිරි (විනාඩි 100) පන්ති කාමරයෙන් පිටත ස්වයං-නියමු ඉගෙනීම සඳහා වෙන් කෙරේ. විෂයමාලාව සංවර්ධනය කිරීමේදී, විෂයමාලා සංවර්ධකයින්ට එක් එක් විෂයය සඳහා විෂයමාලාව අර්ථවත් පැය 10ක ඒකකවලට බෙදීමට අපේක්ෂා කෙරේ, එවිට ශිෂ්‍යයෙකුට එම ඉගෙනුම් ඒකකය සම්පූර්ණ කිරීමෙන් පසු සම්භාර එකක් උපයා ගත හැකිය. උපදේශාත්මක ද්‍රව්‍ය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ද මෙම ක්‍රමය අනුගමනය කරයි, මන්ද උපදේශාත්මක ද්‍රව්‍ය පැය 10ක ඉගෙනුම් ඒකක බෙදීම සමඟ පෙළගැසී නිර්මාණය කර ඇත. මේ ආකාරයෙන්, ශිෂ්‍යයෙකුගේ කාර්යසාධනය වාරයෙන් වාරයට හෝ අදියරෙන් අදියර වාර්තා කිරීමේදී, ශිෂ්‍යයා යම් විෂයයකින් ලබා ඇති සම්භාර ගණනින් ඉගෙනුම් පරිමාව දැක්වේ (උදා: සම්භාර 3ක් මගින් ඉගෙනුම් පැය 30ක් පෙන්නුම් කරයි).

☛ **සම්භවන ඇගයීමට වැඩි බරක්.**

සාම්ප්‍රදායිකව සිසුන්ගේ අධ්‍යයන නිපැයුම ලෙස සලකනු ලබන සාධකයන්ට (සාමාන්‍යයෙන් සම්පිණ්ඩන ඇගයීම් විභාගයකින් පසුව ලබා ගන්නා ශ්‍රේණියකට) වඩා ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි ගුරු සහ ශිෂ්‍ය යන දෙපාර්ශවයේම වැඩි අවධානයක් යොමු කිරීමට සම්භවන ඇගයීම් ශක්තිමත් කිරීම හේතු වේ. මීට අමතරව, සම්භවන ඇගයීම/ තක්සේරුකරණය මඟින් සිසුන්ට අඛණ්ඩව ප්‍රතිපෝෂණ ලබා දීමට අවස්ථා සලසා දෙන අතර එමඟින් පුද්ගලාරෝපිත ඉගෙනීමක් සිදු කිරීමට හැකියාව ලැබේ. මේ නිසා, සෑම සිසුවෙකුටම අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් ප්‍රතිඵල ළඟා කර ගැනීමට අවස්ථාව සැලසේ. නව ප්‍රතිසංස්කරණ මඟින් විෂයමාලා සහ ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධන ක්‍රියාවලියේදී සම්භවන ඇගයීම/ තක්සේරුකරණය සඳහා වැඩි බරක් ලබා දී ඇත්තේ මේ අනුවය. නව ප්‍රතිසංස්කරණ යටතේ, සෑම පැය 10 ක ඉගෙනුම් ඒකකයක් සඳහාම සම්භවන ඇගයීම් සඳහා 70% ක බරක් ද, ඉතිරි (30%) ඒකක අවසාන සම්පිණ්ඩිත ඇගයීම් සඳහා ද ලබා දෙනු ඇත. මෙය ශිෂ්‍යයා අපේක්ෂිත කාර්ය සාධන මට්ටමට පැමිණ ඇති බව සහතික කිරීම පිණිස සිදු කරනු ලැබේ.

සම්භවන ඇගයීම් සිසුන්ගේ අකාර්යක්ෂම සහභාගීත්වය සහ කටපාඩම් කිරීම මත පමණක් රඳා පවතින සම්පිණ්ඩිත විභාගවල අධික න්‍යායාත්මක බව වැනි ගැටලු අඛණ්ඩව නිරීක්ෂණය කිරීමට සහ ඒවා විසඳීමට ඉඩ සලසන හෙයින් ඒවා ප්‍රයෝජනවත් බව ලොව පුරා බහුලව පිළිගැනේ. සම්භවන තක්සේරුකරණය මඟින් සහයෝගී ඉගෙනීම, විවේචනාත්මක සාකච්ඡා සහ අගයන් අභ්‍යන්තරීකරණය දිරිමත් කරනු ලබයි.

☛ **9 ශ්‍රේණිය අවසානයේදී ජාතික නිපුණතා තක්සේරුකරණයක් පැවැත්වීම**

නව ප්‍රතිසංස්කරණ මඟින් කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සනිටුහන් කරමින් 9 ශ්‍රේණිය අවසානයේදී ජාතික නිපුණතා ඇගයීමක් පැවැත්වීමට නිර්දේශ කරනු ලැබේ. යෝජිත ජාතික නිපුණතා තක්සේරුකරණය සිසුන් සිය ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සඳහා ඉදිරියට යාමට ඇති සූදානම ඇගයීම අරමුණු කර ගනී. එය සිසුන්ගේ ස්වභාවික නැඹුරුවාවන් මෙන්ම ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සඳහා ඇති විය හැකි වැඩිදුර මාර්ග පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ඇත. ජාතික නිපුණතා තක්සේරුකරණය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ: අ) සාක්ෂරතා සහ ගණිත තක්සේරුකරණය ක් සහ ආ) වෘත්තීය රුචිකත්ව පරීක්ෂණයක්. සාක්ෂරතාවය සහ ගණිතමය හැකියාව විධිමත් තක්සේරුකරණයක් මඟින් පරීක්ෂා කරනු ලබන අතර, වෘත්තීය රුචිකත්ව පරීක්ෂණය අවශ්‍ය නම් මාර්ගගත නොවන විකල්පයක් (offline option) සමඟ මාර්ගගතව (online) සිදු කිරීමට පහසුකම් සලසනු ඇත.

☛ **ශිෂ්‍ය කාර්යසාධනය ඉගෙනීම ප්‍රදර්ශනය කිරීම සඳහා වාර්තා කිරීම**

අධ්‍යාපනයේ නිශ්චිත අවධියකදී සිසුන්ගේ ඉගෙනීම ප්‍රදර්ශනය කිරීම සඳහා වලංගු හා විශ්වාසනීය ආකාරයකින් ශිෂ්‍ය කාර්යසාධනය වාර්තා කිරීම සිසුන්ට මෙන්ම පද්ධතියට ද වැදගත් වේ. එවැනි පුළුල් වාර්තාකරණ පද්ධතියක් අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය පෙන්නුම් කරනවා පමණක් නොව, තීරණ ගැනීම සහ පද්ධතියේ අඩුපාඩු තක්සේරු කිරීම සඳහා ද උපකාරී වේ. ශිෂ්‍යයෙකු ඉගෙන ගෙන ඇති දේ සහ ඉගෙනීමේ ප්‍රමාණය පෙන්වන සවිස්තරාත්මක, අර්ථවත්, වලංගු සහ විශ්වාසනීය වාර්තාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීම පරිවර්තනයේ ප්‍රධාන අංගයක් ලෙස ඉදිරිපත් කරනු ලබන්නේ මේ සන්දර්භය තුළ ය.

ඉහත සඳහන් කළ පරිදි, ශිෂ්‍ය කාර්යසාධනය ඇගයීම සඳහා සම්භවන සහ සම්පිණ්ඩන ඇගයීම් සංකලනයක් භාවිතා කරනු ඇත. සම්භවන ඇගයීම සඳහා 70% ක බරක් ලබා දෙන අතර, ඉතිරි (30%) ඒකක අවසාන සම්පිණ්ඩන ඇගයීම සඳහා ලබා දෙනු ඇත.

යෝජිත පරිවර්තනයේ වැදගත් අංගයක් වන්නේ ශිෂ්‍ය ප්‍රගතිය එක් එක් මොඩියුලය සහ විෂය සඳහා ශ්‍රේණි ලක්ෂ්‍ය අගයක් (GPV) ලෙස වාර්තා කිරීමයි. මෙය සිසුන්ට, දෙමාපියන්ට සහ ගුරුවරුන්ට ජයග්‍රහණ නිරීක්ෂණය කිරීමට සහ ඕනෑම ඉගෙනුම් පරතරයක් කඩිනමින් විසඳීමට ඉඩ සලසයි. එක් එක් විෂය සඳහා වන ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය (GPA) එම විෂයෙහි එක් එක් මොඩියුලය සඳහා ලබා ගත් ශ්‍රේණි ලක්ෂ්‍ය අගය (GPV) මත පදනම්ව ගණනය කරනු ලබන අතර, සියලු විෂයයන් හරහා බර තබන ලද සාමාන්‍යය ශිෂ්‍යයාගේ සමස්ත GPA වනු ඇත.

☛ **සම්මිශ්‍රිත ඉගෙනුම**

යෝජිත ප්‍රතිසංස්කරණ මඟින් ඉගැන්වීම් සහ ඉගෙනීම් කටයුතු සඳහා සාම්ප්‍රදායික පන්ති කාමර පරිසරය සමඟ අත්වැල් බැඳගෙන මාර්ගගත වේදිකා (online platforms) භාවිතය දිරිමත් කරනු ලැබේ. අන්තර්ජාල සම්බන්ධතාවය තවමත් ගැටලුවක් වන ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ, ආරම්භයේදී ඉගෙනුම් ක්‍රියාවලිය සැලසුම් කළ යුත්තේ සමාජ ආර්ථික පසුබිම සහ සම්පත් ලබා ගැනීමේ හැකියාව නොසලකා සෑම සිසුවෙකුටම හොඳම, වඩාත්ම

ප්‍රායෝගික සහ සියල්ල ඇතුළත් වන ආකාරයෙන් ඉගෙනුම් අත්දැකීම් ලැබෙන පරිදිය. දිවයින පුරා අන්තර්ජාල පහසුකම් සඳහා ප්‍රවේශය පුළුල් කිරීම මඟින් සබැඳි සම්පත් ක්‍රමානුකූලව වැඩි කිරීමට පහසුකම් සැලසීමට රජය පියවර ගනු ඇත.

☛ **ශිෂ්‍යයින්ට ඔවුන්ගේ වැඩිදුර අධ්‍යාපන මාර්ග (විද්‍යාර්ථී හෝ නිපුණතා මාර්ග) තෝරා ගැනීමට මඟ පෙන්වීම සඳහා විශේෂිත ඉගෙනුම් ඒකක.**

ශිෂ්‍යයින් තම හැකියාවන් හා රුචිකත්වයන් පිළිබඳ පැහැදිලි අවබෝධයකින් යුතුව තම ඉදිරි අධ්‍යාපන මාර්ග තෝරා ගන්නා විට මානව ප්‍රාග්ධන සංවර්ධන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා ඵලදායී වේ. එබැවින්, සිසුන්ට ඔවුන්ගේ ඉදිරි අධ්‍යාපන මාර්ග තෝරා ගැනීමට උපකාර කිරීම සඳහා කුඩා අවධියේ සිටම විශේෂිත ඉගෙනුම් ඒකක හඳුන්වා දෙනු ලැබේ. මෙම විශේෂිත ඉගෙනුම් ඒකක මඟින් සිසුන්ට විෂයමාලාව තුළ අත්‍යවශ්‍ය සෙසු විෂයයන් සඳහා අපේක්ෂිත අන්තර්ගතය ඉගෙන ගන්නා අතරතුර, ඔවුන් වඩාත් දක්ෂ හෝ උනන්දුවක් දක්වන විශේෂිත විෂය පිළිබඳ වැඩිදුර පුහුණුවක් ලබා ගැනීමට හැකි වේ. කනිෂ්ඨ ද්විතීයික මට්ටමේදී, නව විෂයමාලාව මඟින් පාසල් වාරය අවසානයේදී යම් විෂයයක් සඳහා විශේෂ දක්ෂතාවක් හෝ විශේෂ උනන්දුවක් දක්වන සිසුන් සඳහා වැඩිදුර ඉගෙනුම් ඒකක ලෙස විශේෂීකරණ ඒකක පිරිනමනු ලැබේ.

☛ **කලාපීය අවශ්‍යතා සහ විශේෂීකරණය ආමන්ත්‍රණය කරන තාක්ෂණික මොඩියුල**

විශේෂයෙන්ම දිවයිනේ විවිධ පළාත්වලට ආවේණික විශේෂිත දැනුම හා කුසලතා (උදා: රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් කර්මාන්තය) සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාව මඟින් ආමන්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය වේ. එසේ කිරීමෙන් සිසුන් රැකියා ලෝකයට සූදානම් වන අතර, රට පුරා ව්‍යාප්ත වී ඇති කලාපීය සම්පත් හා විශේෂඥ දැනුම උපයෝගී කර ගනිමින් රටේ ආර්ථික සංවර්ධනය ඉහළ නැංවෙනු ඇත.

☛ **නවෝත්පාදන විද්‍යාගාර හඳුන්වා දීම**

STEM/STEAM-අධ්‍යාපනයට අදාළ ප්‍රායෝගික අංශ පිළිබඳ ඍජු අත්දැකීම් ලබා ගැනීම සඳහා සිසුන් වෙනුවෙන් නවෝත්පාදන විද්‍යාගාර ගොඩනඟනු ඇත. මේවා අනාගත නවෝත්පාදකයින්ට පර්යේෂණ හා නවෝත්පාදන කටයුතුවල නිරත වීමට මූලික අත්දැකීම් ලැබෙන තෝතැන්නක් විය යුතුය.

☛ **ප්‍රාථමික අධ්‍යාපනයට මාරුවීමේ මාධ්‍යයක් ලෙස මුල් ළමාවිය අධ්‍යාපනය ශක්තිමත් කිරීම.**

දරුවෙකුගේ නිවසේ පරිසරයේ සිට විධිමත් පාසල් අධ්‍යාපනය දක්වා සුමට සංක්‍රමණයක් සහතික කිරීම, සාමාන්‍ය අධ්‍යාපනයේ හොඳම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. මේ අනුව, දරුවන්ගේ සමාජ හා චිත්තවේගීය කුසලතා වර්ධනය කිරීම සඳහා ඵලදායී මුල් ළමාවිය අධ්‍යාපන (ECE) පද්ධතියක් ස්ථාපිත කිරීම යෝජිත අධ්‍යාපන පරිවර්තනයේ ප්‍රධාන අංගයක් වනු ඇත.

## 2.1.6 *අධ්‍යාපනයේ අවධීන්*

2.1 වගුව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා යෝජිත අධ්‍යාපන අවධි පහ ඉදිරිපත් කරයි.

2.1 වගුව සාමාන්‍ය අධ්‍යාපනයේ අවධීන්

| **අවධිය** | **කාල පරිච්ඡේදය** | **අරමුණ** | **ශ්‍රේණි** | **ISCED** |
|---|---|---|---|---|
| මුල් ළමාවිය අධ්‍යාපනය | | යාවජීව අධ්‍යාපනය සඳහා පදනම | - | 0 |
| ප්‍රාථමික අධ්‍යාපනය | අවුරුදු 5 | මූලික ජීවන කුසලතා සඳහා අධ්‍යාපනය | 1-5 | 1 |
| කණිෂ්ට ද්විතීයික අධ්‍යාපනය | අවුරුදු 4 | ජීවිතය සඳහා අධ්‍යාපනය | 6-9 | 2 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය - 1වන අදියර | අවුරුදු 2 | රැකියා සූදානම සඳහා පදනම | 10-11 | 3 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය - 2වන අදියර | අවුරුදු 2 | ශාස්ත්‍රීය හා වෘත්තීය ජීවිතය සඳහා පදනම | 12-13 | 3 |

## 2.1.7 *මුල් ළමාවිය අධ්‍යාපනය*

**අරමුණ: යාවජීව ඉගෙනුම සඳහා පදනම**

මුල් ළමාවිය අධ්‍යාපනය යනු රටක අධ්‍යාපන පද්ධතියේ වඩාත් වැදගත් අධ්‍යාපන අවධියයි. ශ්‍රී ලංකාවේ, මුල් ළමාවිය අධ්‍යාපනය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ විමධ්‍යගත වූ විෂයයකි. එබැවින්, මුල් ළමාවිය අධ්‍යාපනයෙහි වගකීම් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අදාළ පළාත් අමාත්‍යාංශ අතර බෙදී යයි. මේ අනුව, ජාතික අධ්‍යාපන ආයතනය මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා ජාතික විෂයමාලා රාමුවක් සංවර්ධනය කිරීම මගින් ප්‍රමිති නියම කිරීමට වගකිව යුතු අතර, මෙම සියලු ආයතන ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය අධ්‍යාපනය නියාමනය කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කරයි.

## 2.1.8 *ප්‍රාථමික අධ්‍යාපනය (1 – 5 ශ්‍රේණිය)*

**අරමුණ: මූලික ජීවන කුසලතා සඳහා අධ්‍යාපනය**

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන (PE) ක්‍රියාවලිය, තිරසර සංවර්ධන ඉලක්කවල 4.1 ඉලක්කය වන "සියලු දෙනාටම ගුණාත්මක ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයක් සහතික කිරීම" සාක්ෂාත් කර ගැනීම සඳහා රටේ කැපවීම පෙන්නුම් කරයි. විධිමත් පාසල් පද්ධතිය විසින් පිරිනමනු ලබන ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව පළමු ශ්‍රේණියෙන් ආරම්භ වන අතර, ගෝලීය වශයෙන් පිළිගත් ළමා සංවර්ධන පිළිවෙත් මත පදනම්ව 1999 සිට අඛණ්ඩව පැවත එන තෙමට්ටු ප්‍රධාන අදියර ව්‍යුහය රඳවා ගනිමින් වසර පහක් පුරා විහිදේ.

- පළමුවන ප්‍රධාන අවධිය – 1 සහ 2 ශ්‍රේණි
- දෙවන ප්‍රධාන අවධිය – 3 සහ 4 ශ්‍රේණි
- තෙවන ප්‍රධාන අවධිය – 5 ශ්‍රේණිය

ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත් වන සමස්ත සිසුන් කණ්ඩායම දශක තුනකට අධික කාලයක් ද්විතීයික අධ්‍යාපනය දක්වා අඛණ්ඩව අධ්‍යාපනය ලබා ඇති බැවින්, ශ්‍රී ලංකාව ප්‍රාථමික අධ්‍යාපනයේ ඉහළ සම්පූර්ණ කිරීමේ අනුපාතයන් පෙන්නුම් කර ඇත. මෙම ශක්තිමත් තත්ත්වය මත පදනම්ව, ද්විතීයික අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය මූලික කුසලතා ලබා දෙන බව ප්‍රාථමික අධ්‍යාපන පද්ධතිය සහතික කළ යුතුය. අනාගතයේ අවිනිශ්චිතතා සහ සංකීර්ණතා වලට මුහුණ දීමට අවශ්‍ය මූලික නිපුණතාවල ස්ථිර පදනමක් සිසුන්ට ලබා දෙන්නේ මෙම කාලය තුළදීය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාථමික අධ්‍යාපනයේ අවධාරණය වන්නේ "මූලික ජීවන කුසලතා සඳහා අධ්‍යාපනය" යන්නයි. ප්‍රාථමික අධ්‍යාපන අවධියේදී, සාක්ෂරතාවය, ගණිතමය දැනුම, සන්නිවේදනය, මූලික විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත දැනුවත්භාවය හා කුසලතා, ජීවිතය අගය කිරීම, සෞන්දර්යාත්මක කුසලතා තුළින් නිර්මාණශීලීත්වය, ආගම හා සාරධර්ම අධ්‍යාපනය, සෞඛ්‍යය, පෝෂණය

හා ශාරීරික පුහුණුව, මූලික ජීවන කුසලතා, මූලික මූලා සාක්ෂරතාවය වැනි ක්ෂේත්‍ර ගණනාවකට සිසුන් නිරාවරණය වේ.

නව ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් ලෙස විෂයමාලාව ක්‍රියාත්මක කිරීම ගැටළු විසඳීමේ ඉගැන්වීම් ප්‍රවේශයක් තුළින් ලබා දෙනු ඇත. එය ප්‍රතිඵල සහ ක්‍රියාකාරකම් මත පදනම් වූවක් ද වේ. 1998 සහ 2007 විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රවර්ධනය කරන ලද, නිර්දේශ කරන ලද සහ අඛණ්ඩව පවත්වාගෙන යන ලද "වැඩි ක්‍රියාකාරකම් සහ අඩු මේස වැඩ" සංකල්පය ඉදිරි විෂයමාලාවේදී දැඩි ලෙස ක්‍රියාත්මක කරනු ඇත. පෙළපොත් වෙනුවට ක්‍රියාකාරකම් මත පදනම් වූ ඒකාබද්ධ විෂයමාලාවක් භාවිතා කරනු ඇත.

ප්‍රාථමික අධ්‍යාපන අවධිය සම්පූර්ණ කිරීමෙන් පසු, ශිෂ්‍යයා පහත සඳහන් දේ වර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ:

- තම ආසන්න නිවෙස් ප්‍රජාව පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය, ක්‍රමයෙන් ජාතික හා ගෝලීය සන්දර්භයන් සහ ඒවාට මුහුණ දෙන පද්ධතිමය අභියෝග අවබෝධ කර ගැනීම දක්වා.
- සංස්කෘතික, සමාජීය, භෞතික, ජීව විද්‍යාත්මක, පාරිසරික, පාරිසරික හා භූගෝලීය විවිධත්වය අවබෝධ කර ගැනීම.
- ජීවිතයට ශිෂ්‍යයා සූදානම් කිරීමට අවශ්‍ය සාක්ෂරතාවය, ගණිතමය දැනුම සහ සමාජ, සංස්කෘතික හා චිත්තවේගීය කුසලතා.
- නිරෝගී ජීවිතයක්, චරිතය සහ පුරවැසිභාවය හා සම්බන්ධ මූලික ජීවන කුසලතා සහ 21 වන සියවසට සූදානම් පුරවැසියෙකු නිර්මාණය කිරීමට උපකාරී වන මූලික මූල්‍ය සාක්ෂරතාවය අවබෝධ කර ගැනීම.
- සංවේදනය සහ අනෙකුත් සමාජ-චිත්තවේගීය කුසලතා සහ බහුවිධ බුද්ධිමට්ටම් වලින් පොහොසත් සමබර පෞරුෂයක් සඳහා අඩිතාලම..

**ප්‍රාථමික අධ්‍යාපනයේ ඇතුළත් ඉගෙනුම් ක්ෂේත්‍ර:**

1. මව් භාෂාව
2. ඉංග්‍රීසි භාෂාව
3. දෙවන ජාතික භාෂාව
4. ගණිතය
5. මූලික විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
6. ආගමික සහ සාරධර්ම අධ්‍යාපනය
7. සෞන්දර්ය අධ්‍යාපනය
8. සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය
9. විෂය සමගාමී ක්‍රියාකාරකම්

**කාලය වෙන්කිරීම**

ප්‍රාථමික අධ්‍යාපන අවධිවල විවිධ ඉගෙනුම් ක්ෂේත්‍ර සඳහා සතිපතා කාල වෙන් කිරීම් 2.2 වගුවේ දක්වා ඇත..

**2.2 වගුව: ප්‍රාථමික අධ්‍යාපන අවධියේ (*1-5 ශ්‍රේණි*)**

**ඉගෙනුම් ක්ෂේත්‍ර සඳහා කාල වෙන් කිරීම (*යෝජිත*)**

| ඉගෙනුම් ක්ෂේත්‍රය | සතියකට කාලය (පැය) | | |
|---|---|---|---|
| | පළමුවන ප්‍රධාන අවධිය | දෙවන ප්‍රධාන අවධිය | තෙවන ප්‍රධාන අවධිය |
| මව් භාෂාව | 5.00 | 5.00 | 5.00 |
| ඉංග්‍රීසි භාෂාව | 0.50 | 3.00 | 3.30 |
| දෙවන ජාතික භාෂාව | 0.30 | 1.00 | 1.00 |
| ගණිතය | 3.30 | 5.00 | 5.00 |
| ආගමික සහ සාරධර්ම අධ්‍යාපනය | 1.30 | 2.00 | 2.00 |
| මූලික විද්‍යාව සහ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | 5.00 | 5.00 | 7.00 |
| සෞන්දර්ය අධ්‍යාපනය | 1.00 | 1.00 | 1.00 |

| ඉගෙනුම් ක්ෂේත්‍රය | සතියකට කාලය (පැය) | | |
|---|---|---|---|
| | පළමුවන ප්‍රධාන අවධිය | දෙවන ප්‍රධාන අවධිය | තෙවන ප්‍රධාන අවධිය |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 2.05 | 2.05 | 2.05 |
| විෂය සමගාමී ක්‍රියාකාරකම්, රැස්වීම සහ විවේක කාලය | 4.20 | 3.25 | 3.25 |
| **එකතුව** | **23.45** | **27.30** | **30.00** |

## 2.1.9 *කණිෂ්ඨ ද්විතීයික අවධිය (6-9 ශ්‍රේණි)*

**අරමුණ: ජීවිතය සඳහා පදනම**

ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතියේ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන විෂයමාලාව, අනිවාර්ය කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා මග පාදන අතර, ජීවිතය සඳහා පදනම සකස් කිරීමේ ප්‍රධාන අරමුණින් නිර්මාණය කර ඇත. සිව් අවුරුදු අධ්‍යයන පාඨමාලාව වේගයෙන් වෙනස් වන ජීවිතයක අභියෝගවලට සහ අනපේක්ෂිත අනාගතයකට මුහුණ දීමට අවශ්‍ය කුසලතා ඉගෙන ගන්නන්ට ලබා දීම සඳහා නිර්මාණය කර ඇත.

මෙම අදියරේදී අත්‍යවශ්‍ය විෂය දහහතරක් පිරිනමනු ලැබේ. මෙම අදියර සඳහා අදහස් කරන ඉගෙනුම් අත්දැකීම් කාණ්ඩ තුනක් යටතේ සංවිධානය කෙරේ: අත්‍යවශ්‍ය ඉගෙනුම්, තවදුරටත් ඉගෙනුම් සහ පරිවර්තනීයකුසලතා. විෂයමාලා සහ ඉගැන්වීම් ද්‍රව්‍ය සංවර්ධනය කිරීමේදී, අත්‍යවශ්‍ය ඉගෙනුම් යන්නෙන් අදහස් කරන්නේ මෙම අදියරේදී සෑම ශිෂ්‍යයෙකුම ඉගෙන ගැනීමට අපේක්ෂා කරන විෂය කරුණු වන අතර, තවදුරටත් ඉගෙනුම් යන්නෙන් අදහස් කරන්නේ යම් විෂයයක් තුළ තවදුරටත් අධ්‍යාපනය හැදෑරීමට සිසුවා කැමති නම් ඔහු/ඇය ඉගෙන ගත යුතු අතිරේක විෂය කරුණු ය. මීට අමතරව, පරිවර්තනීයකුසලතා සංවර්ධනය කිරීම අරමුණු කරගත් මොඩියුල මගින් ඉගෙන ගන්නන්ට ඔවුන්ගේ සමාජ-චිත්තවේගීය කුසලතා, නායකත්වය, කණ්ඩායම් ගොඩනැගීම සහ සන්නිවේදන කුසලතා මෙන්ම ඔවුන් ඉගෙන ගන්නා විෂය කරුණු සැබෑ ජීවිත අවස්ථාවන්ට යෙදවීමේ හැකියාව වැඩි දියුණු කරන ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථා සලසා දෙනු ඇත.

පෙර සඳහන් කළ පරිදි, මෙම අදියරේදී, සිසුන් නිරත විය යුතු ඉගෙනුම් පරිමාව පිළිබිඹු කරන සම්භාර ක්‍රමයක් මත පදනම්ව විෂයමාලාව සංවිධානය කර ඇත. විෂයමාලාව සහ ඉගැන්වීම් ද්‍රව්‍ය පැය 10 ක ඉගෙනුම් ඒකකවලට බෙදා ඇති අතර, එක් එක් ඉගෙනුම් ඒකකය එක් පාසල් සම්භාරයකට අනුරූප වේ. මෙම පාසල් සම්භාර ක්‍රමය, සම්මත විද්‍යාල සම්භාර ක්‍රමයට සැසඳිය නොහැකි වුවද, ශිෂ්‍යයෙකු ලබා ගන්නා ඉගෙනුම් පරිමාව පෙන්නුම් කරන අතර, එමගින් වාර්තාකරණ ක්‍රියාවලිය අර්ථවත් කරයි. ඒ අනුව, උදාහරණයක් ලෙස, ශිෂ්‍යයෙකුගේ පැතිකඩ වාර්තා කරන්නේ ඔහු/ඇය අධ්‍යයන වර්ෂයක් (ශ්‍රේණියක්) තුළ යම් විෂයයක් සඳහා සම්භාර 9 ක් ලබාගෙන ඇති බව නම්, එයින් අදහස් වන්නේ ඔහු/ඇය එම විෂයය සඳහා පැය 90 ක ඉගෙනුමක් ලබා ඇති බවයි. එවැනි අර්ථවත් වාර්තාකරණයක් සිසුන්ට, ගුරුවරුන්ට, දෙමාපියන්ට සහ අධ්‍යාපන කළමනාකරුවන්ට සිසුන් නිවැරදිව ස්ථානගත කිරීමට උපකාරී වනු ඇත, උදාහරණයක් ලෙස, ඔවුන් වෙනත් පාසලකට (රට තුළ සහ විදේශයන්හි) ඇතුළත් වීම සඳහා අයදුම් කරන විට.

මෙම අදියරේදී, ශිෂ්‍යයෙකු පාසල් වාරයක් තුළ උපරිම පැය 350 ක කාලයක් ඉගෙනීමේ නිරත වීමට අපේක්ෂා කරන අතර, එය වාරයක් තුළ උපරිම ණය 35 කට සමාන වේ.

**ඉගෙනුම් ක්ෂේත්‍ර**

කනිෂ්ඨ ද්විතීයික අවධියේ විෂයමාලාව තුළ විෂය ව්‍යාප්තිය 2.3 වගුවේ දක්වා ඇත.

**2.3** වගුව: කනිෂ්ඨ ද්විතීයික අවධිය සඳහා විෂයයන් සහ මොඩියුල (*6-9 ශ්‍රේණි*)

| අත්‍යවශ්‍ය විෂය | සම්භාර | වැඩිදුර ඉගෙනුම් මොඩියුල | පරිවර්තනීය කුසලතා මොඩියුල |
|---|---|---|---|
| 1. මව් භාෂාව හා සාහිත්‍යය (සිංහල/දෙමළ) | 3 | ශිෂ්‍යයා වැඩිදුර ඉගෙනුම් මොඩියුල **තුනක්** තෝරා ගත | ශිෂ්‍යයා මොඩියුල **දෙකක්** තෝරා ගත යුතුය. එක් |

| අත්‍යවශ්‍ය විෂය | සම්භාර | වැඩිදුර ඉගෙනුම් මොඩියුල | පරිවර්තනීය කුසලතා මොඩියුල |
|---|---|---|---|
| 2. ඉංග්‍රීසි භාෂාව | 3 | යුතුය. එක් එක් මොඩියුලය සඳහා **සම්භාර එකක්** බැගින් වේ. | මොඩියුලයකට එක් සම්භාරයක් ලෙස බර ලබා ඇත. |
| 3. දෙවන ජාතික භාෂාව | 1 | | |
| 4. ගණිතය | 3 | | |
| 5. විද්‍යාව | 3 | | 1. සාහිත්‍යය රසවින්දනය<br>2. මාධ්‍ය අධ්‍යයනය (8 ශ්‍රේණියේ සිට)<br>3. ආයතනගත පුහුණුව (8 ශ්‍රේණියේ සිට)<br>4. සේවා අංශ අධ්‍යයනය (8 ශ්‍රේණියේ සිට)<br>5. ගෝලීය අධ්‍යයනය<br>6. සමාජ සේවා<br>7. සෞඛ්‍යය සහ ක්‍රීඩා (8 ශ්‍රේණියේ සිට)<br>8. සෞන්දර්යය රසවින්දනය (8 ශ්‍රේණියේ සිට)<br>9. වෘත්තීය සූදානම සඳහා පදනම |
| 6. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය | 2 | සිසුන්ගේ උනන්දුව, යෝග්‍යතාව සහ අනාගත අභිලාෂයන් මත පදනම්ව අත්‍යවශ්‍ය විෂයයන්ගෙන් ඕනෑම විෂයයක වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරා ගත හැකිය. | |
| 7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 2 | | |
| 8. ජීවිතය සඳහා තාක්ෂණය | 2 | | |
| 9. භූගෝලය | 1 | | |
| 10. ඉතිහාසය | 2 | | |
| 11. පුරවැසි අධ්‍යාපනය | 1 | | |
| 12. ආගමික හා සාරධර්ම අධ්‍යාපනය * | 2 | | |
| 13. සෞන්දර්ය අධ්‍යාපනය | 2 | | |
| 14. ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව | 1 | | |
| 15. ක්‍රීඩා, පුස්තකාල, සංගම්, සමාජ (සහභාගීත්වය පමණි) | 2 | | |
| **මුළු සම්භාර ගණන** | **30** | **3** | **2** |

* පහත සඳහන් ආගම් වෙන වෙනම උගන්වනු ලැබේ: බුද්ධාගම, හින්දු ආගම, ක්‍රිස්තියානි ආගම, ඉස්ලාම් ආගම, කතෝලික ධර්මය, ශෛව සිද්ධාන්තය.

**අත්‍යවශ්‍ය විෂය**

මෙම කාණ්ඩය යටතේ විෂය 15 ක් පිරිනමනු ලැබේ. මෙම කාණ්ඩය තුළ ඇති "ක්‍රීඩා, පුස්තකාල, සමාජ සහ සංගම්" විෂය යනු සිසුන්ට සහභාගීත්වය තුළින් වාරයකට සම්භාර ඒකක දෙකක් උපයා ගත හැකි විෂයයකි. සිසුන් මෙම කාණ්ඩය යටතේ උපයන සම්පූර්ණ සම්භාර ප්‍රමාණය 30 ක් වන අතර එය පැය 300 ක ඉගෙනීමට අනුරූප වේ.

**වැඩිදුර ඉගෙනුම් මොඩියුල**

සෑම විෂයයක් සඳහාම වාරයක් තුළ උපයා ගත යුතු අත්‍යවශ්‍ය සම්භාර ප්‍රමාණයක් තිබුණද, අනාගතයේදී එම විෂය තවදුරටත් ඉගෙනීමට කැමති සිසුන්ට සහාය වීම අරමුණු කරගත් තවදුරටත් ඉගෙනුම් මොඩියුලයක් එම විෂය තුළ පිරිනමනු ඇත. සිසුන්ට ඔවුන්ගේ උනන්දුව, යෝග්‍යතාවය සහ අනාගත අභිලාෂයන් මත පදනම්ව වාරයකට ඕනෑම මොඩියුල තුනක් තෝරා ගැනීමට නිදහස තිබේ. මෙම මොඩියුල තෝරා ගන්නා සිසුන්ට අදාළ විෂය පිළිබඳ වඩාත් පොහොසත් අවබෝධයක් ලබා දෙන අතර, එමගින් ඔවුන් තෝරාගත් විෂයයන් තවදුරටත් හැදෑරීමට ක්‍රමයෙන් සූදානම් කරයි. සිසුන්ට අවශ්‍ය නම් සෑම වාරයකදීම තමන් ඉගෙන ගන්නා විෂයයන් වෙනස් කිරීමට හැකියාව ඇත.

**පරිවර්තනීය කුසලතා මොඩියුලය**

මෙම කාණ්ඩය යටතේ පිරිනමන මොඩියුල සිසුන්ට ඔවුන්ගේ විචාරාත්මක චින්තනය, සන්නිවේදන කුසලතා, නිර්මාණශීලීත්වය, නායකත්වය, සමාජ-චිත්තවේගීය කුසලතා සහ අනෙකුත් අදාළ අංශ වැඩිදියුණු කිරීමට සහාය වේ. සිසුන් මෙම කාණ්ඩයෙන් සම්භාර දෙකක් පමණක් උපයා ගැනීමට අපේක්ෂා කරන බැවින්, කනිෂ්ඨ ද්විතීයික අවධිය අවසානයේදී ඔවුන් මනා පෞරුෂයකින් යුත් පුද්ගලයන් බවට පත්වීම සඳහා මෙම මොඩියුල කිහිපයක් හැදෑරීමට ඔවුන්ට අවස්ථාවක් තිබේ.

**තක්සේරුකරණය හා ඇගයීම**

**සම්භවනීය ඇගයීම/ තක්සේරුකරණය**

මොඩියුල පාදක ගුණාත්මක තක්සේරුව යනු පූර්ව-නිශ්චිත රූබ්‍රික් (rubrics) මත පදනම්ව පන්ති කාමර ගුරුවරුන් විසින් සිදු කරනු ලබන ක්‍රියාවලියකි.

#### සම්පිණ්ඩන ඇගයීම

සම්පිණ්ඩන තක්සේරුව මොඩියුලය තුළටම කාවැදී ඇති බැවින්, සිසුන්ට විභාග බරින් නිදහස ලැබේ, එබැවින් මෙම අදියරේදී නිශ්චිත වාර අවසාන විභාගයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් නොමැත.

#### කුසලතා ඇගයීම/ තක්සේරුකරණය

කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කරන සිසුන් 9 ශ්‍රේණිය අවසානයේදී නිපුණතා තක්සේරුවකට භාජනය වීමට අපේක්ෂා කෙරේ. ඉහත සාකච්ඡා කළ පරිදි, යෝජිත නිපුණතා තක්සේරුවේ අරමුණු වන්නේ අ) සාක්ෂරතා සහ ගණිතමය කුසලතා සහ ආ) යම් අධ්‍යයන ක්ෂේත්‍රයකට සම්බන්ධ වීමට ඇති වෘත්තීය උනන්දුව තීරණය කිරීමයි. සාක්ෂරතා සහ ගණිතමය තක්සේරුව මගින් සිසුන් උසස් අධ්‍යාපනය සහ පාසලෙන් පසු ජීවිතය සඳහා අත්‍යවශ්‍ය මූලික සාක්ෂරතා කුසලතා ලබාගෙන ඇත්දැයි තීරණය කිරීමට අපේක්ෂා කෙරේ. මෙයට ඔවුන්ගේ වයසට ගැළපෙන ශාස්ත්‍රීය සාක්ෂරතාවය, විද්‍යාත්මක සාක්ෂරතාවය, ගණිතමය සාක්ෂරතාවය, සන්නිවේදනය, විවේචනාත්මක චින්තනය ආදිය ඇතුළත් වේ. එවැනි තක්සේරුවක් මගින් සිසුන්ට කනිෂ්ඨ ද්විතීයික අවධියේ සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය දක්වා බාධාවකින් තොරව මාරු වීමට සහාය වීමට අපේක්ෂා කෙරේ.

විද්‍යාව, ගණිතය, සමාජ විද්‍යා, මානව ශාස්ත්‍ර හෝ තාක්ෂණික හෝ වෘත්තීය කුසලතා වැනි යම් අධ්‍යයන ක්ෂේත්‍රයක් කෙරෙහි සිසුන්ගේ නැඹුරුව/බහුවිධ නැඹුරුවීම් අවබෝධ කර ගැනීම සඳහා, 9 ශ්‍රේණිය අවසානයේදී ඉහත සඳහන් කළ වෘත්තීය උනන්දුව පිළිබඳ පරීක්ෂණයට ඔහු/ඇය භාජනය වීමට අපේක්ෂා කෙරේ. මෙම පරීක්ෂණය මාර්ගගතව සහ කඩදාසි මත පදනම් වූ ක්‍රම දෙකෙන්ම ලබා ගත හැකි අතර එමගින් සිසුන්ට ඔවුන් කැමති ක්‍රමය තෝරා ගත හැකිය. මෙම පරීක්ෂණය සිසුන් සඳහා උපකාරයක් පමණක් වන අතර සිසුන්ගේ අධ්‍යයන මාර්ගය තීරණය කිරීමට බලයක් නොමැත.

ඔවුන්ගේ කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමෙන් පසු සහ ඔවුන්ගේ සාක්ෂරතාවය, ගණිතමය කුසලතා සහ නැඹුරුව තක්සේරු කිරීමෙන් පසු, සිසුන් ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධියට පිවිසෙනු ඇත.

### 2.1.10 *ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය (10 සිට 13 ශ්‍රේණි)*

සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය 10 සිට 13 ශ්‍රේණි දක්වා වසර හතරක් පුරා විහිදේ. මෙම අවධියේදී, සිසුන්ට ඔවුන්ගේ මනාපයන් සහ කනිෂ්ඨ ද්විතීයික අවධියේ ඔවුන්ගේ කාර්ය සාධනය මත පදනම්ව තවදුරටත් අධ්‍යාපනය සඳහා විශේෂිත විෂය ධාරාවක් තෝරා ගැනීමට අවස්ථාව ලැබේ. විෂය ධාරා තෝරාගැනීමේදී වැඩි නම්‍යශීලී බවක් සහ තවදුරටත් අධ්‍යාපනයට සුමට සංක්‍රමණයක් සහතික කිරීම සඳහා මෙම අවධිය අදියර දෙකකට (**අදියර 1 සහ අදියර 2**) බෙදා ඇත.

#### ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - 1වන අදියර (10 හා 11 ශ්‍රේණි)

මෙම අදියරෙහි අරමුණ වන්නේ "තවදුරටත් අධ්‍යාපනය සහ වෘත්තීය සූදානම සඳහා අඩිතාලම" දැමීමයි, මන්ද එය තවදුරටත් අධ්‍යාපනය හෝ වෘත්තියක් සඳහා මූලික අදියරක් ලෙස සේවය කරයි.

#### ඉගෙනුම් ක්ෂේත්‍ර

මෙම අදියරෙහි ප්‍රධාන සංරචක තුනකි. එනම්, (i) හර විෂයමාලාව, (ii) වැඩිදුර ඉගෙනුම් විෂයමාලාව, සහ (iii) පරිවර්තනීය කුසලතා වශයෙනි. එය සමස්ත විෂයමාලා බරින් පිළිවෙලින් දළ වශයෙන් 50%, 40% සහ 10% ලෙස පිරිනමනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධියේ මෙම අදියර සැලසුම් කර ඇත්තේ, පොදු හර විෂයයන් පහක් සහ තෝරාගත හැකි විෂයයන් දෙකක් සඳහා සම්මත, ජාතික මට්ටමේ තක්සේරුවක් ඉලක්ක කරගත් සාමාන්‍ය පෙළ විභාගය, 11 ශ්‍රේණියේ 2 වන වාරය අවසානයේදී පැවැත්වෙන පරිදිය.

#### හර විෂයමාලාව

සිසුන් මෙම කාණ්ඩය යටතේ විෂයයන් පහක් හැදෑරීමට අපේක්ෂා කෙරේ. මෙම කාණ්ඩය සඳහා සිසුන්ට වාරයකට සම්භාර ඒකක 18 ක් උපයා ගත හැකි අතර, එය පැය 180 ක ඉගෙනීමට සමාන වේ. මෙය, වාර පහක් තුළ මෙම කාණ්ඩයෙන් උපයන මුළු සම්භාර ප්‍රමාණය 90 ක් (වාරයකට සම්භාර ඒකක 18 x වාර 5) වන අතර, මුළු ඉගෙනුම් පැය ගණන 900 ක් (ඉගෙනුම් පැය 180 x වාර 5) වනු ඇත.

මූලික විෂයමාලාව යටතේ, සිසුන් 2.4 වගුවේ 1 වන තීරුවේ දක්වා ඇති විෂයයන් අතරින් අනිවාර්ය විෂයයන් පහක් තෝරා ගනු ඇත. මීට අමතරව, සිසුන් 3

වන තීරුවෙන් විකල්ප විෂයයන් දෙකක් තෝරා ගනු ඇත.

**2.4 වගුව: ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධියේ - *1* වන අදියර (*10-11* ශ්‍රේණි) සඳහා හර විෂයමාලාව**

| අනිවාර්ය විෂය | සම්භාර | එක් එක් විෂය සඳහා සම්භාර ඒකක 2 බැගින් වන තෝරා ගත හැකි විකල්ප විෂයයන් විෂයයන් 2ක් තෝරන්න |
|---|---|---|
| 1. මව් භාෂාව සහ සාහිත්‍යය (සිංහල/ දෙමළ)<br>2. ඉංග්‍රීසි භාෂාව<br>3. ගණිතය<br>4. විද්‍යාව<br>5. ආගමික සහ සාරධර්ම අධ්‍යාපනය | 3<br>3<br>3<br>3<br>2 | 1. දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ)<br>2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT)<br>3. ඉතිහාසය<br>4. භූගෝල විද්‍යාව<br>5. පුරවැසි අධ්‍යාපනය<br>6. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය<br>7. සම්භාව්‍ය භාෂා (පාලි, සංස්කෘත)<br>8. විදේශ භාෂා (චීන, ප්‍රංශ, ජර්මන්, හින්දි, ජපන්, රුසියානු, කොරියානු, අරාබි)<br>9. සාහිත්‍යය රසවින්දනය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි/ අරාබි)<br>10. තාක්ෂණය (කෘෂිකාර්මික කළමනාකරණ තාක්ෂණය/ නිර්මාණකරණය හා ඉංජිනේරු තාක්ෂණය/ ආහාර හා පාරිභෝගික තාක්ෂණය/ නිර්මාණ හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණය/ ජලජ ජෛව සම්පත් තාක්ෂණය/ ජෛව පද්ධති තාක්ෂණය)<br>11. සෞන්දර්ය අධ්‍යාපනය (පෙරදිග/ බටහිර/ කර්ණාටක සංගීතය, නැටුම්, භරත නාට්‍යම්, චිත්‍ර, නාට්‍ය හා රංග කලාව)<br>12. ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව |
| **මුළු සම්භාර ගණන** | **14** | **4** |

**වැඩිදුර ඉගෙනුම් විෂයමාලාව (වාරයකට සම්භාර 14)**

මෙම කාණ්ඩය යටතේ මොඩියුල පරාසයක් පිරිනමනු ලබන අතර, ඒවා ප්‍රධාන මාර්ග දෙකක් යටතේ වර්ග කර ඇත: අධ්‍යයන සහ නිපුණතා. අධ්‍යයන මාර්ගය තවදුරටත් (i) විද්‍යාව හා තාක්ෂණය, (ii) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා, සහ (iii) කළමනාකරණය, ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර අධ්‍යයනය ලෙස උප කොටස් වලට බෙදා ඇත. නිපුණතා මාර්ගය (i) ඉදිකිරීම් හා යටිතල පහසුකම්, (ii) නිර්මාණාත්මක කර්මාන්ත, (iii) ප්‍රාථමික කර්මාන්ත, (iv) සමාජ හා ප්‍රජා සේවා, සහ (v) නිෂ්පාදන හා තාක්ෂණය (2.5 වගුව) වලින් සමන්විත වේ.

පළමු වාර පහ තුළ, සිසුන් තවදුරටත් ඉගෙනුම් විෂය හතක් හැදෑරීමට අපේක්ෂා කරන අතර, මෙම කාණ්ඩයේ විෂය අතුරින් වාරයකට සම්භාර 14 ක් උපයා ගනු ඇත, එය වාරයකට ඉගෙනුම් පැය 140 ක් වනු ඇත. මෙය, වාර පහක කාලය තුළ සම්භාර ඒකක 70 ක් (ඉගෙනුම් පැය 700 ක්) ලබා ගැනීමට මග පාදනු ඇත. සිසුන්ට ඔවුන් විකල්ප විෂයයන් ලෙස හැදෑරූ විෂයයන්ම තෝරා ගත නොහැක. 9 ශ්‍රේණිය අවසානයේදී නිපුණතා තක්සේරු ක්‍රියාවලියේ කොටසක් ලෙස පවත්වන ලද වෘත්තීය උනන්දුව පිළිබඳ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පදනම්ව විෂයයන් තෝරා ගැනීමට වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන විශේෂඥයින් විසින් සිසුන්ට මග පෙන්වනු ඇත. මෙම අදියරේදී, 12 ශ්‍රේණියේදී ඔවුන්ගේ විශේෂිත විෂය ධාරාව සම්බන්ධයෙන් දැනුවත් තීරණයක් ගැනීමට හැකි බව සහතික කිරීම සඳහා, ඔවුන්ගේ හැකියාව සහ උනන්දුව අනුව විෂය ධාරා හරහා විෂය තෝරා ගැනීමට සිසුන් දිරිමත් කරනු ලැබේ.

*2.5 වගුව: ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධියේ - 1 වන අදියර (10-11 ශ්‍රේණි) සඳහා වැඩිදුර ඉගෙනුම් මොඩියුල සඳහා වන විෂයය*

| මාර්ගය | විෂයධාරාව | යෝජිත විෂය | සම්භාර |
|---|---|---|---|
| ශාස්ත්‍රීය | විද්‍යාව හා තාක්ෂණය | 1. වැඩිදුර ගණිතය<br>2. ජීව විද්‍යාව<br>3. රසායන විද්‍යාව<br>4. භෞතික විද්‍යාව<br>5. සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය<br>6. පරිගණක විද්‍යාව<br>7. දත්ත විද්‍යාව<br>8. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය<br>9. කෘෂි විද්‍යාව<br>10. නිර්මාණ හා ඉංජිනේරු තාක්ෂණය<br>11. ආහාර හා පාරිභෝගික තාක්ෂණය<br>12. නිර්මාණ හා කලාත්මක නිෂ්පාදන තාක්ෂණය<br>13. ජලජ විද්‍යාව<br>14. ජෛව ඉංජිනේරු තාක්ෂණය<br>15. ගුවන් සේවා අධ්‍යයනය | එක් මොඩියුලයක් සඳහා සම්භාර 2කි. |
| | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | 1. භාෂාව සහ සාහිත්‍යය<br>2. මාධ්‍ය හා සන්නිවේදනය<br>3. විදේශ භාෂා (ජපන්, චීන, කොරියානු, හින්දි, ප්‍රංශ, ජර්මන්, රුසියානු, සහ අරාබි)<br>4. ශාස්ත්‍රීය භාෂා (පාලි සහ සංස්කෘත)<br>5. පුරවැසි අධ්‍යාපනය<br>6. ඉතිහාසය<br>7. භූගෝල විද්‍යාව<br>8. ආර්ථික විද්‍යාව<br>9. ගණිතය<br>10. තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක අධ්‍යයන<br>11. සෞන්දර්ය අධ්‍යාපනය (පෙරදිග සංගීතය, බටහිර සංගීතය, කර්ණාටක සංගීතය, නර්තනය - සිංහල, නර්තනය - භරත නාට්‍යම්, චිත්‍ර කලාව, නාට්‍ය හා රංග කලාව)<br>12. චිත්‍රපට අධ්‍යයන | |
| | කළමනාකරණය, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අධ්‍යයනය | 1. ගිණුම්කරණය<br>2. ව්‍යාපාර අධ්‍යයන<br>3. ව්‍යාපාර සංඛ්‍යානය<br>4. ආර්ථික විද්‍යාව<br>5. ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව<br>6. සැපයුම් දාම කළමනාකරණය<br>7. ගණිතය<br>8. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | |
| කුසලතා | වෘත්තීය අධ්‍යයනය | 1. දෘශ්‍ය හා කාර්මික කලා<br>2. රංග කලා හා මාධ්‍ය කලා<br>3. සත්කාරක හා පුද්ගල සේවා<br>4. සෞඛ්‍ය හා සමාජ සේවා<br>5. කෘෂිකර්මය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය<br>6. ලෝහ හා සැහැල්ලු ඉංජිනේරු විද්‍යාව<br>7. රෙදිපිළි හා ඇඟලුම් අධ්‍යයන<br>8. විදුලි හා ඉලෙක්ට්‍රොනික අධ්‍යයන<br>9. ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා<br>10. සැපයුම් හා සැපයුම් දාම කළමනාකරණය<br>11. මෝටර් රථ අධ්‍යයන<br>12. ඩිජිටල් හා ව්‍යවසාය කුසලතා | |

**පරිවර්තනීය කුසලතා (වාරයකට සම්භාර 3 බැගින්)**

මෙම කොටසට ඇතුළත් වන මොඩියුල මගින් සිසුන්ගේ සමස්ත සංවර්ධනය සහ රැකියා සඳහා මෙන්ම ජීවිතයට අවශ්‍ය කුසලතා අත්පත්කර ගත හැකි සාරවත් භූමියක් සපයා දෙන බවට සනාථ කිරීම අපේක්ෂා කෙරේ. තව ද, මෙම කාණ්ඩයට ඇතුළත් වන මොඩියුල කනිෂ්ඨ ද්විතීයික අවධියේ සිටම අඛණ්ඩව ඉදිරියට සිදුකර ගෙන යන බැවින්, සිසුන්ට පාසල් කාලය තුළ තෘප්තිමත් ඉගෙනුම් අත්දැකීමක් ලබා ගැනීම සඳහා මෙම කාණ්ඩයෙන් හැකි තරම් මොඩියුල ප්‍රමාණයක් අත්හදා බැලීමට අවස්ථාව ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2.6 වගුව මගින් පරිවර්තනීය කුසලතා මොඩියුල දැක්වේ.

**2.6 වගුව ජොෂ්ය ද්විතීයික අවධිය - පළමු අදියර (10-11 ශ්‍රේණි) සඳහා තීර්යක් කුසලතා මොඩියුල**

| **මොඩියුල**<br>(ක්‍රීඩා, සමාජ සහ සංගම් ඇතුළුව මොඩියුල 3ක් තෝරන්න) | | **සම්භාර** |
|---|---|---|
| 1. මාධ්‍ය අධ්‍යයනය<br>2. ආයතනගත පුහුණුව<br>3. සේවා අංශ අධ්‍යයනය<br>4. ගෝලීය අධ්‍යයනය<br>5. සමාජ සේවා<br>6. සෞඛ්‍ය හා ක්‍රීඩා<br>7. සෞන්දර්ය රසවින්දනය | 8. චිත්‍රපට රසවින්දනය<br>9. වෘත්තීය සූදානම සඳහා පදනම<br>10. ඩිජිටල් පුරවැසිභාවය<br>11. ක්‍රීඩා, සමාජ සහ සංගම් | එක් මොඩියුලයක් සඳහා සම්භාර 1 බැගින් |

*අනිවාර්ය මොඩියුල

**2.7** වගුව ජ්‍යෙෂ්ඨ ද්විතීයික අවධිය - පළමු අදියර (10-11 ශ්‍රේණි) හි වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරාගැනීම සඳහා වන කොන්දේසි

| **අනිවාර්ය සම්භාර 14** | **තේරීම් සම්භාර 4** | **වැඩිදුර ඉගෙනුම් මොඩියුල සම්භාර 14** | **පරිවර්තනීය කුසලතා මොඩියුල සම්භාර 3** |
|---|---|---|---|
| විෂය 5කි | තෝරාගත හැකි විෂය අතුරින් විෂය 2ක් | **විද්‍යා හා තාක්ෂණ විෂයධාරාව**<br>**1.** විෂයධාරාවෙන් උපරිම හතරක්<br>**2.** මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂය ධාරාවෙන් සෞන්දර්ය අධ්‍යාපනය සහ ඉතිහාසය*<br>**3.** වෘත්තීය අධ්‍යයන විෂයධාරාවෙන් එක් විෂයක්<br>**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයධාරාව**<br>**1.** විෂය ධාරාවෙන් උපරිම හතරක්<br>**2.** විද්‍යා හා තාක්ෂණ විෂයධාරාවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ තාක්ෂණය**<br>**3.** වෘත්තීය අධ්‍යයන විෂයධාරාවෙන් එක් විෂයක්<br>**කළමනාකරණ, ව්‍යවසායකත්ව සහ ව්‍යාපාර අධ්‍යයන විෂය ධාරාව**<br>**1.** විෂයධාරාවෙන් උපරිම හතරක්<br>**2.** මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයධාරාවෙන් සෞන්දර්ය අධ්‍යාපනය සහ ඉතිහාසය*<br>**3.** වෘත්තීය අධ්‍යයන විෂයධාරාවෙන් එක් විෂයක්<br>**වෘත්තීය අධ්‍යයන විෂයධාරාව**<br>**1.** විෂයධාරාවෙන් උපරිම හතරක්<br>**2.** මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයධාරාවෙන් සෞන්දර්ය අධ්‍යාපනය සහ ඉතිහාසය*<br>**3.** විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) හෝ තාක්ෂණය** | ක්‍රීඩා, සමාජ සහ සංගම්වලින් සම්භාර 1ක් සහ අනෙකුත් ක්ෂේත්‍රවලින් සම්භාර 2ක්:<br>1. මාධ්‍ය අධ්‍යයනය<br>2. ආයතනගත පුහුණුව<br>3. සේවා අංශ අධ්‍යයනය<br>4. ගෝලීය අධ්‍යයනය<br>5. සමාජ සේවා<br>6. සෞඛ්‍ය හා ක්‍රීඩා<br>7. සෞන්දර්ය රසවින්දනය<br>8. චිත්‍රපට රසවින්දනය<br>9. වෘත්තීය සූදානම සඳහා පදනම<br>10. ඩිජිටල් පුරවැසිභාවය<br>11. ක්‍රීඩා, සමාජ සහ සංගම් |

* තෝරාගත හැකි විෂයය අතුරින් ශිෂ්‍යයෙකු සෞන්දර්ය අධ්‍යාපනය හෝ ඉතිහාසය තෝරාගෙන තිබේ නම්, ඔහු/ඇය වැඩිදුර ඉගෙනුම් මොඩියුලවලින් සෞන්දර්ය අධ්‍යාපනය හෝ ඉතිහාසය තෝරා නොගත යුතුය. ඔවුන් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයය ලැයිස්තුවෙන් වෙනත් ඕනෑම මොඩියුලයක් තෝරාගත යුතුය.

** ශිෂ්‍යයෙකු තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) විකල්ප විෂයයන් ලෙස තෝරාගෙන තිබේ නම්, ඔහු/ඇය වැඩිදුර ඉගෙනුම් මොඩියුලවලින් තාක්ෂණය / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) තෝරා නොගත යුතුය. ඔවුන් වැඩිදුර ඉගෙනුම් මොඩියුල ලැයිස්තුවෙන් වෙනත් ඕනෑම මොඩියුලයක් තෝරාගත යුතුය.

2.8 වගුව ජොෂ්ඨ ද්විතීයික අවධිය - පළමු අදියර (*10-11* ශ්‍රේණි) සඳහා විෂය ධාරාව අනුව වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරාගැනීමේ තාර්කිතය

| ශිෂ්‍යයින්ගේ මූලික විෂය ධාරාව | විද්‍යාව හා තාක්ෂණය | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | කළමනාකරණය, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අධ්‍යයනය | වෘත්තීය අධ්‍යයනය |
|---|---|---|---|---|
| විද්‍යාව හා තාක්ෂණය | 4 | 2 | 0 | 1 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | 2 | 4 | 0 | 1 |
| කළමනාකරණය, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අධ්‍යයනය | 0 | 2 | 4 | 1 |
| වෘත්තීය අධ්‍යයනය | 0 | 2 | 1 | 4 |

**ජොෂ්ඨ ද්විතීයික අවධිය - දෙවන අදියර (12 සහ 13 ශ්‍රේණි)**

**අරමුණ: ශාස්ත්‍රීය හා වෘත්තීය ජීවිතය සඳහා පදනම**

ජොෂ්ඨ ද්විතීයික මට්ටමේ පළමු අදියර සම්පූර්ණ කරන සිසුහු, පාසල් අධ්‍යාපනයේ කූටප්‍රාප්තිය වන අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා තමන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන විශේෂිත ක්ෂේත්‍රය පිළිබඳ මනා අවබෝධයකින් 12 ශ්‍රේණියට ඇතුළු වෙති. එක් එක් විෂය ධාරාව සඳහා වන විෂයය 2.9 වගුවේ දක්වා ඇත. කෙසේ වෙතත්, නුදුරු අනාගතයේදී සිදුවීමට නියමිත උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සැලකිල්ලට ගනිමින්, විෂයය, විෂය සංයෝජන සහ අනෙකුත් විස්තර ඉදිරියේ දී නිම කිරීමට නියමිත බව සටහන් කිරීම වැදගත්ය.

**2.9** වගුව ජොෂ්ඨ ද්විතීයික අවධිය - දෙවන අදියර (**12** සහ **13** ශ්‍රේණි) සඳහා යෝජිත විෂයය

| මාර්ගය | විෂය ධාරාව | යෝජිත විෂයය |
|---|---|---|
| ශාස්ත්‍රීය | විද්‍යාව | 1 ව්‍යවහාරික ගණිතය<br>2 ශුද්ධ ගණිතය<br>3 ජීව විද්‍යාව<br>4 රසායන විද්‍යාව<br>5 භෞතික විද්‍යාව<br>6 පරිගණක විද්‍යාව<br>7 දත්ත විද්‍යාව<br>8 කෘෂි විද්‍යාව<br>9 ජලජ විද්‍යාව |
| | තාක්ෂණය | 1 ඉංජිනේරු තාක්ෂණවේදය<br>2 තාක්ෂණය සඳහා විද්‍යාව<br>3 ජෛව ඉංජිනේරු තාක්ෂණවේදය<br>4 ආහාර හා පාරිභෝගික තාක්ෂණවේදය<br>5 කලාත්මක නිෂ්පාදන තාක්ෂණවේදය |
| | කළමනාකරණය, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අධ්‍යයනය | 1 ආර්ථික විද්‍යාව<br>2 ගිණුම්කරණය<br>3 ව්‍යාපාර අධ්‍යයනය<br>4 ව්‍යාපාර සංඛ්‍යානය<br>5 ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව<br>6 ගණිතය |

| මාර්ගය | විෂය ධාරාව | යෝජිත විෂයය |
|---|---|---|
| | | 7 සැපයුම් දාම කළමනාකරණය |
| | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | 1. භාෂාව සහ සාහිත්‍යය<br>2. විදේශ භාෂා (ජපන්, චීන, කොරියානු, හින්දි, ප්‍රංශ, ජර්මන්, රුසියානු, සහ අරාබි)<br>3. ශාස්ත්‍රීය භාෂා (පාලි සහ සංස්කෘත)<br>4. මාධ්‍ය හා සන්නිවේදනය<br>5. බුද්ධ ධර්මය<br>6. බෞද්ධ ශිෂ්ටාචාරය<br>7. හින්දු ධර්මය<br>8. හින්දු ශිෂ්ටාචාරය<br>9. ක්‍රිස්තියානි ධර්මය<br>10. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය<br>11. ඉස්ලාම් ධර්මය<br>12. ඉස්ලාම් ශිෂ්ටාචාරය<br>13. දේශපාලන විද්‍යාව<br>14. ඉතිහාසය<br>15. භූගෝල විද්‍යාව<br>16. ආර්ථික විද්‍යාව<br>17. ගණිතය<br>18. සමාජ විද්‍යාව<br>19. තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක අධ්‍යයනය<br>20. පෙරදිග සංගීතය<br>21. බටහිර සංගීතය<br>22. කර්ණාටක සංගීතය<br>23. නර්තනය (සිංහල)<br>24. නර්තනය (භරත නාට්‍යම්)<br>25. චිත්‍ර කලාව<br>26. නාට්‍ය හා රංග කලාව<br>27. චිත්‍රපට අධ්‍යයනය<br>28. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| කුසලතා | වෘත්තීය අධ්‍යයනය | 1. දෘශ්‍ය හා කාර්මික කලා<br>2. රංග කලා හා මාධ්‍ය කලා<br>3. ආගන්තුක සත්කාරක හා පුද්ගල සේවා<br>4. සෞඛ්‍ය හා සමාජ සේවා<br>5. කෘෂිකර්මය හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය<br>6. ලෝහ හා සැහැල්ලු ඉංජිනේරු විද්‍යාව<br>7. රෙදිපිළි හා ඇඟලුම් අධ්‍යයන<br>8. විදුලි හා ඉලෙක්ට්‍රොනික අධ්‍යයනය<br>9. ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා<br>10. සැපයුම් හා සැපයුම් දාම කළමනාකරණය<br>11. මෝටර් රථ අධ්‍යයනය<br>12. ඩිජිටල් හා ව්‍යවසාය කුසලතා |

විෂය තෝරා ගැනීම පහත සඳහන් නිර්ණායක මත පදනම් වනු ඇත.

**විශේෂීකරණය**

සිසුන් මෙම කාණ්ඩය යටතේ පිරිනමන විෂයය අතුරින් තුනක් තෝරා ගනු ඇත.

සෑම විෂයයක් සඳහාම වාරයකට පැය 90ක් වෙන් කෙරෙන අතර, එය වසර දෙක සඳහා පැය 540ක ඉගෙනුම් කාලයක් වනු ඇත (වාරයකට එක් විෂයයක් සඳහා පැය 90 x වාර 6ක්).

තෝරාගත් විෂයය තුන සඳහා වසර දෙක තුළ මුළු ඉගෙනුම් කාලය පැය 1620ක් වනු ඇත (එක් විෂයයක් සඳහා පැය 540 x විෂයය 3ක්).

### වැඩිදුර බලගැන්වීමේ මොඩියුල (Enrichment modules)

**වැඩිදුර බලගැන්වීමේ** මොඩියුල යනු, තෝරාගත් විශේෂිත විෂයය තුන හැර, එකම විෂය ධාරාවෙන් සිසුන්ට තෝරාගත හැකි මොඩියුල වේ.

ජ්‍යෙෂ්ඨ ද්විතීයික දෙවන අදියරේදී පිරිනමන සෑම විෂයයක් සඳහාම අනුබද්ධ **වැඩිදුර බලගැන්වීමේ** මොඩියුලයක් ඇත.

මෙම කාණ්ඩය යටතේ වාරයකට පැය 30ක අධ්‍යයන කාලයක් වෙන් කෙරේ.

### අන්තර්-ශික්ෂණ මොඩියුල (Interdisciplinary modules)

මෙමගින්, සිසුන් තමන් තෝරාගත් විෂය ධාරාවෙන් බැහැර වූ වෙනත් විෂය ක්ෂේත්‍රවලින් තෝරාගත් මොඩියුල ගණනකට නිරාවරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම කාණ්ඩය යටතේ වාරයකට පැය 30ක අධ්‍යයන කාලයක් වෙන් කෙරේ.

### අනිවාර්ය මොඩියුල (Compulsory modules)

සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) අනිවාර්ය මොඩියුල ලෙස පිරිනමනු ලැබේ. සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා වාරයකට පැය 20ක් වෙන් කෙරෙන අතර. සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) සඳහා වාරයකට වෙන් කරන කාලය පැය 10ක් වනු ඇත. සාමාන්‍ය ඉංග්‍රීසි සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විභාග සඳහා පෙනී සිටීමට කැමති සිසුන් හට ඒ සඳහා පෙනී සිටිය හැකිය. .

## 2.2 මානව සම්පත් කළමනාකරණය

මෙතරම් විශාල අධ්‍යාපන පරිවර්තනයක්, එවන් කාර්යයක් හා සම්බන්ධ මානව සම්පත් සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු නොකර සිදු කළ නොහැක. එබැවින්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා සම්බන්ධ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමට හැකි වන පරිදි, අධ්‍යාපන සේවා පහම – ශ්‍රී ලංකා ගුරු සේවය (SLTS), ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය (SLTES), ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (SLEAS), ශ්‍රී ලංකා විදුහල්පති සේවය (SLPS), සහ ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය (SLTAS) – ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. විශේෂයෙන්ම, පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත:

- යෝජිත නව ප්‍රතිසංස්කරණ පිළිබඳව ශ්‍රී ලංකා ගුරු සේවය (SLTS), ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය (SLTES), ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (SLEAS), ශ්‍රී ලංකා විදුහල්පති සේවය (SLPS), සහ ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය (SLTAS) හි සාමාජිකයින් පුහුණු කිරීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල වත්මන් ශිෂ්‍ය ගුරුවරුන් සඳහා යෝජිත නව ප්‍රතිසංස්කරණ පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- අධ්‍යාපන අංශයේ අනාගත ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය කුසලතා ගුරුවරුන්ට ලබා දීම සඳහා ආරම්භක ගුරු සුදුසුකම් ඉහළ නැංවීම.
- ගුරුවරුන් වෙත පැන නගින අවශ්‍යතා සපුරාලන පුහුණුවක් ලබා දීම සඳහා අධ්‍යාපනය පිළිබඳ උපාධි වැඩසටහන්වල පවතින විෂය මාලාව වැඩිදියුණු කිරීම.
- ගුරුවරුන්ගේ වෘත්තීය ජීවන චක්‍රයේ සෑම අදියරකම ගතිකත්වය සැලකිල්ලට ගනිමින් විද්‍යාත්මක ගුරු සංවර්ධන රාමුවක් සකස් කිරීම.
- නව ප්‍රතිසංස්කරණ යටතේ පිරිනැමීමට නියමිත නව විෂයය සඳහා දැනට සිටින ගුරුවරුන් පුහුණු කිරීම සහ නව විෂයය යෝග්‍ය හා සුදුසුකම් ලත් ගුරුවරුන් වෙත පැවරීම තහවුරු කිරීම..

ගුරු පුහුණු සැසි පිළිබඳ වැඩි විස්තර පහත දක්වා ඇත.

- 1-11 ශ්‍රේණිවල ගුරුවරුන් සඳහා පුහුණු සැසි "කැස්කේඩ් ආකෘතිය - ස්ථරයෙන් ස්ථරයට

පහළට ගලායන ආකාරයට " (Cascade Model) භාවිතයෙන් පවත්වනු ලැබේ. මෙහිදී, ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයින් විසින් ගුරු උපදේශකවරුන් සහ ප්‍රාදේශීය සම්පත් දායකයින් සෘජුවම පුහුණු කරනු ලැබේ. පසුව, මෙම අධ්‍යාපනඥයින් තම ප්‍රදේශවල ගුරුවරුන් සඳහා ප්‍රාදේශීය පුහුණු වැඩසටහන් පැවැත්වීමේ වගකීම දරනු ඇත.

- මෙම පුහුණු සැසි සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද පුහුණු අත්පොත් භාවිතයෙන් විෂය පදනම් කරගත් විශේෂිත පුහුණුවක් ලබා දෙනු ඇත.
- සෑම පුහුණු සැසියක්ම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාමාන්‍ය හැඳින්වීමකින් ආරම්භ වී පසුව විෂය විශේෂිත පුහුණුව වෙත යොමු වනු ඇත.
- ප්‍රාදේශීය මට්ටමින් පුහුණු සැසි පවත්වන විට, ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) අධ්‍යාපනඥයින් ප්‍රාදේශීය මට්ටමින් ලබා දෙන ජාතික සම්පත් මධ්‍යස්ථාන හරහා අන්තර්ජාලය ඔස්සේ තම ප්‍රවීණත්වය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ ජාතික අධ්‍යාපන ආයතනයේ (NIE) ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයින්ගේ සහාය ප්‍රාදේශීය ගුරු අධ්‍යාපනඥයින් වෙත අඛණ්ඩ ලබා දෙනු ඇත.
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අදියරේ (දෙවන අදියර) ඉගැන්වීම් කටයුතුවල නිරත වන ගුරුවරුන් සංඛ්‍යාව සීමිත බැවින්, ඔවුන් වෙත ජාතික අධ්‍යාපන ආයතනය (NIE) විසින් සෘජුවම පුහුණු වීම් සිදුකරනු ලැබේ.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපනය පිළිබඳව ගුරුවරුන් සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් පුහුණු කිරීම. එවැනි අවශ්‍යතා සහිත සිසුන් සුදුසු ආකාරයෙන් ප්‍රධාන ධාරාවේ පන්ති කාමරවලට ඒකාබද්ධ කිරීම සහතික කිරීම සඳහා මෙම පුහුණුව අත්‍යවශ්‍ය වේ. මෙම පුහුණු වැඩසටහන් සමාන අභියෝගවලට මුහුණ දිය හැකි සහාය කාර්ය මණ්ඩල සාමාජිකයින් පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ.

මෙම මැදිහත්වීම් මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය, පෞද්ගලික සහ පිරිවෙන් අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක අධ්‍යාපන සේවා පහෙහිම සාමාජිකයින් නව විෂයමාලා ප්‍රතිසංස්කරණ සඳහා සූදානම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2.3 යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ

### 2.3.1 *යටිතල පහසුකම් සංවර්ධනය*

අධ්‍යාපනයට පවත්නා ප්‍රවේශය පුළුල් කිරීමේදී සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබුණද, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් සහ යල් පැන ගිය පරිපාලන ක්‍රමවේදයන්ට අදාළ අභියෝගවලට දිගින් දිගටම මුහුණ දෙමින් සිටියි. බොහෝ පාසල් ප්‍රමාණවත් නොවන පන්ති කාමර, විද්‍යාගාර, පුස්තකාල සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව ක්‍රියාත්මක වන අතර, ප්‍රාදේශීය වශයෙන් සමකාලීන ඩිජිටල් සම්පත් ඒකාබද්ධ කිරීම හා පැතිරුම අසමාන ලෙස පවතී. එමෙන්ම, පරිපාලන ක්‍රියාවලීන් බොහෝ විට ඛණ්ඩනය වී ඇති අතර, කඩදාසි මත පදනම් වී ඇත. එමගින් ඉගෙනුම්ලාභීන්, ගුරුවරුන් සහ ප්‍රජාවන්ගේ ගතික අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම මන්දගාමී වේ. මෙම සීමාවන් මගින් අධ්‍යාපනය ලබාදීමේ දී ගුණාත්මක බව සහ සමානාත්මතාව යන ද්විත්වයටම හානි කරන අතර, නාගරික හා ග්‍රාමීය පාසල් අතර විෂමතා වඩාත් පුළුල් කරනු ලබයි. මෙම ගැටළු විසඳීම සඳහා, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ පරිපාලන පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබා දෙන, වඩාත් කාර්යක්ෂම, විනිවිදභාවය සහ අනුවර්තනය වීමේ හැකියාව සහතික කරන පුළුල් ප්‍රතිපත්ති ප්‍රතිචාරයක් අවශ්‍ය වේ. සමස්තයක් ලෙස, මෙම ප්‍රතිසංස්කරණ මගින් වඩාත් අන්තර්කරණීය වූ, වගකීම් සහිත සහ අනාගතයට සූදානම් වූ අධ්‍යාපන පද්ධතියක් සඳහා අඩිතාලම දමනු ඇත.

යටිතල පහසුකම් සම්බන්ධයෙන්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මූලික යටිතල පහසුකම් (පන්ති කාමර, සනීපාරක්ෂක පහසුකම් ආදිය) සහ නවෝත්පාදන විද්‍යාගාර, විද්‍යාගාර සහ භාෂා විද්‍යාගාර වැනි ඉහළ පෙළේ ඉගෙනුම් අවකාශයන් යන දෙකම ශක්තිමත් කරනු ඇත.

භෞතික ප්‍රවේශවීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ සිසුන්ගේ මෙන්ම කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අදාළ උපකරණ හා භෞතික අවකාශයන් සැපයීම මගින් විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

### 2.3.2 *අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ*

අධ්‍යාපන පරිපාලන අංශයේ පවතින අභියෝගවලට විසඳුමක් ලෙස පහත සඳහන් ක්‍රියාමාර්ග යෝජනා කෙරේ:

- ගුරු පුහුණු ක්‍රියාවලිය නවීකරණය කිරීම හා විධිමත් කිරීම සඳහා අධ්‍යාපන කවුන්සිලයක් පිහිටුවීම.
- සමකාලීන අවශ්‍යතා සහ වෘත්තීය ප්‍රමිතීන් පිළිබිඹු වන පරිදි ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.
- මුල් ළමාවිය අධ්‍යාපන (ECE) සහ සාමාන්‍ය අධ්‍යාපන අංශ සඳහා වගකිව යුතු ජාතික හා පළාත් මට්ටමේ ආයතනවල භූමිකාවන් සහ වගකීම් සමාලෝචනය කිරීම.
- විනිවිදභාවය, තරඟකාරිත්වය සහ ජාතික ප්‍රමිතීන් හා ඇගයීම් සමඟ අනුකූලතාවය සහතික කිරීම මගින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම.
- මානව සම්පත්වල ප්‍රශස්ත උපයෝජනය සහතික කිරීම සඳහා ජාතික හා පළාත් පාසල් අතර ව්‍යුහගත ගුරු මාරු යාන්ත්‍රණයක් හඳුන්වා දීම.
- දත්ත කළමනාකරණය කිරීමට සහ ඵලදායී ගුරු මාරු කිරීම් ක්‍රමවේදයක් සඳහා පහසුකම් සැලසීම පිණිස විනිවිද පෙනෙන, ඩිජිටල් පද්ධතියක් මගින් සහය ලබන, ජාතික හා පළාත් බලධාරීන්ගෙන් සමන්විත ගුරු ස්ථානගත කිරීමේ මණ්ඩලයක් පිහිටුවීම.
- වඩාත් අවධානය යොමු කළ හැකි සහ පුද්ගලාරෝපිත ඉගැන්වීම් සඳහා පහසුකම් සැලසීම පිණිස පන්ති කාමරයක සිසුන් සංඛ්‍යාව උපරිම 35කට සීමා කිරීම සඳහා ක්‍රමානුකූලව සිසුන් සංඛ්‍යාව අඩු කිරීම.
- ගුරුවරුන්ට සම්පූර්ණ කිරීමට අවශ්‍ය අනවශ්‍ය ලිපි ලේඛන ප්‍රමාණය ඉවත් කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පාදක ප්‍රධාන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
- පන්ති කාමරයක ප්‍රමාණය, පාසලක තිබිය යුතු පන්ති කාමර සංඛ්‍යාව, භූගෝලීය හා සමාජ-ආර්ථික සන්දර්භය යනාදිය පිළිබඳ ප්‍රතිපත්ති සැලකිල්ලට ගනිමින් පාසල් පද්ධතිය තාර්කිකකරණය කිරීම. අවශ්‍ය තැනක, සම්පත්, ප්‍රවේශය, ජන ඝනත්වය සහ අනෙකුත් සාධක මත පදනම්ව පාසල් පොකුරු කිරීමේ ක්‍රමයක් මෙයට ඇතුළත් විය හැක.
- ඩිජිටල්කරණය කළ පද්ධතියක සහාය ඇතිව අධ්‍යාපනයේ සියලු මට්ටම් හරහා සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග ස්ථාපිත කිරීම. මෙම පද්ධතිය අධ්‍යාපන පද්ධතිය තුළ එනම් අධ්‍යාපන අමාත්‍යාංශය (MoE), ජාතික අධ්‍යාපන ආයතනය (NIE), විභාග දෙපාර්තමේන්තුව (DoE), ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (NEC), පර්යේෂණ ආයතන සහ විශ්ව විද්‍යාල අතර හවුල්කාරිත්වයන් ඇති කරමින් පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රය ද ප්‍රවර්ධනය කරනු ඇත.
- ප්‍රජා ප්‍රතිපෝෂණ මත පදනම්ව කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා අධ්‍යාපන ආයතනවල (පාසල්, ගුරු අධ්‍යාපන ආයතන ආදිය) දැනට පවතින ක්‍රමවේද ශක්තිමත් කිරීම.
- ස්ත්‍රී පුරුෂ භාවය, ආබාධිතභාවය යනාදිය පිළිබඳ විශේෂඥයින් සමඟ සහයෝගයෙන් සාධාරණ, අන්තර්කරණ සහ සන්දර්භයට ප්‍රතිචාරාත්මකව තීරණ ගැනීමට හැකිවන සේ කටයුතු කිරීම

## 2.4 තක්සේරුකරණය හා ඇගයීම

### 2.4.1 *පොදු සංකල්ප*

මෙම කොටස, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ සමස්ත තක්සේරුකරණ ක්‍රියාවලිය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. එහිදී රාජ්‍ය පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, පොදු විභාග, ගුණාත්මක තක්සේරුව (QA), ජාතික ඇගයීම වැනි විවිධ අංශයන් පිළිබඳව විමසා බලනු ලැබේ.

තවද, සාමාන්‍ය අධ්‍යාපනයේ ඇගයීම් පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජනා/නිර්දේශ ද මෙහිදී ඉදිරිපත් කෙරේ. මෙම කොටසේදී, "තක්සේරුව" යන යෙදුමෙන් අදහස් වන්නේ සිසුන්ගේ කාර්ය සාධනය

සහ ඉගෙනුම් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම පිළිබඳ විනිශ්චයන් ලබා දෙන ක්‍රමානුකූල ඇගයීම් ක්‍රියාවලියයි.

තක්සේරුව සහ ඇගයීම පාසල් අධ්‍යාපනයේ අත්‍යවශ්‍ය කුළුණු වන අතර, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වගවීමෙන් යුක්ත බවත්, ශිෂ්‍යයින්ගේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් කෙරෙහි නැඹුරු වී ඇති බවත් සහතික කරනු ලබයි. "තක්සේරුව" යන්නෙන් සිසුන්ගේ ඉගෙනීම පිළිබඳ සාක්ෂි ක්‍රමානුකූලව රැස් කිරීම අදහස් වන අතර, "ඇගයීම" යනු සිසුන්ගේ ප්‍රගතිය, විෂය මාලාවේ ඵලදායීතාවය සහ සමස්ත ඉගැන්වීමේ ගුණාත්මකබව පිළිබඳ දැනුවත් තීරණ ගැනීමට මෙම සාක්ෂි අර්ථ නිරූපණය කිරීමේ ක්‍රියාවලියයි. සමස්තයක් වශයෙන්, ඒවා සාක්ෂි මත පදනම් වූ අධ්‍යාපන සැලසුම්කරණය සහ තීරණ ගැනීම සඳහා අඩිතාලම සපයයි.

**සම්භවන හා සම්පිණ්ඩන ඇගයීම/ තක්සේරුකරණය**

පාසල් පද්ධතිය තුළ, තක්සේරු කිරීම් සාමාන්‍යයෙන් සම්භවන (formative) සහ සම්පිණ්ඩන (summative) ලෙස පුළුල්ව වර්ගීකරණය කෙරේ. ගෝලීය වශයෙන්, සම්භවන තක්සේරු කිරීම් ප්‍රයෝජනවත් බව බහුලව පිළිගැනේ. මන්දයත්, සිසුන්ගේ ක්‍රියාශීලී සහභාගීත්වයේ ඌනතාවය සහ කටපාඩම් කිරීම මත අධික ලෙස යැපෙන සම්පිණ්ඩන විභාගවල අධික න්‍යායාත්මක නැඹුරුව වැනි ගැටළු අඛණ්ඩව නිරීක්ෂණය කිරීමට සහ ඒවාට විසඳුම් ලබා දීමට එමගින් ඉඩ සලසන බැවිනි. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට කාවැදී ඇති සම්භවන තක්සේරු කිරීම්, සහයෝගී ඉගෙනුම, විවේචනාත්මක සාකච්ඡාව සහ වටිනාකම් අභ්‍යන්තරීකරණය කිරීමද දිරිමත් කරයි.

සම්භවන තක්සේරුව ශාස්ත්‍රීය ජයග්‍රහණ සඳහා පමණක් නොව, ස්වයං-ප්‍රත්‍යාවලෝකනය, ගැටළු විසඳීම සහ ස්වයං-නියාමනය වැනි විවේචනාත්මක ඉගෙනුම් ලක්ෂණ සංවර්ධනයට ද දායක වේ.

අනෙක් අතට, සම්පිණ්ඩන තක්සේරු කිරීම සාමාන්‍යයෙන් මොඩියුලයක්, වාරයක් හෝ අධ්‍යයන චක්‍රයක් අවසානයේ දී නියමිත ඉගෙනුම් ප්‍රතිඵල කොපමණ දුරට සාක්ෂාත් කරගෙන ඇත්දැයි තීරණය කිරීම සඳහා සිදු කරනු ලබයි. මෙම තක්සේරු කිරීම් සහතික කිරීම, උසස් කිරීම සහ ජයග්‍රහණ මට්ටම් වාර්තා කිරීම වැනි අරමුණු සඳහා යොදා ගැනේ.

මෙම ප්‍රතිපත්ති රාමුව සම්භවන තක්සේරුවේ භූමිකාවට විශේෂ අවධාරණයක් ලබා දුන්නද, පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක බව, අන්තර්කරණය සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා සම්භවන සහ සම්පිණ්ඩන තක්සේරු කිරීම් සමබරව ඒකාබද්ධ කිරීම අත්‍යවශ්‍ය බව පිළිගනු ලබයි.

### 2.4.2 *ජාතික මට්ටමේ තක්සේරුකරණය*

ජාතික මට්ටමේ ප්‍රධාන තක්සේරු කිරීම් දෙකක් පවතිනු ඇත:

1. **අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය:** පළමු අදියරේ (11 ශ්‍රේණිය) පළමු වාර පහ අවසානයේදී, සිසුන් අනිවාර්ය විෂයයන් පහ සහ තෝරාගත් විෂයය දෙකක් සඳහා පෙනී සිටිනු ඇත.
2. **අ.පො.ස. උසස් පෙළ විභාගය:** 13 ශ්‍රේණිය අවසානයේදී, සිසුන් තෝරාගත් විශේෂීකරණය යටතේ විභාගයට පෙනී සිටිනු ඇත.

### 2.4.3 *පාසල් පාදක ඇගයීම්*

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවට (2020-2030) අනුකූලව, 6 ශ්‍රේණියේ සිට මොඩියුල මට්ටමේ, පාසල් පාදක තක්සේරු ක්‍රමවේද ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම තක්සේරුකිරීම් අඛණ්ඩ, සම්භවන සහ ඉගෙනීමට සහාය වන ඒවා වන අතර, ඇගයීම මගින් අධ්‍යාපන කාර්යසාධනය සීමා කරනවාට වඩා ශක්තිමත් කරන බව සහතික කරනු ලබයි.

ගුරුවරුන් සමබර තක්සේරු ප්‍රවේශයක් ක්‍රියාත්මක කරනු ඇති අතර සම්භවන තක්සේරු කිරීම් (අඛණ්ඩ, පන්ති කාමර ක්‍රියාකාරකම් සහ ප්‍රතිපෝෂණ) සම්පිණ්ඩන තක්සේරු කිරීම් (මොඩියුලය අවසානයේ ඇගයීම්) සමඟ ඒකාබද්ධ කරනු ඇත. සම්භවන තක්සේරු කිරීම් 70% ක් වන අතර, සම්පිණ්ඩන තක්සේරු කිරීම් 30% ක් වනු ඇත. ලකුණු, ශ්‍රේණි සහ ශ්‍රේණි ලක්ෂ්‍ය අගය (GPV) පහත 2.10 වගුවේ දක්වා ඇත.

*වගුව 2.10 ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය*

| ලකුණු | ශ්‍රේණිය | ශ්‍රේණි ලක්ෂ්‍ය අගය | ශ්‍රේණි විස්තරය | උපයාගත් සම්මාන |
|---|---|---|---|---|
| 80 - 100 | A | 4.00 | විශිෂ්ටයි | ඔව් |
| 75 - 79 | A- | 3.67 | ඉතාමත් ම හොඳයි | ඔව් |

| | | | | |
|---|---|---|---|---|
| 70 - 74 | B+ | 3.33 | ඉතා හොඳයි | ඔව් |
| 65 - 69 | B | 3.00 | හොඳයි | ඔව් |
| 60 - 64 | B- | 2.67 | තරමක් හොඳයි | ඔව් |
| 55 - 59 | C+ | 2.33 | සතුටුදායකයි | ඔව් |
| 50 - 54 | C | 2.00 | තරමක් සතුටුදායකයි | ඔව් |
| 45 - 49 | S | 1.67 | සමත් | ඔව් |
| 40 - 44 | D | 1.33 | අර්ධ වශයෙන් සමත් | ඔව් |
| 35 - 39 | E | 1.00 | දුර්වලයි | නැත |
| 0 - 34 | F | 000 | ඉතා දුර්වලයි | නැත |

සම්භවන සහ සම්පිණ්ඩන යන සංරචකවල ඒකාබද්ධ ලකුණුවලින් 40% ක් හෝ ඊට වැඩි ලකුණක් ලබා ගන්නේ නම්, එක් එක් සංරචකයේ කාර්යසාධනය කුමක් වුවත්, ශිෂ්‍යයෙකු පාඨමාලාවක් සමත් වූ බව සලකනු ලැබේ. අවම වශයෙන් 1.33 ක ශ්‍රේණි ලක්ෂ්‍ය අගයක් සහිතව ඉගෙනුම් පැය 10 ක් සම්පූර්ණ කරන ඕනෑම ශිෂ්‍යයෙකු එක් සම්භාරයක් සම්පූර්ණ කළ බව සලකනු ලැබේ.

සිසුන්ගේ ප්‍රගතිය, එක් එක් මොඩියුලය සහ විෂය සඳහා සාමාන්‍ය ලකුණු අගයක් (GPA) ලෙස සන්නිවේදනය කරනු ඇත. එමගින් සිසුන්ට, දෙමාපියන්ට සහ ගුරුවරුන්ට ඉගෙනීම නිරීක්ෂණය කිරීමට, අඩුපාඩු හඳුනා ගැනීමට සහ ජයග්‍රහණ වැඩි දියුණු කිරීමට කාලීන ක්‍රියාමාර්ග ගැනීමට විනිවිදභාවයෙන් යුත් යාන්ත්‍රණයක් සපයනු ලැබේ.

නව තක්සේරු පරිචයන්හි ප්‍රධාන අරමුණු සහ ලක්ෂණ පහත පරිදි වේ:

1. **ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම වැඩි දියුණු කිරීම:** තක්සේරු කිරීම්, හුදු කාර්ය සාධන ශ්‍රේණිගත කිරීම්වලින් ඔබ්බට ගොස් අවබෝධය, විවේචනාත්මක චින්තනය, නිර්මාණශීලීත්වය සහ දැනුම යෙදවීම කෙරෙහි අවධානය යොමු කරයි.
2. **සමානාත්මතාව සහ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම:** තක්සේරු ක්‍රමවේද විවිධ ඉගෙනුම් අවශ්‍යතා, භාෂාමය පසුබිම් සහ සමාජ-සංස්කෘතික සන්දර්භයන්ට අනුගත වන අතර, සියලු සිසුන්ට සාර්ථක වීමට සාධාරණ අවස්ථා සහතික කරයි.
3. **21 වැනි සියවසට සහ ඉන් ඔබ්බට අවශ්‍ය කුසලතා පෝෂණය කිරීම:** සිසුන් ගැටළු විසඳීම, සහයෝගීතාව, ඵලදායී සන්නිවේදනය, ඩිජිටල් සාක්ෂරතාව සහ සිවිල් වගකීම වැනි නිපුණතා වර්ධනය කරනු ඇත.
4. **ගුරු වෘත්තිකභාවය ශක්තිමත් කිරීම:** අඛණ්ඩ පුහුණුව සහ ධාරිතා සංවර්ධනය මගින් සහාය ලබමින්, තක්සේරු කිරීම් ඵලදායී ලෙස සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අර්ථ නිරූපණය කිරීමට ගුරුවරුන්ව බලගන්වනු ඇත.
5. **අදාළත්වය, කාර්යක්ෂමතාව සහ යාවජීව ඉගෙනීම පිළිබඳ ප්‍රතිපත්තිමය ඉලක්ක සඳහා සහාය වීම:** සම්භවන, පාසල් පාදක තක්සේරු කිරීම් මගින් උසස් තත්ත්වයේ අධ්‍යාපනයට, වඩා හොඳ ඉගෙනුම් ප්‍රතිඵලවලට සහ උසස් අධ්‍යාපනයට, රැකියා සහ ක්‍රියාකාරී පුරවැසිභාවය සඳහා ඉගෙනුම්ලාභීන් සූදානම් කිරීමට දායක වනු ඇත.

මෙම මූලාරම්භනය මගින් තක්සේරු ක්‍රමවේදයන්හි පරමාදර්ශී විපර්යාසයක් නියෝජනය කරන අතර, විෂය මාලාවට සම්භවන ඇගයීම කාවද්දමින්, වේගයෙන් වෙනස් වන ගෝලීය සන්දර්භයක් තුළ විශ්වසනීය, දක්ෂ සහ වගකීම් සහිත ඉගෙනුම්ලාභීන් පෝෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ කැපවීම සමඟ අනුගත වනු ඇත.

### 2.4.4 *සහතිකකරණ ක්‍රමවේදය*

නව සහතිකකරණ ක්‍රමවේදය සිසුන්ගේ අධ්‍යයන මාවතේ සියලු අංග විධිමත් ලෙස හඳුනාගනු ඇත. පාසලින් නික්මයාමේ සහතිකවල සම්පූර්ණ කරන ලද විෂයය සහ විෂය ධාරාවන් පමණක් නොව, ලබාගත් සියලුම සම්භාර (credits), ඉගෙනුම් වර්ධක (enrichment) සහ අන්තර්-ශික්ෂණ (interdisciplinary) මොඩියුලයන් මෙන්ම විෂය සමගාමී ජයග්‍රහණ ද විස්තර කරනු ඇත. මෙම ප්‍රවේශය ශාස්ත්‍රීය හා වෘත්තීය ඉගෙනීම සමානව ඇගයීමට ලක්කරන බවත්, සෑම ශිෂ්‍යයෙකුගේම සම්පූර්ණ කුසලතා පරාසය සේවා යෝජකයන්ට, උසස් විද්‍යාලවලට සහ පුහුණු ආයතනවලට දෘශ්‍යමාන වන බවත් සහතික කරනු ලබයි.

තවද, නව තක්සේරු ක්‍රමවේදය ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) හරහා කේන්ද්‍රගත කරනු ඇති අතර තක්සේරු දත්ත සිසුන්ගේ, ගුරුවරුන්ගේ සහ පාසල් පැතිකඩ සමඟ ඒකාබද්ධ කරනු ඇත. තවද, ඒකාබද්ධ ජාතික අධ්‍යාපන දත්ත පරිසර පද්ධතියක් සමඟ ඒකාබද්ධ ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය හා දේශීය කළමනාකරණ පද්ධති (LMSs) සමඟ ද සම්බන්ධ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2.5 මහජන දැනුවත්කිරීම හා ප්‍රවර්ධනය

රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීම රඳා පවතින්නේ මහජනයා ඒවාට හිමිකම් කියන ප්‍රමාණය මතය. එබැවින්, මෙම ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදකයින්, විෂය ප්‍රවීණයන් සහ අනෙකුත් ප්‍රායෝගිකව නියැලෙන්නන් සිසුන්ගේ සහ දෙමාපියන්ගේ අභිලාෂයන් කෙරෙහි සංවේදී විය යුතුය. ඊට අමතරව, අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දෙන වෙනස්කම් රටේ සංවර්ධන ගමන් මගට මග පෙන්විය යුතු බැවින්, ප්‍රජා නායකයින්ට, තරුණ තරුණියන්ට, කර්මාන්ත නායකයින්ට සහ ජාත්‍යන්තර ප්‍රජාවට සවන් දීම වැදගත් වේ.

# 3 වන පරිච්ඡේදය : නියාමනය, ඇගයීම සහ සමාලෝචනය

අධ්‍යාපන පරිවර්තන ක්‍රියාවලියේ විධිමත් හා අඛණ්ඩ අධීක්ෂණය සහ ඇගයීම එහි සාර්ථකත්වයට යතුරයි. ක්‍රියාත්මක කිරීමේ ආයතන තමන්ගේම අධීක්ෂණ හා ඇගයීම් යාන්ත්‍රණයන් සංවර්ධනය කරන අතරතුර, අධීක්ෂණයට හා ඇගයීමට තෙවන පාර්ශ්වයක් සම්බන්ධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සවිස්තරාත්මක අධීක්ෂණයක සහ ඇගයීමක නිරත වනු ඇත. මෙම ක්‍රියාවලියේදී වලංගු හා විශ්වාසනීය මිනුම් භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ, එවිට ලැබෙන දත්ත සාර්ථක අධ්‍යාපන පරිවර්තනයක පදනම වනු ඇත.


තවද, අදාළ ක්‍රියාත්මක කිරීමේ ආයතන සමඟ තත්‍ය කාලීනව ප්‍රතිපෝෂණ බෙදා ගැනීම ඉතා වැදගත් බව අවධාරණය කෙරේ, මන්ද එය අධීක්ෂණය හා ඇගයීම භාර ගන්නා ආයතනයට සෑම වසරකම ප්‍රමිති පවත්වාගෙන යාම සහ ඉහළ නැංවීම සඳහා ගුණාත්මක සහතික කිරීමේ ක්‍රියාවලියක නිරත වීමට ප්‍රායෝගිකව නියැලෙන්නන්ට මග පෙන්වීමට හැකි වනු ඇත.

**වැඩසටහන් හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PPMU)**

මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල විශාලත්වය, සංකීර්ණත්වය සහ ජාතික වැදගත්කම සැලකිල්ලට ගෙන, සියලු ප්‍රතිසංස්කරණ අංග හරහා සාර්ථක ලෙස ලබා දීම සහතික කිරීම සඳහා සමස්ත ක්‍රියාවලියම කේන්ද්‍රගත ආකාරයකින් කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, ව්‍යාපෘතියේ සාර්ථක ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට, සම්බන්ධීකරණය කිරීමට සහ සහතික කිරීමට කැපවූ වැඩසටහන් හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PPMU) පිහිටුවනු ඇත. PPMU මගින් පහත සඳහන් දේ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ:

- වෘත්තීය සහ ඔරොත්තු දෙන වැඩසටහන් කළමනාකරණ කාර්යයක් ආයතනගත කිරීම.
- සියලු ප්‍රතිසංස්කරණ කුළුණු හරහා ප්‍රමාදයන්, පුනරාවර්තනයන් සහ ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු අඩු කිරීම;
- තත්‍ය කාලීන උපකරණ පුවරු හරහා දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති තීරණ සහ අවදානම් අවම කිරීම සක්‍රිය කිරීම.
- අනාගත ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ දිගුකාලීන අභ්‍යන්තර ධාරිතාව ශක්තිමත් කිරීම.

ඇමුණුම 1: ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රගතියේ මංපෙත්



## ඇමුණුම 2: සාමාන්‍ය අධ්‍යාපනය සඳහා විෂයමාලා රාමුව

අ.පො.ස. (උසස් පෙළ) විභාගය

ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අදියර 2

13 ශ්‍රේණිය

12 ශ්‍රේණිය

12 සහ 13 ශ්‍රේණි සඳහා වාරයකට වන විෂය සහ මොඩියුල

(ලබා ගත හැකි විෂය සහ මොඩියුල සඳහා 2.9 වගුව බලන්න)

*විෂය ධාරා පහෙන් එකක් තෝරන්න (විද්‍යාව; තාක්ෂණය; කළමනාකරණය, ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර අධ්‍යයනය; මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා; සහ වෘත්තීය අධ්‍යයනය)*

| | |
|---|---|
| විශේෂීකරණ විෂය: | 03 (සම්භාර 27) |
| ඉගෙනුම් වර්ධක මොඩියුල: | 03 (සම්භාර 03) |
| අන්තර් - ශික්ෂණ මොඩියුල: | 03 (සම්භාර 03) |
| සාමාන්‍ය ඉංග්‍රීසි: | 01 (සම්භාර 02) |
| සාමාන්‍ය තොරතුරු තාක්ෂණය: | 01 (සම්භාර 01) |

| | |
|---|---|
| වාරයකට මුළු ඒකක: | 36 |
| වාරයකට මුළු ඉගෙනුම් පැය: | 360 |
| වසරකට හෝ ශ්‍රේණියකට වාර ගණන: | 3 |
| වසරකට හෝ ශ්‍රේණියකට මුළු ඉගෙනුම් පැය: | 1080 |

ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අදියර 1

සිසුන් ශාස්ත්‍රීය අධ්‍යයන ඉගෙනුම් මාවත හෝ කුසලතා ඉගෙනුම් මාවත තෝරා ගනු ලබන අතර ඒ අනුව, ඔවුනු වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරා ගනු ලබති.

11 ශ්‍රේණිය

10 ශ්‍රේණිය

T6

12 සහ 13 ශ්‍රේණිවලදී වෙනත් විෂය ධාරාවක් හැදෑරීමට සිසුන් තීරණය කරන්නේ නම්, ඔවුන්ට තම ඉගෙනුම් මාර්ගය/විෂය ධාරාව වෙනස් කිරීමට සහ අදාළ මොඩියුල හැදෑරීමට අවස්ථාව ඇත.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය (අනිවාර්ය විෂය සහ තෝරා ගන්නා විෂය සඳහා පමණි: මුළු විෂය සංඛ්‍යාව 7කි)

T5

T4

T3

T2

T1

**10 සහ 11 ශ්‍රේණි සඳහා වාරයකට අදාළ විෂය සහ මොඩියුල (1 සිට 5 වාරය දක්වා)**

**(ලබා ගත හැකි විෂය සහ මොඩියුල, සහ තෝරාගැනීමේ කොන්දේසි සඳහා 2.4, 2.5, 2.6, සහ 2.7 වගු බලන්න)**

| | |
|---|---|
| අනිවාර්ය විෂය: | 05 (සම්භාර 14) |
| තෝරාගත හැකි විෂය: | 02 (සම්භාර 04) |
| වැඩිදුර ඉගෙනුම් මොඩියුල*: | 07 (සම්භාර 14) |
| පරිවර්තනීය මොඩියුල: | 03 (සම්භාර 03) |

| | |
|---|---|
| වාරයකට මුළු සම්භාර: | 35 |
| වාරයකට මුළු ඉගැන්වීම් පැය: | 350 |
| වාර ගණන: | 5 |
| මුළු ඉගැන්වීම් පැය: | 1750 |

*වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරාගැනීම සඳහා වන කොන්දේසි, විෂය ධාරා පහෙන් එකක් තෝරාගැනීම මත රඳා පවතී (විද්‍යාව; තාක්ෂණය; මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා; කළමනාකරණය, ව්‍යවසායකත්වය සහ ව්‍යාපාර අධ්‍යයනය; සහ වෘත්තීය අධ්‍යයන)

**ජාතික කුසලතා තක්සේරුකරණය**

**(සිසුන්ට සිය අනාගත අධ්‍යයන හා වෘත්තීය මාවත් පිළිබඳව දැනුවත් තීරණ ගැනීමට සහය වීම සඳහා)**

**කණිෂ්ඨ ද්විතීයික අධ්‍යාපන අදියර**

ශිෂ්‍යයන් විෂයය තුනකින් වැඩිදුර ඉගෙනුම් මොඩියුල තෝරා ගත යුතු වේ.

9 ශ්‍රේණිය ↑ 8 ශ්‍රේණිය ↑ 7 ශ්‍රේණිය ↑ 6 ශ්‍රේණිය

**6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා වාරයකට අදාළ විෂය සහ මොඩියුල**

**(ලබා ගත හැකි විෂය සහ මොඩියුල සඳහා 2.3 වගුව බලන්න)**

| | |
|---|---|
| අත්‍යවශ්‍ය විෂය: | 14 (සම්භාර 28) |
| ක්‍රීඩා, සමාජ සහ සංගම්*: | 01 (සම්භාර 02) |
| වැඩිදුර ඉගෙනුම් මොඩියුල**: | 03 (සම්භාර 03) |
| පරිවර්තනීය මොඩියුල: | 02 (සම්භාර 02) |
| වාරයකට මුළු සම්භාර: | 35 |
| වාරයකට මුළු ඉගැන්වීම් පැය: | 350 |
| වසරකට හෝ ශ්‍රේණියකට වාර ගණන: | 3 |
| වසරකට හෝ ශ්‍රේණියකට මුළු ඉගැන්වීම් පැය: | 1050 |

* **ක්‍රීඩා, සමාජ සහ සංගම්** යන්නෙන් සිසුන්ගේ නිත්‍ය ශාස්ත්‍රීය විෂය මාලාවෙන් පරිබාහිරව සිසුන් සහභාගී වන ක්‍රියාකාරකම් අදහස් කෙරේ. මෙයට ක්‍රීඩා, සමාජ, ස්වේච්ඡා සේවය, විනෝදාංශ සහ නිර්මාණාත්මක ව්‍යාපෘති වැනි පුළුල් පරාසයක විකල්ප ඇතුළත් විය හැකිය. අත්‍යවශ්‍යයෙන් ම, සම්මත පන්ති කාමර ඉගෙනුමෙහි කොටසක් නොවන ඕනෑම දෙයක් මෙම කාණ්ඩයට අයත් වේ.

** **වැඩිදුර ඉගෙනුම් මොඩියුල** යනු යම්කිසි විෂයයකට අදාළ අන්තර්ගතයන් වන අතර, බොහෝ දුරට ප්‍රායෝගික භාවිතය කෙරෙහි අවධානය යොමු කරයි. සිසුන්ට විෂය 3කින් එක් සම්භාරයක් බැගින් වූ මොඩියුල තෝරාගත හැකිය.

**ප්‍රාථමික අධ්‍යාපන අදියර**

තෙවන ප්‍රධාන අවධිය: 5 ශ්‍රේණිය

දෙවන ප්‍රධාන අවධිය: 4 ශ්‍රේණිය ↑ 3 ශ්‍රේණිය

පළමු ප්‍රධාන අවධිය: 2 ශ්‍රේණිය ↑ 1 ශ්‍රේණිය

**ප්‍රාථමික අධ්‍යාපනය සඳහා වූ ඉගෙනුම් ක්ෂේත්‍ර**

1. මව් භාෂාව
2. ඉංග්‍රීසි භාෂාව
3. දෙවන ජාතික භාෂා
4. ගණිතය
5. ආරම්භක විද්‍යාව හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
6. ආගමික හා සාරධර්ම අධ්‍යාපනය
7. ඒකාබද්ධ සෞන්දර්ය අධ්‍යාපනය
8. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය
9. විෂය සමගාමී ක්‍රියාකාරකම්

**එක් එක් ඉගෙනුම් ක්ෂේත්‍රය සඳහා සතියකට ඉගැන්වීම් පැය ගණනට අදාළව 2.2 වගුව බලන්න.**

**ප්‍රාථමික අධ්‍යාපනය මගින් පහත සඳහන් දෑ සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ:**

1. තම සමීපතම නිවාස ප්‍රජාව පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය, ක්‍රමයෙන් ජාතික හා ගෝලීය සන්දර්භයන් දක්වා වර්ධනය වීම.
2. ජීවිතය සිත්ගන්නාසුළු, විචිත්‍රවත් සහ වටිනාකමින් යුතු වූවක් බවට පත් කරන සංස්කෘතික, සමාජීය, භෞතික, ජීව විද්‍යාත්මක, පාරිසරික, පාරිසරික විද්‍යාත්මක සහ භූගෝලීය විවිධත්වය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදීම
3. 21 වැනි සියවසට සහ ඉන් ඔබ්බට අවශ්‍ය වන ජීවන රටාවකට යෝග්‍ය, සියලු දෙසට ව්‍යාප්ත වූ රටාවක් සංවර්ධනය කිරීමට අවශ්‍ය සාක්ෂරතාව, සංඛ්‍යා සාක්ෂරතාව සහ සමාජ හා සංස්කෘතික කුසලතා.
4. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්, මනා චරිතයක් හා පුරවැසිභාවයක්, සහ 21 වැනි සියවසට සූදානම් පුරවැසියෙකු බිහි කිරීමට උපකාර වන මූල්‍ය සාක්ෂරතාවයේ මූලික කරුණු හා සම්බන්ධ මූලික ජීවන කුසලතා පිළිබඳ අවබෝධයක්.
5. සමාජ-චිත්තවේගීය කුසලතා සහ බහුවිධ බුද්ධිමය හැකියාවන්ගෙන් පොහොසත් සමබර පෞරුෂයක් සඳහා අඩිතාලමක්.

# ඇමුණුම 3: දායකත්ව ලැයිස්තුව

**ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් සිදුකිරීම පිළිබඳ ප්‍රතිපත්ති ලේඛනය සකස් කිරීම සඳහා දායකවූවන්ගේ ලැයිස්තුව - 2025**

1) ආචාර්ය හරිනි අමරසූරිය මැතිනිය, ගරු අග්‍රාමාත්‍ය හා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය
2) වෛද්‍ය මධුර සෙනවිරත්න මයා, ගරු නියෝජ්‍ය අමාත්‍ය (අධ්‍යාපන හා උසස් අධ්‍යාපන)
3) නලින් හේවගේ මයා, ගරු නියෝජ්‍ය අමාත්‍ය (වෘත්තීය අධ්‍යාපන)

<u>ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව</u>

4) මහාචාර්ය සරත් ආනන්ද මයා, සභාපති
5) තිලක් ධර්මරත්න මයා, උප සභාපති
6) ආචාර්ය ඩබ්.ඩබ්.පී.එන්. වීරකෝන් මිය, ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී
7) ආචාර්ය ආර්.කේ.ආර්.එස්. රණසිංහ මිය, ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී

<u>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය</u>

8) නාලක කළුවැව මයා, ලේකම්
9) එම්.ජ්.වී.එස්. එදිරිසූරිය මිය, අතිරේක ලේකම් (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ)
10) නිශාද් හඳුන්පතිරණ මයා, අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) (විශ්‍රාමික)
11) යූ.ටී. දික්කුඹුර මිය, අතිරේක ලේකම් (විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන)
12) එම්.පී.ආර්.කාරියවසම් මිය, අතිරේක ලේකම් (පාසල් කටයුතු)
13) ඒ.එච්.එම්.ජී.ඩී.එස්. සමරකෝන් මිය, අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
14) සුජාතා කුලේන්ද්‍රකුමාර් මිය, අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් සහ කාර්ය සාධන සමාලෝචන)
15) කමල් ආරියසිංහ මයා, අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)
16) ඒ.ජේ.එස්.එස්. එදිරිසූරිය මයා, අතිරේක ලේකම් (ආයතන)
17) දේවිකා ලියනගේ මිය, අතිරේක ලේකම් (ප්‍රසම්පාදන)
18) සමන්ති අලුත්ගේ මිය (ප්‍රධාන මූල්‍ය නිලධාරි - 1)
19) රමණි නාලිකා දොඩම්පෙගමගේ මිය, අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)
20) පී.ඩී. ඉරෝෂණී කේ. පරණගම මිය, ප්‍රධාන කොමසාරිස් (ගුරු ආයතන)
21) ඩී. එෆ්. පී. එස්. ඩී. පෙරේරා මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (විෂයමාලා ප්‍රතිසංස්කරණ)
22) ඩබ්. කේ. එස්. එස්. පෙරේරා මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (සැලසුම් හා ධාරිතා සංවර්ධන)
23) කේ. ඒ. යූ. එස්. සිසිරබන්දු මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිපාලන ප්‍රතිසංස්කරණ)
24) එම්.ටී.වී. මලින්ද මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (ඩිජිටල් අධ්‍යාපන හා යටිතල පහසුකම් සංවර්ධන)
25) වරුණ අලහකෝන් මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය/ භාෂා මානවශාස්ත්‍ර)
26) එච්. එච්. වී. එම්. සංජීවනී මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (තාක්ෂණික අධ්‍යාපන)
27) කේ. ඩී. බන්දුල කුමාර මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (විද්‍යා)
28) එම්.වී.එස්. ගුණතිලක මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන)
29) බී.ජේ.අයි. කලණි හේමමාලි මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන)
30) පි.පි. නිරෝෂි මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිතය / අධ්‍යාපන සංවර්ධන)
31) එන්.ඒ බදුරලිය මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (ඉංග්‍රීසි සහ විදේශ භාෂා)
32) ලුතිනල් කර්නල් ජී.ජී. අනුර අබේවික්‍රම මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා)
33) ජී. එස්. කේ. ඩබ්. හේවගේ මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන)

34) එච්. අයි. ඩී. ඩී. හෙට්ටිආරච්චි මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (කෘෂිකර්ම හා පරිසර)
35) ඒ. එම්. ඩී. යූ. කේ. අමරසිංහ මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගමික හා සාරධර්ම)
36) සුමිත් පරාක්‍රමවංශ මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (නියාමන හා කාර්යසාධන සමාලෝචන)
37) බී.ඩී.එස්.බාලසූරිය මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (සැමට අධ්‍යාපන)
38) එස්.ප්‍රනවදාසන් මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ (වතු පාසල් / දෙමළ පාසල්)
39) එච්.ටී.කුෂන්ති කුමාරි මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (කළමනාකරණ හා ප්‍රමිති)
40) ජයනි ප්‍රශංගිකා මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්)
41) එස්.දක්ෂිනා කස්තුරිආරච්චි මිය, අධ්‍යාපන අධ්‍යක්ෂ (දත්ත කළමනාකරණ)
42) එස්.ටී.එස්. කාරියවසම් මයා, අධ්‍යාපන අධ්‍යක්ෂ
43) එස්. ආර්. වසීර් මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සැමට අධ්‍යාපන)
44) එච්. පී. පී. රණසිංහ මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන)
45) එස්. ජෙයකුමාර් මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (දෙමළ පාසල්)
46) ඒ. ඩබ්. එස්. රාජකරුණා මෙය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විෂයමාලා ප්‍රතිසංස්කරණ)
47) ඩබ්. ඒ. එස්. ඩබ්. විජේසූරිය මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
48) එස්. මනෝහරන් මිය , නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන)
49) ජේ. එච්. පී. ආරියරත්න, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
50) ජේ. නානායක්කාර මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
51) පී. ඒ. එල්. රෙජිනෝල්ඩ් මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
52) පී. අබේනායක මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ආගමික සාරධර්ම)
53) ඒ. එච්. එම්. ෆාසිල් මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්)
54) කේ.කේ.ඩී.එම්.එස්.එස්. සමරදිවාකර මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා සැලසුම්)
55) ආර්.එම්.ජේ.සී. කුමාර මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන)
56) ඒ.ඩී. අචිනි බාලපටබැදිගේ මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික අධ්‍යාපන)
57) ඩබ්.ටී. දිල්රුක් ජයවර්ධන මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා)
58) පි.කේ.ශාන්ත කුමාර මයා, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන)
59) තරිඳු විජේරත්න මයා,  නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ අධ්‍යාපන (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ)
60) එච්.පි. රුක්මාලි මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂනය)
61) පි.එස්.සඳමාලි මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් අධ්‍යාපන)
62) කේ.කේ.ඒ.එස්. ගුණරත්න මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
63) ඩී. පී. කේ. එම්. විජේසිංහ මයා, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
64) පී. ඒ. එස්. පී. ජයලත් මයා, වැඩසටහන් ප්‍රධානි (ද්විතියික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන - SESIP)

<u>ජාතික අධ්‍යාපන ආයතනය</u>

***ආයතනික සභාවේ සාමාජිකයින්***

65) මහාචාර්ය මංජුලා විදානපතිරණ මිය, අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
66) එච්.ඩී. චන්දිමා ජානකි මිය, අතිරේක ලේකම්, (රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන)
67) කේ.ඒ. රම්‍යා කාන්ති මිය, පාලක ජනරාල් (මුදල්,ආර්ථික සංවර්ධන,ප්‍රතිපත්ති සම්පාදන,සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය)
68) ආචාර්ය රමණී ජයතිලක මිය, විශ්‍රාමලත් සහය මහාචාර්ය (කොළඹ විශ්වවිද්‍යාලය)
69) ආචාර්ය සුමුදි සුරවීර මිය, අධ්‍යක්ෂ (මියුසික් මැටර්ස්)
70) ආචාර්ය එම්. තිරුචරංගන් මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වාග් විද්‍යාව සහ ඉංග්‍රීසි අධ්‍යයන අංශය, (යාපනය විශ්වවිද්‍යාලය)
71) යූ.වී. මෞලිකාන්ති මිය, අධ්‍යක්ෂ (විශ්‍රාමික) (කලාප අධ්‍යාපන කාර්යාලය හොරණ)
72) මහාචාර්ය ඩී.ඩී. කරුණාරත්න මයා, මහාචාර්ය, පරිගණක අධ්‍යාපන ආයතනය UCSC (කොළඹ විශ්ව විද්‍යාලය)

73) ශිරානි වීගා ලීලා මිල්ස් මිය, විධායක අධ්‍යක්ෂ (කාන්තා අධ්‍යාපන සහ පර්යේෂණ මධ්‍යස්ථානය)
74) මුර්තාසා ඒ.එච්. එසුෆලි මයා, සමූහ අධ්‍යක්ෂ (හේමාස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී)
75) මහමුද් රියාද් අමීන් මයා (නීතිඥ)

*ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ සාමාජිකයින්*

76) කේ.රන්ජිත් පත්මසිරි මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විද්‍යා හා තාක්ෂණ පීඨය)
77) ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)
78) එම්.පී.ආර්. ධනවර්ධන මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ සැලසුම් හා සංවර්ධන පීඨය)
79) ආචාර්ය පී.එච්. කුසුමාවතී මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය)
80) ආචාර්ය ඒ.ඩී.ඒ. ද සිල්වා මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය)
81) මහාචාර්ය ආර්.ඒ.එස්. රණබාහු සේනානායක මයා, ශාක සහ අනුක ජීව විද්‍යා දෙපාර්තමේන්තුව (කැලණිය විශ්ව විද්‍යාලය)
82) මහාචාර්ය සාලුක රණසිංහ කොඩිතුවක්කු මයා,පරිගණක විද්‍යා සහ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව (පේරාදෙණිය විශ්ව විද්‍යාලය)
83) මහාචාර්ය ආර්.එම්. ධම්මික බණ්ඩාර හේරත් මයා, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,කලා පීඨය (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)
84) ආචාර්ය මේනකා ලියනගේ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගණිත දෙපාර්තමේන්තුව (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
85) ආචාර්ය අස්මාරා රොමෝලා රසූල් මිය, අධ්‍යක්ෂ (ඉංග්‍රීසි) පශ්චාත් උපාධි ආයතනය (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)
86) ඒ.එම්.ඩී.යූ.එස්. අමරතුංග මිය, පීඨාධිපති (ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය මහරගම)
87) ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එල්. වසන්ත කුමාර මයා, උප සභාපති (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව)

<u>ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන්</u>

88) ආර්.එම්.කේ. ද සිල්වා මහත්මිය, අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
89) ඒ.එල්.එස්.අබේවික්‍රම මයා, අධ්‍යක්ෂ (වෘත්තීය සංවර්ධන හා කළමනාකරණ දෙපාර්තමේන්තුව)
90) එච්.එස්.නන්ද කුමාර මයා, අධ්‍යක්ෂ (පුස්තකාල හා කෞතුකාගාර දෙපාර්තමේන්තුව)
91) ඩී.ජේ.වයි.පතිරණගේ මිය, අධ්‍යක්ෂ (අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
92) කේ.ජී.ඩබ්.කේ. කටුකුරුන්ද මයා, අධ්‍යක්ෂ (කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
93) ඩී.එන්. කොඩිතුවක්කු මයා, අධ්‍යක්ෂ (ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
94) ඩී.එච්.සී.එන්. ධර්මපාල මිය, අධ්‍යක්ෂ (සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව)
95) ජී.පී.එච්. ජගත් කුමාර මයා, අධ්‍යක්ෂ (ගණිත දෙපාර්තමේන්තුව)
96) පූජ්‍ය උඩුගම සුදස්සි හිමි, අධ්‍යක්ෂ (ආගමික හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
97) ඩබ්.ජී.එස්.කුමාර මයා, අධ්‍යක්ෂ (ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව)
98) එස්. ෂන්මුගලිංගම් මයා, අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව)
99) ආචාර්ය කේ.ප්‍රභාහරන් මයා, අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව)
100) ආචාර්ය එස්. කරුණාකරන් මයා,අධ්‍යක්ෂ (පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව)
101) ආචාර්ය පූජ්‍ය කේ. කුකුරම්පොල ඤාණවිමල හිමි, අධ්‍යක්ෂ (සිංහල භාෂා දෙපාර්තමේන්තුව)
102) ආචාර්ය පූජ්‍ය ඊ. මේධංකර හිමි, අධ්‍යක්ෂ (සම්භාව්‍ය,විදේශීය හා ද්වි භාෂා දෙපාර්තමේන්තුව)

103) ආචාර්ය එම්.තායානිදී මයා, අධ්‍යක්ෂ (දෙමළ භාෂා දෙපාර්තමේන්තුව)
104) කේ.ජී.ඒ. රූපසේන මයා, අධ්‍යක්ෂ (සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව)
105) ජී.එච්.ආර්. ද. සිල්වා මෙය, අධ්‍යක්ෂ (වැ.බ) (සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව)

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

106) ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ මිය, විභාග කොමසාරිස් ජනරාල්
107) තිලක් වත්තුහේවා මයා, අතිරේක විභාග කොමසාරිස් ජනරාල්
108) ඩබ්ලිව්.ඒ.එස්. බුද්ධිකා පෙරේරා මිය, විභාග කොමසාරිස්
109) ඩබ්.වී.ඩී.එස්.එම්. වරකාගොඩ මයා, නියෝජ්‍ය විභාග කොමසාරිස්
110) කේ.ටී.ඩී. විමලසිරි මිය, නියෝජ්‍ය විභාග කොමසාරිස්
111) ඒ.එච්.ජී.ආර්.ර්. ගුණවර්ධන මයා, නියෝජ්‍ය විභාග කොමසාරිස්
112) ඩබ්ලිව්.ඒ.කේ. ජයසිංහ මිය, නියෝජ්‍ය විභාග කොමසාරිස්

**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

113) ඩී.ඒ. සුභාෂිණී දෙමටගොඩ මෙය, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
114) පි. ලියනගේ මයා, අතිරේක අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
115) ගෝතම කාරියවසම් මයා, කොමසාරිස් (සංවර්ධන)
116) එන්. වී. ඩී. එච්. ගුණවර්ධන මිය, කොමසාරිස් (නිෂ්පාදන හා බෙදාහැරීම්)
117) ටී. එම්. ඒ. එස්. තෙන්නකෝන් මිය, නියෝජ්‍ය කොමසාරිස්
118) ර්. ඩබ්. ජී. සංජීවනී මිය, නියෝජ්‍ය කොමසාරිස්
119) කේ. ඩී. එල්. චන්ද්‍රසිරි මයා, නියෝජ්‍ය කොමසාරිස්
120) කේ. ඩී. හිමන්ති කුමාරි මිය, නියෝජ්‍ය කොමසාරිස්
121) කේ. ජී. එල්. නිරීෂා මිය, නියෝජ්‍ය කොමසාරිස්
122) ජී. එම්. ඒ. ඩී. එන්. මුහන්දිරම් මිය, නියෝජ්‍ය කොමසාරිස්
123) එන්. සී. දසනායක මිය, නියෝජ්‍ය කොමසාරිස්
124) සී. ඩී. රත්නවීර මිය, සහකාර කොමසාරිස්

**තෘතියය හා වෘත්තීය පුහුණු අධ්‍යාපන ආයතන**

125) හිමාලි ඩබ්.කේ. අතාවුදගේ මිය, අතිරේක ලේකම් (නිපුණතා ආංශික සංවර්ධන)
126) සමන්ති සේනානායක මිය, අතිරේක ලේකම් (වෘත්තීය පුහුණු)
127) ඩබ්.එම්.ආර්.බී. විරසේකර මයා, අධ්‍යක්ෂ ජනරාල් (විශ්‍රාමික) (ක්‍රම සම්පාදන)
128) මහාචාර්ය එස්.ජී.එල්.ඩී.වික්‍රමසිංහ මයා, සභාපති (තෘතීයික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව)
129) එස්. ඒ. අබ්දුල් සත්තාර් මයා, සභාපති (ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය)
130) වී. පී වීරතුංග මයා, සභාපති (වෘත්තීය පුහුණු අධිකාරිය)
131) මහාචාර්ය වසන්ත රත්නායක මයා, උපකුලපති (ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය)
132) ආචාර්ය එල්. ඩබ්. එස්. කුලරත්න මයා, උපකුලපති (වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය)
133) ආචාර්ය එස්. යූ. පී. ජිනදාස මයා, පීඨාධිපති, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය (සාගර විශ්ව විද්‍යාලය)
134) එස්. සී. ජගත් මයා, අධ්‍යක්ෂ ජනරාල් (කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව)

135) ආචාර්ය කේ.ඒ. ලලිතධීර මයා, අධ්‍යක්ෂ ජනරාල් (තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව)

136) මේජර් ජනරාල් ප්‍රියන්ත වීරසිංහ මයා, අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය)

137) දිමුතු චන්ද්‍රසිරි මිය, අධ්‍යක්ෂ (වෘත්තීය පුහුණු)

138) බී. ජී. ජී. මිලින්ද මයා, අධ්‍යක්ෂ (නිපුණතා සංවර්ධන)

139) අචාර්ය ජේ. ඒ. ඩී. ජේ. ජයලත් මයා, ජ්‍යොෂ්ඨ කථිකාචාර්ය (වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය)

140) ආචාර්ය අජිත් පොල්වත්ත මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තෘතීයික සහ වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව)

141) සී.පි. සුහසිංහ මයා, අධ්‍යක්ෂ (ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය)

142) ඩබ්. එම්. ඩී. කුමාරි මිය, අධ්‍යක්ෂ සැලසුම් (කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව) එම් එස්.ඩී. එම්. යහම්පත් මයා, සහකාර අධ්‍යක්ෂ (පුහුණු) (ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය)